# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් බන්ධනාගාර පිළිබඳ සිදුකළ අධ්‍යයනයක්

බන්ධනාගාර පිළිබඳව 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සිදුකළ අධ්‍යයනය ඇසුරෙන් සම්පාදනය කරන ලද විධායක සාරාංශය හා නිර්දේශ ප්‍රකාශනය

අප වර්තමාන බන්ධනාගාර ක්‍රමවේදය හා ශ්‍රී ලාංකේය මානව හිමිකම් බැඳීම් අතර සංගතතාව අවබෝධ කරගැනීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් ලංකාවේ බන්ධනාගාර පද්ධතිය පිළිබඳව 2018 ඩී අධ්‍යයනයක් සිදුකරන ලදී. ඒ හරහා ලංකාවේ බන්ධනාගාරගත වූවන්ගේ මානව හිමිකම් කෙරෙහි බලපෑම් සිදුකෙරෙන අදෘශ්‍යමාන ගැටළු පිළිබඳව විමර්ශනය කරන ලදී.මෙම විමර්ශනයේ මිනුම් දර්ශකය වූයේ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් සම්පාදනය කරන ලද නෙල්සන් මැන්ඩෙලා කොන්දේසීන් ය.

මෙම අධ්‍යයනය 2018 අප්‍රේල් හා සැප්තැම්බර් අතර කාලය තුළ සිදුකෙරිණ. එය බන්ධනාගාර, රිමාන්ඩ් බන්ධනාගාර හා වැඩ කඳවුරු ඇතුළු ප්‍රතිශෝධන ආයතන 20ක සිදුකළ අධීක්ෂණයන් මෙන්ම බන්ධනාගාරගතවූවන්, බන්ධනාගාර නිලධාරීන් හා රාජ්‍ය ආයතන, ස්වාධීන ආයතන හා රාජ්‍ය නොවන කණ්ඩායම් වැනි පාර්ශ්වකරුවන් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවන්ගෙන්ද සමන්විත විය.

මෙම අධ්‍යයනයේ නිගමනයන් හා නිර්දේශයන් හරහා ඒ පිළිබඳව ඇති දැනුම් පරතරය අවම කරමින් බන්ධනාගාර පද්ධතිය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ඇතිකරයි. එමෙන්ම මෙතුලින් ආකෘතිකමය වශයෙන් පවතින අඩුලුහුඬුතා ද මතුකර පෙන්වනු ඇති අපි අපේක්ෂා කරමු. මේ නිගමන හරහා බන්ධනාගාරගතවූවන්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම, බන්ධනාගාර පද්ධතිය ශක්තිමත් කිරීම මෙන්ම නිලධාරින් මුහුණ දෙන ගැටළු කෙරෙහි අවධානය යොමු වීමට අදාළ වඩාත් සංවර්ධිත ක්‍රමවේදයන් හා ප්‍රතිපත්තීන් සම්පාදනය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනය සිදුකිරීමේදී බන්ධනාගාර දෙපාර්තමේන්තු නිලධාරින් ලබාදුන් සහයෝගය කොමිසමේ ඇගයීමට බඳුන් වේ. ඔවුන්ගේ ඉල්ලීම මත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් බන්ධනාගාර නිලධාරින් වෙනුවෙන් මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක්ද පවත්වන ලදී.

අධ්‍යයනයෙන් සිදුකළ ප්‍රධාන අනාවරණයන් ත්‍රිත්වය වන්නේ :

- පද්ධතිය දරාගත නොහැකි තරම් තදබද සහිත බව හා සම්පත්වල ඌනතාවය
- බන්ධනාගාර පද්ධතියේ කේන්ද්‍රීය අවධානය යොමු ව ඇත්තේ වඩාත් සුදුසු පුනරුත්තාපන ආකෘතිය කෙරෙහි නොව දණ්ඩනීය අංශය කෙරෙහි බව
- බන්ධනාගාර නිලධාරින් තුළ මෙහි පවතින අඩුලුහුඬුතා පිළිබඳ හොඳ අවබෝධයක් ඇති බව හා ඔවුන් වෙනසකට සූදානම් බව

මින් අවසන් අනාවරණය නිසා සිරකරු සංඛ්‍යාවන් අඩු කොට පුනරුත්තාපන ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමුකිරීම සඳහා යම් පියවර ගතහොත්, ප්‍රමාණවත් සම්පත් සහිතව අපගේ පද්ධතියට අපේක්ෂිත ප්‍රතිමානයන් කරා ළඟා විය හැකි බවට කොමිසම තුළ විශ්වාසයක් පවතී.

මේ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2021-2025 උපක්‍රමික සැලසුම වන "සුරක්ෂිත සමාජයක් උදෙසා හිමිකම් මත පදනම් වූ ප්‍රතිශෝධන ක්‍රමවේදයක්" යනු නිවැරදි මාර්ගය කරා තැබූ එක පියවරක් ලෙස සැලකිය හැකිය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම අද දින මෙම අධ්‍යයනයෙහි විධායක සාරාංශය හා නිර්දේශ පරිතුලනය ප්‍රකාශයට පත්කරන්නේ ඉමහත් සතුටිනි.

2020 නොවැම්බර් 25
කොළඹ

# බන්ධනාගාර වාර්තාව : අන්තර්ගතය

හැඳින්වීම

විධායක සාරාංශය

හැඳින්වීම

ක්‍රමවේදය

බන්ධනාගාරගතවූවන්ට සැලකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අවම නීතීන් පිළිබඳ විශ්ලේෂණය

බන්ධනාගාර පද්ධතිය පිළිබඳ හැඳින්වීමක්

I කොටස - සැලකීම හා පවතින තත්වය

1. ඇතුළුවීම හා පිටවීම පිළිබඳ ක්‍රියාවලිය
2. නවාතැන් පහසුකම්
3. ආහාර
4. ජලය, සනීපාරක්ෂාව හා පෞද්ගලික ස්වස්ථතාවය
5. වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවීමේ හැකියාව
6. බාහිර ලෝකය සමග සම්බන්ධතාවය
7. දුක්ගැනවිලි යාන්ත්‍රණය
8. සිරකරු-නිලධාරි සම්බන්ධතාවය
9. විනය හා දඬුවම
10. බන්ධනාගාර තුළ සිදුවන මරණ

II කොටස - පුනරුත්තාපන ක්‍රමවේදය

11. බන්ධනාගාරගතවූවන් පුනරුත්තාපනය
12. බන්ධනාගාර වැඩ
13. නියමිත කාලයට පෙර මුදාහැරීමේ ක්‍රමවේදය

III කොටස - බන්ධනාගාරගතවූවන්ගේ විශේෂ ප්‍රභේදයන්

14. මරණ දඬුවමට ලක්වූවන්
15. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තැබූ සිරකරුවන්
16. තරුණ වරදකරුවන්
17. විදේශිකයන්
18. කාන්තාවන්
19. අබාධ සහිත සිරකරුවන්

IV කොටස - බන්ධනාගාර කළමනාකරණය

20. බන්ධනාගාර පරිපාලනය මුහුණ දෙන අභියෝග

V කොටස - අපරාධ යුක්ති ක්‍රමවේදය

21. අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීම
22. නීති සහාය ලබාගැනීමේ හැකියාව
23. නීතිමය හා අධිකරණමය ක්‍රියාවලින්

VI කොටස - ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩතාවය

24. ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩතාවය

VII කොටස - බන්ධනාරෝධනයට විකල්ප

25. අත්අඩංගුමය නොවන පියවර

VIII කොටස - පසු විපරම හා සමාප්තිය

26. පසු සටහන : පසු විපරම
27. නිගමන
28. නිර්දේශ වගුව
29. ස්තුතිය
30. ඇමුණුම්
31. සංක්ෂේප රූප

# විධායක සාරාංශය

## දළ විශ්ලේෂණය

බන්ධනාගාර පද්ධතිය පිළිබඳ මහජන සාකච්ඡාවක් මෙන් ම මහජන දැනුවත්භාවයක් නොමැති වීම හා සිරකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව තොරතුරු නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ප්‍රථම වරට බන්ධනාගාර සම්බන්ධයෙන් දීප ව්‍යාප්ත අධ්‍යයනයක් දියත් කළේය.

මෙම අධ්‍යයනයට දිවයින පුරා පිහිටි බන්ධනාගාර 20ක් පාදක විය. මෙහි අධ්‍යයන ක්‍රමවේදයට බන්ධනාගාර සුපරීක්ෂණය කිරීම, බන්ධනාගාරගතවූවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා ප්‍රශ්නාවලි බෙදාහැරීම, සෑම බන්ධනාගාරයකම නිලධාරීන් සම්මුඛ සාකච්ඡාවට බඳුන් කිරීම මෙන්ම අපරාධ යුක්තිය හා පරිශෝධන ක්‍රියාවලියට අදාළ රාජ්‍ය අමාත්‍යාංශවල පාර්ශ්වකරුවන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ද ඇතුළත් විය. රැස් කළ තොරතුරු මත පදනම් ව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, බන්ධනාගාර පරිපාලනය සම්බන්ධ දේශීය නෛතික ආකෘතීන් හා රජය අන්තර්ජාතික මානව හිමිකම් රෙගුලාසි කෙරෙහි ඇති බැඳීම්වලට අදාළව බන්ධාගාරවල පවතින තත්වය හා සිරකරුවන් කෙරෙහි පවතින සැලකීම ඇගයීමට ලක් කරනු ලැබිණ.

සිරකරුවන්ට සැලකීම හා රඳවා තබාගැනීම පිළිබඳ තත්වය මූලික ජීවන ප්‍රමිතීන්ගෙන්ද බොහෝ පහළ තත්වයක පවතින බව මෙම අධ්‍යයනයෙන් හෙළිදරව් වුයේය. සෞඛ්‍ය පහසුකම් හා පුනරුත්ථාපන අවස්ථා ද ඇතුළුව බන්ධනාගාරගතවූවෙකුට අනිවාර්යයෙන් හිමිවිය යුතු සේවාවන් ද ඉතා දුර්වල තත්වයක පැවතීමට ප්‍රධාන හේතුව බන්ධනාගාරවල රඳවා ගත හැකි ධාරිතාවය බොහෝ සේ ඉක්මවා ගොස් තිබීමයි. බරපතල සේවක ඌනතාවය හේතුවෙන් බන්ධනාගාර නිලධාරීහු දැඩි වෙහෙසට පත්ව වෘත්තියමය අසන්තෘප්තතාවයෙන් හා මානසික පීඩාවන්ගෙන් යුතුව කටයුතු කරති. ඔවුන්ගේ රාජකාරියෙහි ඇති අසීරු බව හා අවදානම් සහිත බවට සරිලන වැටුපක් නොලැබීම නිසා දෛනිකව ඔවුන් මුහුණ දෙන අභියෝගවලට ඵලදායි ලෙස මුහුණ දීමේ හැකියාව අවම තත්වයක පවතී. මේ හේතුවෙන් බන්ධනාගාර තුළ දැඩි තදබදයක් පවතින අතර කාර්යක්ෂමතාව දුර්වල තත්වයක පවතී. මෙය අපරාධ, දූෂණය හා පුනරාවෘතිය තත්වයන් ඉහළ නැංවීමටත් පුනරුත්ථාපන අවස්ථා අවම කිරීමටත් හේතු සාධක වේ. එහි ප්‍රතිඵලයක් ලෙස පුනරුත්ථාපිත බන්ධනාගාරගතවූවන් ඵලදායි ව නැවත සමාජගත කිරීමේ අවස්ථාව අහිමි වී තිබේ.

මෙවන් සන්දර්භයක් තුළ මරණ දඬුවමට ලක්වූවන්, කාන්තාවන්, තරුණ වරදකරුවන්, විදේශිකයන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින්නවුන් හා ආබාධ සහිත සිරකරුවන් වැනි විශේෂ ගණයේ බන්ධනාගාරගතවූවන් අනෙක් පිරිස්වලට සාපේක්ෂව අවදානම් සහගත තත්වයක සිටින බව කොමිසමට අධ්‍යයනය කළ හැකි විය. ප්‍රතිපත්ති සම්පාදනයේදී ඔවුන් මුහුණ දෙන සුවිශේෂී අභියෝග පිළිබඳ සැලකීම තුළින් ඔවුනටද පුනරුත්ථාපනය සඳහා සමාන අවස්ථාවක් සැලසීම අනිවාර්යයෙන් සිදුවිය යුතුය.

බන්ධනාගාරගතවූවන් සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවලදී රැස් කළ ගුණාත්මක දත්ත ඇසුරෙන් පෙන්වා දෙන්නේ ඔවුන්ගෙන් බහුතරයක් පහළ සමාජ ආර්ථික පසුබිමකින් පැවත එන බවයි. ඔවුන් විස්තරාත්මකව සිය පෞද්ගලික තොරතුරුවලින් දක්වන පරිදි මුදල් නොමැති වීම හේතුවෙන් නීතිඥ සහාය ලබාගැනීමට අපොහොසත් වීම ද එයට අයත් වේ. සිරකරුවෝ බොහෝ විට තමන් අපරාධ ක්‍රියාවලට යොමුවීමට දරිද්‍රතාවය හා ආර්ථික අස්ථායිතාවය ප්‍රධාන හේතු වශයෙන් දක්වති. දරිද්‍රතාවය යනු සියලුම ආකාරයේ

වයස් මට්ටම්, ජාතීන් හා ආගමික පසුබිම් සහිත සිරකරුවන් අතර දක්නට ලැබෙන පොදු සාධකයකි. විශේෂයෙන් පිරිමි සිරකරුවන් දක්වා සිටියේ තමන් සිය පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා වූ බැවින් සිරගතවන කාල සීමාව තුළ පවුලේ ආදායම අහිමි වීම හේතුවෙන් එම පවුල් තව තවත් දුෂ්කරතාවලට මුහුණ දෙන බවයි. ඒ පිළිබඳව ඔවුන් තුළ පැවතියේ දැඩි සංවේගයකි. තමන්ට දිනකට වේල් තුනක් ආහාර ලැබෙද්දී ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයන්ට එකදු ආහාර වේලක්වත් නොලැබී යන බව පවසමින් ඔවුහු බොහෝ අවස්ථාවලදී වැළපුණහ.

කොමිසම විසින් විශේෂයෙන් නඩු විභාගයට පෙර කාලය තුළ දීර්ඝ කාලීනව රඳවා තබාගැනීම්වලට තුඩු දෙන ආකාරයෙන් අපරාධ අධිකරණමය ක්‍රියාවලියේ පවතින විවිධ දුර්වලතාවයන් පිළිබඳවද අනාවරණය කරනු ලැබිණ. මේ හරහා පෙරළා බන්ධනාගාර තුළ පවතින පීඩාකාරී ජීවන තත්වයන් හා සැලකීම්වලට ද මාර්ගය සැලසේ. ඇප නියම කරන ක්‍රමය නීතිපති දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතනවල පරිපාලනමය අකාර්යක්ෂමතා, නීති සහාය ලබාදීමේ දුර්වලතා මෙන්ම සිරගත කිරීමට විකල්ප වශයෙන් භාවිත කළ හැකි වෙනත් ක්‍රම භාවිතයේ දුර්වලතා ආදී සියල්ල විශාල සිරකරුවන් පිරිසක් දීර්ඝ කාලීනව බන්ධනාගාර තුළ රැඳී සිටීමට හේතු සපයයි. මෙය බදු ගෙවන්නන් හට  දැවැන්ත බරක් වනු පමණක් නොව අපේක්ෂිත ප්‍රතිඵලවලද පසුබෑමට හේතුවක් වන්නේ ඵලදායි පුරවැසියන් ලෙස නැවත සමාජගත වීමේ සූදානමකින් සිරකරුවන් බන්ධනාගාරයෙන් පිට නොවන බැවිනි. ඒ වෙනුවට පවතින ක්‍රමවේදය අනුව බොහෝ විට සිදුවන්නේ සමාජය තුළ නොනැසී පැවතීම සඳහා ඒ පුද්ගලයන් තවදුරටත් අපරාධ කරා යොමුවීමයි.

මේ හේතුවෙන් සිරකරුවන් පුනරුත්තාපනය කිරීම හා අවසන් වශයෙන් අපරාධ වැළැක්වීම සම්බන්ධ අරමුණු සපුරාගැනීම සඳහා විශෝධන ක්‍රමවේදය තුළ පුළුල් ප්‍රතිසංවිධානයක් සිදුකිරීම අත්‍යාවශ්‍යය. මෙම අධ්‍යයනය, බන්ධනාගාරගතව සිටින කාල සීමාව තුළ මෙන්ම ඉන් පසුවද ඔවුන් මූලිකව අපරාධ කරා යොමු කළ සමාජ-ආර්ථික හා මානසික තත්වයන් කුප්පනු වෙනුවට ඵලදායි පුනරුත්තාපන වැඩසටහන් හරහා ගෞරවාන්විත දිවියක් වෙත සිරකරුවන් යොමු කළ හැකි විශෝධන ප්‍රතිපත්තීන් සම්පාදනයට පදනම් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනය පුරාවට සිරකරුවන් බන්ධනාගාර තුළදී මෙන්ම ඔවුනගේ පෞද්ගලික ජීවිතවලදී මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳ බන්ධනාගාර නිලධාරීන් හට විශාල අවබෝධයක් හා සහකම්පනයක් ද පවතින ආකාරය කොමිසම නිරීක්ෂණය බව ද විශේෂයෙන් පෙන්වා දිය යුතුය. බන්ධනාගාර සේවකයෝ බන්ධනාගාර තුළ පවතින අඩු ලුහුඬුතා හා දුර්වලතා පිළිබඳව ස්වේච්ඡාවෙන් ම කතා කිරීමට ඉදිරිපත් වූ අතර නිලධාරීහු පවතින දණ්ඩන ක්‍රමවේදය විශෝධන ක්‍රමවේදයක් කරා පරිවර්තනය කිරීමට ගත යුතු සංවර්ධනිය පියවර යෝජනා කළහ. ඔවුන් ඉදිරිපත් කළ යෝජනා සිරකරුවන්ගේ ජීවන තත්වය හා පුනරාවෘතිය අනුපාතය අවම කළ හැකි පුනරුත්තාපන වැඩසටහන් හා අපරාධ යුක්ති ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් කිරීමට පවා අදාළ වන සේ ඉතා පුළුල් පරාසයක පැතිර ගොස් තිබුණි. මේ හේතුවෙන් රජය මගින් ගනු ලබන සෑම බන්ධනාගාර ප්‍රතිසංවිධාන පියවරකදීම සියලු තරාතිරමවල බන්ධනාගාර නිලධාරීන්ගේ උපදෙස් ලබාගත යුතු බව කොමිසම විශ්වාස කරයි.

# An unofficial translation of pages 1 to 35 made by AHRC of the prison study by Human Rights Commission of Sri Lanka.

## I කොටස : සිරකරුවන්ට සැලකීම හා පවතින තත්වය

### 01. ඇතුළුවීම හා පිටවීම පිළිබඳ ක්‍රියාවලිය

නව සිරකරුවෙකු බන්ධනාගාරයට ඇතුළු කිරීම හා ලියාපදිංචි කිරීම පිළිබඳ ක්‍රමවේදය දිවයින පුරා සියලු බන්ධනාගාරවල සමාන වුවද එහි දුර්වලතා ගණනාවක් දක්නට ලැබේ. උදාහරණයක් ලෙස කේන්ද්‍රීය විද්‍යුත් තොරතුරු පද්ධතියක් වෙනුවට ලිපිගොනු භාවිතා කරන බැවින් බන්ධනාගාරවල තොරතුරු කළමනාකරණ පද්ධතිය ඉතා අකාර්යක්ෂම වන අතර සිරකරු ලිපිගොනු සෙවීම හා ලබාගැනීමෙහි විශාල ප්‍රමාදයක් දක්නට ලැබේ. බන්ධනාගාර කිහිපයක විද්‍යුත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වනු දක්නට ලැබුණද, කාර්ය මණ්ඩලය තුළ තොරතුරු තාක්ෂණ දැනුම සහිත නිලධාරින් හිඟ වීම හේතුවෙන් එම ක්‍රියාවලින් හි දීර්ඝ කාලින සාර්ථකත්වයක් අපේක්ෂා කළ නොහැකිය.

ඇතුළත් කිරීමේ ක්‍රමවේදයෙහි කොටසක් ලෙස සිරකරුවන්ගෙන් ඔවුන් අත්අඩංගුවට ගැනීමේදී පොලිසියේ පහරදීමකට ලක්වූයේ ද හා ඒ පිළිබඳ නීතිමය පියවර ගැනීමට අපේක්ෂා කරන්නේද යන්න විමසනු ලැබේ. සිරකරු එසේ අපේක්ෂා කරයි නම්, ප්‍රහාරයේ ස්වභාවය හා චෝදනාවට ලක්වන්නන් පිළිබඳව තොරතුරු ලබාගෙන අදාළ පොලිස් ස්ථානයේ පොලිස් අධිකාරිවරයා වෙත එම තොරතුරු යොමු කෙරේ. කෙසේවෙතත්, එවැනි ක්‍රියාවලියක් හරහා අදාළ වරදකරුවන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනුණි ද යන්න පිළිබඳ තහවුරු වීමක් සිදුනොවේ. එයට හේතුව ඒ සම්බන්ධ යම් පියවරක් ගැනුණේද යන්න තහවුරු කිරීමේ ක්‍රමවේදයක් හෝ සිරකරුවාට සිය පැමිණිල්ල පිළිබඳ පසුවිපරම් කිරීමේ හැකියාවක් නොපවතින බැවිනි.

ලියාපදිංචි කිරීමේදී සිරකරුවන් ඡායාරූපගත කිරීම අනිවාර්යයෙන් සිදුකෙරෙයි. බොහෝවිට උඩුකය කමිසය ඉවත් කර සිදු කෙරෙන මෙම ඡායාරූපගත කිරීමේදී දැකිය හැකි තුවාල කැළැල් ආදිය සටහන් කෙරේ. මෙය එම තුවාල සිදු වූ කාල සීමාව පිළිබඳ කාල නිර්ණයට උපයෝගී වේ. කෙසේවෙතත්, බොහෝ බන්ධනාගාරවල ලියාපදිංචිය සිදුකෙරෙනුයේ බන්ධනාගාරයට ඇතුළත් කර දෙවැනි දිනයේදී ය. විශේෂයෙන් සන්ධ්‍යා කාලයේදී රැගෙන එන සිරකරුවන් පිළිබඳව ක්‍රියාකෙරෙනුයේ ඒ ආකාරයෙනි. එබැවින් බන්ධනාගාරගතවීමට පෙර සිරකරුට සිදුවූ තුවාල පිළිබඳව සටහනක් තබාගැනීම සිදු නොවේ. ඒ අනුව බන්ධනාගාරගතවිමෙන් පසු සිරකරුට කෙබඳු තුවාල ඇතිවූයේද යන්න තීරණය කිරීම අපහසු වේ.

සිරකරුවන්ගේ රෝගාබාධ නිශ්චය සඳහා ඔවුන් විස්තරාත්මක සෞඛ්‍ය පරීක්ෂණයකට බඳුන් කිරීම අත්‍යාවශ්‍ය වුවද ඊට අවශ්‍ය තාක්ෂණික සම්පත් හා උපකරණවල ඌනතාවය හේතුවෙන් මෙය බොහෝවිට මගහැරී යයි. බොහෝවිට සිදුවන්නේ බන්ධනාගාරගතවිමෙන් පසු සිරකරු වෛද්‍යවරයෙකු විසින් මූලික වෛද්‍ය පරීක්ෂණයකට ලක්කිරීම පමණි. එහෙත් යම්කිසි බරපතල රෝගයක් හෝ විශේෂයෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවිමක්, ඉන් මිදීමේදී දක්නට ලැබෙන රෝග ලක්ෂණ හෝ සියදිවිනසාගැනීමේ ප්‍රවණතාවයක් නව සිරකරු තුළ තිබේද යන්න හඳුනා ගැනීමට විස්තරාත්මක වෛද්‍ය පරීක්ෂණයක් සිදුකිරීම අත්‍යාවශ්‍ය ය.

තහනම් භාණ්ඩ රහසේ බන්ධනාගාරයට රැගෙන යාම වැළැක්වීම සඳහා සෑම සිරකරුවෙකුම බන්ධනාගාරයට ඇතුළු වීමේදී ශරීර පරික්ෂාවකට ලක්කිරීම අනිවාර්ය බව කොමිසම වෙත දැනුම් දෙන ලදී. කෙසේවෙතත්, මෙම පරීක්ෂාවන් පුද්ගල අභිමානය හෝ පෞද්ගලිකතාවය පිළිබඳ කිසිදු සැලකීමකින් තොරව නින්දා පරවශ ආකාරයෙන් සිදුකෙරෙන බවට කොමිසම වෙත පැමිණිලි ගණනාවක් ලැබී ඇත. මින් පෙනීයන්නේ සිරකරුවන්ට අපහසුතාවයක් හෝ අවමානයක් සිදුනොවන අයුරින් ඵලදායි ලෙස ශරීර

පරීක්ෂාවන් සිදුකළ හැකි නව තාක්ෂණික උපකරණවල කඩිනම් අවශ්‍යතාවයයි. මේ සම්බන්ධයෙන් ඇතැම් බන්ධනාගාරවල ශරීර ස්කෑන් කිරීමේ යන්ත්‍ර කොමිසමට දක්නට ලැබුණද ඒවා බොහොමයක් පිළිසකර කළ යුතු තත්වයක පවතින බව හා විවිධ තහනම් ද්‍රව්‍ය අනාවරණය කිරීමට තරම් තාක්ෂණයෙන් දියුණු ඒවා නොවන බවද නිරීක්ෂණය විය. එපමණක් නොව, ඇතැම් බන්ධනාගාරවල ස්ථාපනය කර ඇති විද්‍යුත් පද්ධති ඒවා මෙහෙයවීමට පුහුණු සේවකයන් නොමැතිකමින් හෝ නිසි නඩත්තුවක් සිදුනොවීම නිසා හෝ අකර්මණ්‍ය තත්වයේ පවතී.

නව බන්ධනාගාරගතවීමකදී බන්ධනාගාරයේ දින චර්යාව, නීති හා රෙගුලාසි, බන්ධනාගාරය තුළ වැරදි ලෙස සැලකෙන දේ හා ඒ පිළිබඳ සම්බාධක, අන්තර් දුක්ගැනවිලි යාන්ත්‍රණය ආදිය පිළිබඳ සම්මත හඳුන්වාදීමේ වැඩසටහනක් සිදුකළ යුතු වුවද සෑම බන්ධනාගාරයකම එය සිදුනොවන බව කොමිසමට අනාවරණය විය. ඇතැම් බන්ධනාගාරවල වාචිකව යම් යම් තොරතුරු සිරකරුවන්ට ලබාදුන්නද එය සිදුවන්නේ ද සිංහල භාෂාවෙන් පමණි.

බන්ධනාගාර ගණනාවක බන්ධනාගාරගතවූවන්ගෙන් කොමිසම ලද තොරතුරු අනුව ඔවුන් සිදුකළ වරදට සාපේක්ෂව බන්ධනාගාරයට ඇතුළු වීමේදී "පිළිගැනීමේ අතුල්පහර" යනුවෙන් හැඳින්වෙන ශාරීරික ප්‍රහාරයකට ගොදුරු වීමට සිදුවේ. මත්ද්‍රව්‍ය, ස්ත්‍රී දූෂණ සම්බන්ධ වැරදි සහිත හා මින් පෙර බන්ධනාගාරගතව සිටි සිරකරුවෝ විශේෂයෙන් එවැනි වධ හිංසනයන් පිළිබඳ පැමිණිලි කළහ.

## 02. නවාතැන් පහසුකම්

ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල සිටින සිරකරුවන් ප්‍රභේද කරනුයේ යල්පැනගිය ජාතික නීතිකරණයකට අනුවය. එය දැනට පවතින අන්තර්ජාතික ප්‍රමිතීන්ගෙන් බොහෝ වෙනස් වේ. ස්ත්‍රී හා පුරුෂ සිරකරුවන් වෙන් කර තැබීම තදින්ම ක්‍රියාත්මක වන අතර අවුරුදු 18 ට අඩු සිරකරුවන් අවුරුදු 22 දක්වා වයස් සහිතවූවන් සමග එකට රඳවා තැබීමට ජාතික නීතිකරණයෙන් අවකාශ සැලසේ. එමෙන්ම සමාජයීය වශයෙන් බලපෑම් කළ හැකි යයි සැලකෙන පුද්ගලයන් අනෙකුත් සිරකරුවන්ගෙන් වෙන් කොට තැබීමද ඒ හරහා නිර්දේශ කෙරේ.

වරදකරුවන් ලෙස තීන්දු කළ සිරකරුවන්ගේ පෙර වැරදි තිබේද නැද්ද යන්න මත ඔවුන් සිරගත කෙරෙන බන්ධනාගාර තීරණය වුවද, හැකිතාක් පවුලේ සාමාජිකයන්ට සමීප ව සිටිය හැකි සිය පදිංචි නගරයට ආසන්න බන්ධනාගාරවලට ප්‍රමුඛතාවය ලබාදෙයි.

සිරකරුවෙකුට හිමිවිය යුතු පෞද්ගලික ඉඩ අවකාශය සම්බන්ධයෙන් වාට්ටුවල ප්‍රමිතියක් නොමැති අතර වාතාශ්‍රය, ආලෝකය හා උෂ්ණත්වය බොහෝ අවස්ථාවලදී මනුෂ්‍ය වාසයට නුසුදුසු තත්වයක් දක්වා පහත වැටේ. මෙයට ප්‍රධාන හේතුව සෑම බන්ධනාගාරයකම දැකිය හැකි තදබදය පමණක් නොවේ, බොහොමයක් බන්ධනාගාර මීට දශක ගණනාවකට පෙර ඉදිකළ අබලන් තත්වයේ පවතින ඒවා වීමයි. ගරාවැටෙමින් පවතින වහල හා බිත්ති සිරකරුවන්ගේ ජීවිත තර්ජනයට ලක් කරන අතර ස්වාභාවික විපතකදී මෙම බන්ධනාගාර ආරක්ෂිත පරිසරයක් ඇති නොකරයි. කොමිසම නිරීක්ෂණය කළ කිසිදු බන්ධනාගාරයක ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති හෝ හදිසි අවස්ථාවකදී පුද්ගලයන් ඉවත් කිරීමේ ක්‍රමවේද දක්නට නොලැබිණ. එවන් අවස්ථාවකදී දැඩි අනතුරට පත්වන්නේ වයස්ගත හා ආබාධිත සිරකරුවන් ය. මෙවන් ගැටළු දක්නට ලැබෙනුයේ පැරණි බන්ධනාගාරවල පමණක් නොව අන්තර්ජාතික ප්‍රමිතීන්ට පටහැනිව යමින් මෑතකදී ඉදිකළ බන්ධනාගාරවල පවා මෙම තත්වය දැකගත හැකිය.

වාට්ටුවල පවතින දැඩි තදබදය හේතුවෙන් අලුතින් රිමාන්ඩ් බන්ධනාගාරගත වුවන්ට බොහෝ විට කෙලින් සිටගෙන රැය පහන් කිරීමට සිදුවන්නේ නිදාගැනීමට තරම් ඉඩ පහසුකම් නොමැති බැවිනි. එසේ නොමැති නම් ඔවුනට වැසිකිළි අසල හෝ වැසිකිළි තුළ නින්දට යාමට බල කෙරේ.

කොමිසම නිරීක්ෂණය කළ පරිදි හා සිරකරුවන් බොහෝවිට පැමිණිලි කළ පරිදි මේ වාට්ටු තුළ විශාල ප්‍රමාණයෙන් මදුරුවන්, ඇඳ මකුණන්, මීයන් හා පරෙවියන්ගෙන් උවදුරු පැමිණේ. මෙය සිරකරුවන්ට ඉතා පීඩාකාරී වන අතර ඔවුනගේ සෞඛ්‍යයටද බරපතල තර්ජන ඇතිකරයි. නීතිමය වශයෙන් සිදුකළ යුතු වුවද, වාට්ටු හා අනෙකුත් ස්ථානවල තත්වය සෞඛ්‍ය නිලධාරීන් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ නිරන්තර පරික්ෂාවකට ලක් නොවේ. බාහිර හා ස්වාධීන ආවේක්ෂණයන් නොමැති වීම හා අමාත්‍යාංශය මගින් දක්වන ප්‍රතිචාර හේතුවෙන් සිරකරුවන්ගේ සෞඛ්‍යය හා ජීවන තත්වය පිළිබඳ දැඩි නොසැලකිල්ලක් නිරීක්ෂණය කළ හැකිය. මෙවැනි තත්වයන් සිරකරුවන් අතර රෝග පැතිර යාමට හා පෙරළා දැනටමත් අසීරුතාවලට මුහුණ පා සිටින බන්ධනාගාර සෞඛ්‍ය හා ප්‍රවාහන පද්ධතියට අහිතකර බලපෑම් ඇතිකිරීමට හේතුවේ.

## 03. ආහාර

අනුරාධපුර රිමාන්ඩ් බන්ධනාගාරය හැරුණුකොට අනෙකුත් සියලු බන්ධනාගාරවල ආහාර කිසිදු රසයකින් තොර බවටත් බොහෝවිට නිසි ලෙස නොපිසින ලද බත් ලබාදෙන බවටත් පැමිණිලි ලැබිණ. බන්ධනාගාර ආහාර මෙසේ ගුණාත්මකබවින් හීනවීමට බන්ධනාගාර මුළුතැන්ගෙවල් තුළ පවතින අපිරිසිදු තත්වය බලපෑ හැකි බව කොමිසම නිරීක්ෂණය කළේය. විශේෂයෙන් අවහිර වූ කාණු හා තෙතමනය සහිත පොළොව හේතුවෙන් බැක්ටීරියා වර්ධනයට අභිජනන භූමියක් වන මේ මුළුතැන්ගෙවල පිසින ලද විවෘතව තැබීමෙන් ඉක්මනින් පිළුණු වීම සිදුවේ.

වැඩ කඳවුරු හා විවෘත බන්ධනාගාරවල බරපතල වැඩවල නිරතවන සිරකරුවෝ ඔවුනට ලැබෙන ආහාර ප්‍රමාණවත් නොවන බවට බොහෝවිට පැමිණිලි කළහ.

විශේෂයෙන් රිමාන්ඩ් බන්ධනාගාරවල දිනපතා ආහාර විශාල ප්‍රමාණයක් අපතේ යනබව කොමිසමට නිරීක්ෂණය විය. එයට එක හේතුවක් ලෙස ආහාර රසවත් හා ගුණවත් බැවින් අඩුවීම ද, තවත් හේතුවක් ලෙස රිමාන්ඩ් බන්ධනාගාරගතවුවන්ට නිවෙස්වලින් ආහාර ගෙන්වාගැනීමට අවස්ථාව ලැබීමද දැක්විය හැකිය. ඒ පිළිබඳ සලකමින් බන්ධනාගාර තුළ ආහාර පිළියෙළ කිරීමේදී ප්‍රමාණාත්මක අඩුකිරීමක් නිසි ලෙස සිදු නොවේ. ආහාර පිළියෙළ කිරීමේදී සිදුවන මේ අකාර්යක්ෂමතා හේතුවෙන් ආහාර ද්‍රව්‍ය අපතේ යාම බහුලව සිදුවේ.

බන්ධනාගාරවල ආහාර පිසින සිරකරුවන් හට ඉන් පෙර ඒ පිළිබඳව අත්දැකීම් නොමැති හෙයින් ආහාරවල ගුණාත්මකබවට අහිතකර බලපෑම් ඇතිකරන බවත් කොමිසමට දන්වන ලදී. දේශීය නීති ප්‍රකාරව සෞඛ්‍ය නිලධාරීන් මුළුතැන්ගෙවල තත්වය පරික්ෂා නොකරන බැවින් ආහාර පිසීම පිළිබඳ තත්ත්ව පරීක්ෂණ කිසිසේත් සිදු නොවේ. මෙම නොසැලකිල්ල හේතුවෙන් නිලධාරීහු සිරකරුවන්ට හිමි ආහාර රසකාරක, ආහාර ද්‍රව්‍ය ආදිය තමන් වෙත ලබාගන්නා බවට චෝදනා ඉදිරිපත් වන අතර මෙයද ආහාරවල ගුණාත්මක තත්වය කෙරෙහි අහිතකර ලෙස බලපායි.

කොමිසම ආවේක්ෂණය සඳහා පැමිණි දින කිහිපය තුළ බන්ධනාගාර ආහාරවල සැලකිය යුතු ගුණාත්මක ඉහළයාමක් දක්නට ලැබුණු බවද බොහෝ බන්ධනාගාරවල රැඳවියෝ පවසා සිටියහ.

04. ජලය, සනීපාරක්ෂාව හා පෞද්ගලික ස්වස්ථතාවය

බන්ධන්නාගාරවල පවතින තදබදය හේතුවෙන් මෙපමණ විශාල රැඳවියන් සංඛ්‍යාවක් වෙනුවෙන් සැලසුම් නොකරන ලද යල්පිනූ බන්ධනාගාර ගොඩනැගිලි තුළ රැඳවියන් හට අඛණ්ඩ ජල සැපයුමක් හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීමට බාධා පමුණුවයි. වැසිකිළි හා ජල සැපයුම් ස්ථාන හා සිරකරුවන් අතර අනුපාතය ඉතා ඉහළ මට්ටමක පවතින අතර තමන්ට අවශ්‍ය තරම් ජලය නොලැබෙන බවට සෑම බන්ධනාගාරයකින්ම පාහේ පැමිණිලි ලැබුණි. බන්ධනාගාර පද්ධතිය තුළ පවතින වැසිකිළිවල ස්වයංක්‍රියව අපද්‍රව්‍ය සේදී යාමේ තාක්ෂණය නොමැති බැවින් තමන්ට හිමිවන සීමිත ජල ප්‍රමාණයද වැසිකිළි භාවිතයෙන් පසු එය සෝදා හැරීමට වැයවන බව සිරකරුවෝ පැමිණිලි කළහ.

නගරයෙන් බැහැර ග්‍රාමීය ප්‍රදේශවල ස්ථාපිත බන්ධනාගාර සඳහා ප්‍රධාන ජල සැපයුමක් නොමැති බැවින් ස්වභාවික ජල ප්‍රභවවලින් ජලය සපයාගැනීමට සිදුව තිබේ. ඇතැම් බන්ධනාගාරවලින් තමන්ට ලැබෙන ජලයෙහි ගුණාත්මක තත්වය පිළිබඳ පැමිණිලි ගණනාවක් ලැබුණි. විශේෂයෙන් ස්වභාවික ජල ප්‍රභව භාවිතයෙන් සැපයෙන ජලය මඩ සහිත හෝ අපිරිසිදු වන බවත් කිවුල් හෝ ලවණමය රසයකින් යුක්ත බවත් ඔවුහු පැමිණිලි කළහ.

බන්ධනාගාර වාට්ටු තුළ ස්ථාපිත වැසිකිළිවල දොරවල් හෝ වෙන් කළ කුටි නොපවතින බැවින් සිරකරුවන්ට ඒවා භාවිතයේදී ලැබිය යුතු පෞද්ගලිකත්වය හිමි නොවේ. බන්ධනාගාර පද්ධතිය තුළ දක්නට ලැබෙන පොදු භාවිතාවක් වන්නේ රාත්‍රී කාලයේදී සිරකරුවන් හුදකලා සිරමැදිරිවල අගුලු ලන බැවින් හා එම සිර මැදිරි තුළ වැසිකිළි නොපවතින බැවින් රාත්‍රියේදී වැසිකිළි යාමට අවශ්‍ය වූ විට ප්ලාස්ටික් බාල්දියකට හෝ පොලිතින් බෑගයකට සිය මළ මූත්‍ර පහකිරීමයි. මෙම බාල්දිය හෝ බෑග රාත්‍රිය පුරා සිර මැදිරිය තුළ රඳවා තැබීමට ඔවුනට සිදුවේ. තනි සිර මැදිරියක පුද්ගලයන් කිහිපදෙනෙකු සිටින විට ඔවුනට මෙවන් එක් බාල්දියක් බෙදාගැනීමට සිදුවන අතර සාමාන්‍යයෙන් සිර මැදිරියට අලුතින්ම පැමිණි සාමාජිකයාට පසුදින එය බැහැරකොට පිරිසිදු කිරීමේ රාජකාරිය පැවරේ.

සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම සඳහා බන්ධනාගාර තුළ මුදල් ප්‍රතිපාදන වෙන් නොකෙරෙන බැවින් රැඳවියන් හට තමන්ට හැකි අයුරින් බැහැරින් තමන් බැලීමට එන නෑදෑ හිතවතුන් මගින් ඒවා සපයාගැනීමට සිදුවේ. එහෙත් එසේ කිසිවෙකුත් බැහැරින් නොපැමිණෙන ඇය හා විදේශිකයන් හට තමන්ට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය සපයාගැනීමේ හැකියාවක් නොමැත. මෙවන් අවස්ථාවලදී එවැනි ද්‍රව්‍ය ප්‍රමාණවත් තරම් ලබාගත හැකි රැඳවියෙකුගේ පෞද්ගලික කාර්යයන් ඉටුකරදීම මගින් තමන්ට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමට ඔවුනට සිදුවේ. බන්ධනාගාරවල මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් වැසිකිළි ආදිය පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ද බන්ධනාගාරයෙන් නොසැපයෙන බැවින් ඒවායෙහි සෞඛ්‍යයට අහිතකර තත්වය තවදුරටත් ඉහළ යයි.

05. වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවීමේ හැකියාව

ජාත්‍යන්තර රෙගුලාසි අනුව බන්ධනාගාර තුළ සිටින්නන්ටද බන්ධනාගාරවලින් පිටත සිටින්නන් හා සමානව සෞඛ්‍ය පහසුකම් ලැබිය යුතු වුවද, දේශීය නීති ප්‍රතිපාදන අනුවද බන්ධනාගාරගතවූවන්ට කාර්යක්ෂම ලෙස සෞඛ්‍ය පහසුකම් ලැබීමේ අවස්ථාව හිමිවිය යුතු වුවද සත්‍ය වශයෙන්ම බන්ධනාගාරගතවූවන්ට සෞඛ්‍ය පහසුකම් ලැබීමේ මට්ටම ඊට බොහෝ පහළ තත්වයක තිබෙන බව කොමිසමේ අවධානයට යොමු වූයේය. බන්ධනාගාර සෞඛ්‍ය පහසුකම් ද ජාතික සෞඛ්‍ය සේවා පද්ධතියා අයත් වන බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය නිලධාරින් බඳවා ගැනීම මෙන්ම අවශ්‍ය ඖෂධ ද්‍රව්‍ය ආදිය සම්පාදනය පිළිබඳව ද වගකීම දරයි. බන්ධනාගාරවලට අවශ්‍ය හෙද නිලධාරින් හා

ඔසුහල් සේවකයන් බඳවා ගැනීම හා බන්ධනාගාර රෝහල් පාලනය සිදුකෙරෙනුයේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගිනි. බන්ධනාගාර රන්දවියන්ට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමේදී මෙන්ම එම කටයුතු පරිපාලනයේදී මෙවන් දෝෂ පැවතීමට ප්‍රධාන හේතු වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව අතර පවතින වගකීම් හා රාජකාරි බෙදාගැනීමේ දුර්වලතා හා මේ දෙපාර්ශවය අතර සහසම්බන්ධතාවයේ පවතින දුර්වලතාවන් ය.

බන්ධනාගාර රෝහල් තුළ සෞඛ්‍ය යටිතල පහසුකම් හා විශේෂ ඖෂධ වල දැඩි හිඟයක් පවතී. ඒ හේතුවෙන් බන්ධනාගාර රෝහල්වලින් ලැබිය හැකි ප්‍රතිකාර සීමා වන අතර සිරකරුවන් රජයේ රෝහල්වලට මාරුකොට ප්‍රතිකාර කිරීමට හා රෝග නිශ්චය කිරීමට සිදුවේ. බන්ධනාගාර රෝහල්වල කාර්යමණ්ඩල හිඟයක්ද පවතී. විශේෂයෙන් බන්ධනාගාර සෞඛ්‍ය පද්ධතිය තුළ කාන්තා හෙද නිලධාරීන්ගේ උග්‍ර හිඟයක් පවතී. දිවා කාලයේ නිශ්චිත වේලාවන් හි දී වෛද්‍යවරු බන්ධනාගාර රෝගීන් පරික්ෂාව සඳහා රැඳී සිටිති. රාත්‍රියේදී දැනුම් දුන් විට පැමිණෙන නමුත් වෛද්‍යවරු බන්ධනාගාර පරිශ්‍රයේ රැඳී නොසිටිති. මේ හේතුවෙන් රාත්‍රී කාලයේදී සෞඛ්‍ය පහසුකම් ලබාදීමක් සිදු නොවන තරම් වේ. රාත්‍රී කාලයේදී යම් රෝග ලක්ෂණයක් පෙන්වුම් කරන බන්ධනාගාර රෝගීන්ට ඉන් පීඩා විඳිමින් පසුදා වෛද්‍යවරයා වෙත රැගෙන යනතුරු සිටීමට සිදුවේ. මෙසේ වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාද වීම හේතුවෙන් සිරකරුවන් ගණනාවක් එම රෝගවල ගොදුරක් වූ බවටද චෝදනා ඉදිරිපත්වේ.

රැඳවියන් නිසි වේලාවට රජයේ රෝහල් කරා රැගෙන යාම කෙරෙහි බලපාන ලෙස පද්ධතිය තුළ දැඩි ප්‍රවාහන පහසුකම් අර්බුදයක් හා නිලධාරීන්ගේ හිඟයක්ද පවතී. මේ හේතුවෙන් සෑම බන්ධනාගාරයකම විශාල රැඳවියන් ප්‍රමාණයකගෙන් වසර ගණනාවක් හෝ මාස ගණනාවක් පුරා ශල්‍යකර්ම හෝ වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාද වූ අවස්ථා පිළිබඳව කොමිසමට පැමිණිලි ලැබුණි. බන්ධනාගාර අධිකාරිවරුන් මෙයට හේතු වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවේ ප්‍රමාණවත් තරම් වාහන හෝ සිරකරු කැඳවාගෙන යාමට නිලධාරින් නොමැති වීමයි. මෙසේ රෝහල්වලට රැගෙන යාම අධිකරණ රාජකාරි හා අනෙකුත් මාරු කිරීම අතරතුර ඉටු කිරීමට සිදුවේ. මෙය ඉතා බැරෑරුම් කාර්යයක් වන්නේ මරණයට තීන්දු වූ හෝ අධි අවදානම් සහිත සිරකරුවන් රජයේ රෝහලකට රැගෙන යාමට වැඩි බන්ධනාගාර නිලධාරින් ප්‍රමාණයක්, පොලිස් නිලධාරින් හා විශේෂ කාර්ය බලකා නිලධාරින් පවා අවශ්‍ය වන බැවිනි. මේ නිසා අධිකාරිවරු මෙසේ වෛද්‍ය නිර්දේශ මත රෝගීන් මාරු කිරීමට ප්‍රමුඛතාවයක් නොදෙනුයේ රෝග ලක්ෂණවල බරපතල බවට වඩා අවස්ථාමය කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමිනි.

රැඳවියන්ගෙන් ඔවුන්ගේ වරද පිළිබඳ කරුණු විමසීම හා ඔවුනට වෙනස් කොට සැලකීම පිළිබඳව ද වෛද්‍යවරුනට එරෙහිව කොමිසමට පැමිණිලි ඉදිරිපත් වුයේය. මත්ද්‍රව්‍ය පිළිබඳ වරදකරුවන් වැන්නවුන් හට වෛද්‍යවරුන් විසින් ඔවුන් සිරගත කළ හෝ රිමාන්ඩ් බන්ධනාගාරගත කළ අපරාධය පිළිබඳව නිරන්තරයෙන් සිහි කැඳවමින් කටයුතු කරන බවටත් ඇතැම්විට ඔවුන්ගේ අපරාධයේ බරපතලකම නිසා ප්‍රතිකාර අවශ්‍ය නොමැති බවත් පවසමින් රෝගයෙන් පීඩා විඳිය යුතු බව ප්‍රකාශ කරන බවටත් පැමිණිලි ලැබුණි. මෙය බන්ධනාගාරගතවූවකුගේ මානසික සෞඛ්‍ය කෙරෙහි බරපතල ලෙස බලපෑම් සිදුකරන අතර ඔවුහු වෛද්‍ය සහාය පැතීමට අධෛර්ය වෙති. එහෙත් බලවත් සමාජ-ආර්ථික පසුබිමක් සහිත සිරකරුවන් වෛද්‍ය නිලධාරීන්ගෙන් ඉතා ඉහළ සැලකීමක් සහිතව ප්‍රතිකාර ලබන බවත් ඔවුන් බොහොමයක් බන්ධනාගාර රෝහල් වල නිත්‍ය සාමාජිකයන් වන බවත් වාර්තා විය.

පැහැදිලිව පෙනෙන තුවාලයකට වෛද්‍ය නිලධාරියෙකු ප්‍රතිකාර කළ ද අදාළ සිරකරුවා අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම අනිවාර්ය නොවේ. මෙය වෛද්‍ය නිලධාරින් පහරදීම් පිළිබඳව අදාළ බලධාරීන් වෙත වාර්තා කළ යුතුය යන ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට පටහැනිව යාමකි. බාහිර පාර්ශ්වයන්ගේ ආවේක්ෂණයට කලාතුරකින් බඳුන් වන මෙවන් ආයතනවල වෛද්‍යවරු වාස්තවික

තුන්වන පාර්ශවයක් ලෙස වැදගත් භූමිකාවක් නිරූපණය කරති. ඔවුනට පහරදීමක් පිළිබඳව පැමිණිලි කරන රැඳවියා හට අවශ්‍ය ප්‍රතිකාර හා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට මැදිහත් වී ක්‍රියා කළ හැකිය.

බන්ධනාගාර පරිසරය මානසික ඇබ්බැහිවීම් කුප්පනු ලබන අතර අර්ථාන්විත කාර්යයක දීමට නොහැකියාව හා පවුලෙන් වෙන්ව සිටීම සමග එක් වූ විට මේ මානසික තත්වයන් තවදුරටත් කුළුගැන්වේ. එපමණක් නොව, බන්ධනාගාර සෞඛ්‍ය සේවාව තුළ මානසික සෞඛ්‍ය සේවා නොමැති බැවින් මානසික රෝගී තත්වවලින් පෙළෙන රැඳවියන් සිරගතව සිටින කාල සීමාව තුළ තව දුරටත් ඔවුන්ගේ මානසික සෞඛ්‍ය පිරිහීම සිදුවිය හැකිය. ඇතැම් බන්ධනාගාරවල අඛණ්ඩ මානසික රෝග සායනයන් පවතින අතර වරින් වර මානසික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරු ද ඒවාට පැමිණ සිය සේවාව සලසති. එහෙත් අභ්‍යන්තර උපදේශන නිලධාරීන් සිටිනුයේ බන්ධනාගාර අතළොස්සක පමණි. මානසික රෝගී රැඳවියෙකු විශේෂයෙන් ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන විට නිලධාරීහු ඔහු හෝ ඇය හුදකලා කිරීමට හෝ බැඳ තැබීමට පෙළඹෙති. එසේම මත්ද්‍රව්‍ය අපක්‍රමණ රෝග ලක්ෂණ පෙන්න රෝගීන් හට ඔවුන පාලනය කිරීමේ අරමුණින් බොහෝවිට පහරදීම් සිදුකරන බවටද වාර්තා වේ. බොහෝ බන්ධනාගාර මෙවන් මානසික රෝග සහිත රැඳවියන් එකම වාට්ටුවක රඳවන අතර එය “පිස්සු වාට්ටුව” ලෙස හැඳින්වේ. මෙම කාමරයේ සිටින රැඳවියෝ බොහෝවිට ගර්භාවට බඳුන් වේ. මානසික රෝගී රැඳවියෙකු ප්‍රතිකාර සඳහා අංගොඩ මානසික සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය වෙත යොමු කිරීම තීරණය වන්නේ වාහන පහසුකම්වල ස්වභාවය මත ය.

## 06. බාහිර ලෝකය සමග සම්බන්ධතාවය

බන්ධනාගාරගතවූවන් හට ඔවුන්ගේ පවුල් හා සම්බන්ධ වීම සඳහා ක්‍රියාත්මක වන ක්‍රමවේදය එයින් අපේක්ෂිත අරමුණු ඉටුනොකරයි. රිමාන්ඩ් බන්ධනාගාරවල ආගන්තුකයන් මුණගැසීමේ කාමරවල යටිතල පහසුකම් සුහද පවුල් වාතාවරණයක් ගොඩනොනගන අතර ඉන් සිදුවන්නේ රැඳවියන්ගේ පීඩාවන් තවදුරටත් වර්ධනය වීමයි. මෙයට හේතුව ආගන්තුකයන් හමුවන කාමරවල පාරාන්ධ දැලකින් ඔවුන් වෙන් කර තිබීමයි. එබැවින් ඔවුන්ට සිය පවුලේ සාමාජිකයන් දැකීම හා ඔවුනට ඇහුම්කන්දීම ඉතා අසීරු වේ. මෙම ආගන්තුකයන් හමුවීමේ කාමරවල තදබදය අධික වන විට වාතාශ්‍රය හා ආලෝකය අඩුවී ඉතා ඉහළ උෂ්ණාධික පරිසරයක් ඇති වේ. සෑම දිනකම ඉතා විශාල ආගන්තුකයන් පිරිසකට ඉඩ සැලසිය යුතු බැවින් එක් ආගන්තුකයෙකුට රැඳී සිටිය හැක්කේ මිනිත්තු කිහිපයක් පමණි. බොහෝ හමුවීම් ප්‍රමාණයක් එකවර සිදුවන බැවින් එකිනෙකාට තමන් පවසන දේ ශ්‍රවනය වීමට නම් අනෙකාගේ හඬ පරයා කෑ ගැසීමට පවා සිදුවේ. බන්ධනාගාර නිලධාරීන් බොහෝවිට මේ ආගන්තුකයන් හට අපහාසාත්මක හා අශිලාචාර අන්දමින් සලකන බවත්, කාන්තා ආගන්තුකයන් හට නිගාදෙන අන්දමින් සැලකීම හෝ ලිංගික වක්‍රෝක්ති ප්‍රකාශ සිදුකරන බවත් බන්ධනාගාරගතවූවෝ පැවසූහ.

රිමාන්ද් බන්ධනාගරගතවූවන්ට නිවෙස්වලින් ලැබෙන ආහාර බන්ධනාගාර නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්වන අතර එසේ සිදුකරන පරීක්ෂාවන් කෙතරම් නොසැලකිලිමත් හා අපිරිසිඳු ආකාරයෙන් සිදුවේද යත් එම ආහාර මුල් ලිහී විසිරීයාම හෝ ආහාරයට ගත නොහැකි සේ අපිරිසිඳු වීම සිදුවේ. මෙම තත්වයද රැඳවියන් තුළ ආතතියක් ඇතිකරයි. මේ පිළිබඳව බන්ධනාගාර පරිපාලකයන්ගේ ප්‍රතිචාරය වූයේ තහනම් ද්‍රව්‍ය තිබේදැයි පරීක්ෂාවට සුදුසු කාර්යක්ෂම තාක්ෂණික ක්‍රමවේදයන් හෝ ප්‍රමාණවත් තරම් නිලධාරීන් නොමැති බැවින් ඔවුනට මෙසේ කඩිනමින් දෑතින් පරීක්ෂා කිරීමට සිදුවන බවයි.

බොහෝ බන්ධනාගාරවල කාර්යක්ෂම තැපැල් සේවාවක් නොමැතිවීම හේතුවෙන් පවුලේ සාමාජිකයන්ට හමුවීමට නොහැකි අවස්ථාවලදී රැඳවියන් හා පවුලේ සාමාජිකයන් අතර සන්නිවේදනය දැඩි සේ සීමා වේ.

බන්ධනාගාරය මගින් සෑම ලිපියක්ම පරික්ෂා කොට වාරණය කළයුතු බැවින් සිංහල බස හැරුණුකොට වෙනත් භාෂා පිළිබඳ අවබෝධය සහිත නිලධාරින් නොමැති අවස්ථා වලදී එවන් ලිපි තැපැල් කිරීම සම්පූර්ණයෙන්ම නවතා දැමේ. දුරකථන කුටි දක්නට ලැබෙනුයේ වැලිකඩ බන්ධනාගාරයේ පමණි. සෑම දුරකථන ඇමතුමකම ගාස්තු පවුලේ සාමාජිකයන් විසින් දැරිය යුතුය. කෙසේවෙතත් මේ දුරකථන කුටිවලින් විදේශයන් හට ඇමතුම් ලබාගත නොහැකි බැවින් විදේශිකයන්ට ඉන් ඇතිවන්නේ අවාසිදායක තත්වයකි.

නොහො බන්ධනාගාරවල නීතිඥවරුන්ට සිය සේවාලාභින් මුණගැසීමට වෙනම කාමරයක් වෙන් කෙරුණද එවන් හමුවීම් සඳහා අතිරේක ගාස්තු අයකෙරෙන බැවින් රැඳවියන් බහුතරයකට එසේ නීතිඥයන් හමුවීමට අවස්ථාවක් නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සිරකරුවන් සිය නීතිඥවරුන් හමුවන්නේ අධිකරණයේදී පමණි. ඒ අනුව බන්ධනාගාරවල ප්‍රමාණවත් සන්නිවේදන පහසුකම් නොමැතිවීම හේතුවෙන් විත්තිකරුවන්ට තම නීතිඥවරුන් හමුවෙමින් නඩුවට අවශ්‍ය ප්‍රබල විත්තිවාචකයන් සූදානම් කරගැනීමේ අවස්ථාව නොලැබී යයි.

## 07. දුක්ගැනවිලි යාන්ත්‍රණය

කොමිසමේ නිලධාරින් බන්ධනාගාරවලට පැමිණි වහා රැඳවියෝ සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටි බව නිරීක්ෂණය කළ හැකි විය. කෙසේවෙතත්, පවතින ක්‍රියාදාමයේ ප්‍රමාදයන් හා මින් පෙර පැමිණිලි ඉදිරිපත් කර දීර්ඝ කාලයක් ගතවුවද ඊට පිළියම් නොලද වෙනත් රැඳවියන් දකින ඔවුහු අන්තර් දුක්ගැනවිලි යාන්ත්‍රණය වෙත යොමුවීමට මැළිවෙති. බොහොමයක් රැඳවියන් අතර පවතින මතයක් වන්නේ බන්ධනාගාර අධිකාරිවරයාගේ පක්ෂග්‍රාහීත්වය හේතුවෙන් නිලධාරියෙකුට එරෙහිව කරන පැමිණිලි නිසි ලෙස විභාග නොකෙරෙන බව හෝ සිය ඉල්ලීම් නිලධාරින් විසින් අධිකාරිවරයා වෙත යොමු නොකෙරෙන බවයි. ඇතැම්හු මෙසේ පැමිණිලි කිරීමෙන් තමන් නිලධාරීන්ගේ උදහසට ලක්වේය යන බියෙන් පසුවෙති. කොමිසම වෙත පැමිණිලි ඉදිරිපත් කිරීම හේතුවෙන් තර්ජනයට හෝ හිංසනයට තමන් ලක්වූ බවටද රැඳවියන් චෝදනා කළ අවස්ථා දක්නට ලැබිණ. අධිකාරිවරයා සිය ආවේක්ෂණයන් සිදුකරන විටකදී හෝ රැඳවියෙකු අධිකාරිවරයාගේ කාර්යාලයේදී පැමිණිලි ඉදිරිපත් කරන විට එහි තවත් නිලධාරියෙකු රැඳී සිටීම නිසා හෝ රහස්‍යභාවය පිළිබඳ රැඳවියන් තුළ ගැටළු පැන නැගේ. බදුල්ල රිමාන්ඩ් බන්ධනාගාරයේ සෑම වාට්ටුවකම ඉල්ලීම් හා පැමිණිලි නිර්නාමිකව සටහන් කිරීමට පැමිණිලි පොතක් සපයා ඇත. යාපනය රිමාන්ඩ් බන්ධනාගාරයේ රැඳවියන්ගේ පැමිණිලි පෙට්ටියක් මේ වෙනුවෙන් ස්ථාපනය කර ඇත.

ඇතැම් විනිසුරුවරුන් මාසිකව බන්ධනාගාර වෙත පැමිණෙන බවත් එවිට බන්ධනාගාර වටා යමින් ආවේක්ෂණයන් සිදුකරන බවත් එම අවස්ථාවලදී රැඳවියන්ට තම දුක්ගැනවිලි මේ විනිසුරුවරුන් වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන බවත් කොමිසමට තොරතුරු ලැබිණ. කෙසේවෙතත් රිමාන්ඩ් බන්ධනාගාරගත රැඳවියන්ට අධිකරණවලදී විනිසුරුවරුන් මුණගැසීමට අවස්ථාව ලැබෙන නමුත් දඬුවම් නියම කරන ලද රැඳවියන් හට විනිසුරුවරුන් හමුවීමට අවස්ථාවක් ලැබෙනුයේ මෙසේ කලාතුරකින් විනිසුරුවරයෙකු බන්ධනාගාරයට පැමිණියහොත් පමණි.

දුක්ගැනවිලි ගණනාවක් පිළිබඳව සිරකරුවන් හට කොමිසම වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට අවශ්‍ය වුවද ඔවුන් විසින් කොමිසම වෙත යවන ලිපි නිලධාරීන්ගේ පරික්ෂාවට ලක්වන බැවින් ස්ථිර විශ්වාසයකින් යුතුව සිය පැමිණිලි ඉදිරිපත් කිරීමට ඔවුහු පැකිළෙති. එසේම වැලිකඩ හැරුණුකොට අනෙකුත් බන්ධනාගාරවල රැඳවියන්ට කොමිසමෙහි දුරකථන අංකයට ඇමතුම් ලබාදීමටද හැකියාවක් නොමැත.

වැලිකඩ බන්ධනාගාරයේ පවා දුරකථන ඇමතුම් පරික්ෂාවට ලක් කෙරෙන හෙයින් රහසිගතව පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැත.

## 08. සිරකරු-නිලධාරි සම්බන්ධතාවය

නිලධාරින් රැඳවියන්ට දක්වන සැලකිල්ල බොහෝවිට පදනම් වනුයේ රැඳවියාගේ සමාජ මට්ටම, ජාතිය, ආගම හා ඔවුන් දඬුවම් ලැබූ හෝ චෝදනාවට ලක්ව සිටින වරද මත බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය. බොහෝ නිලධාරීහු රැඳවියන් හට මනුෂ්‍යයන් ලෙස ඔවුනට හිමි විය යුතු ගෞරවය හා අභිමානය සුරකෙන පරිදි නොසැලකූහ. එමෙන්ම නිලධාරීන්ගේ වාචික හිංසනයන් ද නිරන්තරයෙන් සෑම විටකම දක්නට ලැබුණකි. ඇතැම් බන්ධනාගාරවල අධිකාරිවරු තම යටත් නිලධාරින් රැඳවියන්ට අසභ්‍ය වචනයෙන් කතාකරන බවත් ඒ පිළිබඳව යම් පියවර ගත යුතු බවත් පිළිගත්හ. බොහෝ අධිකාරිවරු බන්ධනාගාර නිලධාරීන්ට රැඳවියන් සමග ගනුදෙනු කිරීමේදී අසභ්‍ය වචන භාවිතයෙන් වැළකෙන ලෙස පැහැදිලි උපදෙස් ලබා දී ඇති බව වාර්තා කළහ.

නිලධාරින් හා රැඳවියන් අතර බලය පිළිබඳ සාධකය ප්‍රකට වන්නේ මේ අන්තර් පුද්ගල සම්බන්ධතාවලදී ය. ඇතැම් අවස්ථාවලදී රැඳවියන් විසින් නිලධාරීන්ගේ දෙපා සම්භාහනය කරන ආකාරය, පාවහන් ඔපදමන ආකාරය දැකගත හැකිය. රිමාන්ඩ් බන්ධනාගාර රැඳවියන් මෙසේ දරුණු සැලකීම්වලට ලක්වුවද මරණ දඬුවමට යටත් වූ හෝ දීර්ඝ කාලින සිර දඬුවම් විඳින සිරකරුවන් හට නිලධාරීහු යම් සානුකම්පිත හා හිතවත් ස්වභාවයකින් සලකනුයේ කාලානුරූපව ඔවුන් සමග දැන හැඳිනීමක් ඇතිකරගෙන සිටින හෙයිනි. බන්ධනාගාර නිලධාරීහු මරණ දඬුවම හිමි සිරකරුවන් පීඩාවට පත් කිරීමට පැකිළෙන ආකාරයක් පවා දැකිය හැක්කේ ඔවුන්ගේ දඬුවම හා දුෂ්කර සිරගත දිවිය හේතුවෙන් තවදුරටත් ඔවුනට අහිමි වීමට කිසිවක් නොමැති බැවින් බන්ධනාගාරයේ සාමයට බාධා කළේ යයි ඔවුනට පැනවිය හැකි වෙනත් සීමාවක්ද නොමැති බැවිනි.

කෙසේවෙතත් උසස් සමාජ පසුබිමක් සහිත රැඳවියන් සම්බන්ධයෙන් මේ නිලධාරීහු ගෞරවාන්විතව කටයුතු කරන අතර අනෙකුත් රැඳවියන්ට නොලැබෙන විශේෂ පහසුකම් හා වරප්‍රසාද ද ලැබෙන ආකාරය දැකිය හැකිය. මෙවැනි සිරකරුවන් හට පෙර කී වරප්‍රසාද ලැබීමේ තත්වය යම් තාක් දුරකට බන්ධනාගාර පද්ධතියේ දූෂණයටද හේතුවන්නේ ඔවුනට ලබාදෙන වරප්‍රසාද වෙනුවෙන් නිලධාරින් අල්ලස් ලබාගන්නා බවට වාර්තා වීම හේතුවෙනි.

රැඳවියන් අතර ජාතිය හා ආගම හේතුකොටගත් වෙනස් කොට සැලකීම් ද පවතින බව රැඳවියෝ කොමිසමට දැන්වූහ. මෙවන් රැඳවියන් අතර වන පූර්ව විනිශ්චයන් පිළිබඳව බොහෝ පැමිණිලි ඉදිරිපත් කළේ දමිළ ජාතික හා විදේශික රැඳවියන් විසිනි.

වාට්ටුවල සිටින වාට්ටු නායකයන් හට සිය වාට්ටු සාමාජිකයන් නියාමනය හා පාලනය සඳහා බන්ධනාගාර නිලධාරින් විසින් යම් බලයක් පවරනු ලබා ඇත. එමෙන්ම ඔවුහු බන්ධනාගාර නිලධාරින් සමග වඩා හොඳ සම්බන්ධතාවයක්ද පවත්වාගෙන යාමට සමත්වෙති. එයට හේතුව ඔවුන් විසින් තම වාට්ටු සාමාජිකයන්ගේ ක්‍රියාවන් පිළිබඳව නිලධාරීන්ට බොහෝවිට තොරතුරු සපයනු ලැබීමයි. මෙම තත්වය හේතුවෙන් රැඳවියන් අතර අසමතුලිත බල ගලනයක් සිදුවන බැවින් එය තවදුරටත් බලය හඹායන රැඳවියන් විසින් අවභාවිතා කළ හැකි අහිතකර තත්වයකි.

09. විනය හා දඬුවම

බන්ධනාගාර තුළ සිදුකෙරෙන වැරදි සඳහා දඬුවම් ක්‍රමයක් ලෙස මෙන්ම විනය හා සාමය පවත්වාගෙන යාමේ මූලික අංගයක් ලෙස ශාරීරික පහරදීම් බොහෝවිට භාවිත වන බව කොමිසම නිරීක්ෂණය කළේය. හේතු ගණනාවකට බන්ධනාගාර නිලධාරින් පහරදීම්වල නිරතවෙනු දැකිය හැකි වූ අතර මූලික වශයෙන් එසේ පහර ලැබුවේ දිළිඳු සමාජ පසුබිමකින් පැමිණෙන පුද්ගලයන් ය.

මෙසේ සිරකරුවන්ට පහරදීම සඳහා පොලු මුගුරු හා වයර් භාවිත කරනු දක්නට ලැබේ. අනෙකුත් සිරකරුවන් ඉදිරිපිට දණගස්වා හෝ දැත් වලින් එල්ලා මේ පහරදීම් සිදුකෙරේ. අධිකාරිවරුන් හා ප්‍රධාන ජේලර්වරුන් ඇතුළු සියලුම තරාතිරම්වල නිලධාරීහු මෙසේ සිරකරුවන්ට පහරදෙමින් ප්‍රචණ්ඩත්වය මුදාහරින බව වාර්තා වේ. බොහෝ බන්ධනාගාරවල නිලධාරීහු බීමතින් මේ පහරදීම් සිදුකරන බවට චෝදනා ඉදිරිපත් විය. බන්ධනාගාරය තුළ සාමය පවත්වා ගැනීමේ මූලික උපක්‍රමය ලෙස ඔවුන් සලකනුයේ ප්‍රචණ්ඩත්වයයි. සිරකරුවන් හට ඉතා සුළු කරුණකදී පවා, නිලධාරින්ගේ බලය පෙන්වීමට, ඔවුන් සතුව බලපෑම් කිරීමට හා විපාක ගෙනදීමට ඇති බලය පෙන්වීමට මෙසේ පහරදීම් සිදුකෙරේ.

බන්ධනාගාර නිලධාරින් හට රැඳවියන් පාලනය කරමින් සාමය පවත්වාගෙන යාම සඳහා ප්‍රචණ්ඩකාරී නොවන උපාය මාර්ග භාවිතය පිළිබඳ පුහුණුවක් නොලැබේ. එසේම නිලධාරීන්ගේ රාජකාරි පරිසරය හා ඒ සම්බන්ධ ආතතිය මෙන්ම දැඩි වෙහෙස මෙසේ සිරකරුවන් කෙරෙහි ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීමට හේතු වන බව ද කොමිසමට දන්වන ලදී. මින් පෙර සිරකරු-නිලධාරි සම්බන්ධතාවය කොටසේ පෙන්වා දුන් පරිදි බලවත් සමාජ-ආර්ථික පරිසරයකින් පැවතෙන්නෝ මෙසේ සිදුකෙරෙන පහරදීම් පිළිබඳව පැමිණිලි නොකරති.

මෙසේ නිලධාරින් සිරකරුවන් කෙරෙහි ප්‍රචණ්ඩකාරීව හැසිරීමට මූලික හේතුව වන්නේ එසේ ප්‍රචණ්ඩ ලෙස සිරකරුවන්ට සැලකීම සම්බන්ධයෙන් ඔවුනට කිසිදු දඬුවමක් ලබා නොදීමයි. එතුළින් මුක්තිය පිළිබඳ සංස්කෘතියක් ගොඩනැගේ. බන්ධනාගාර පිළිබඳ අධ්‍යයනයේදී දිවයින පුරා බන්ධනාගාරවලට කොමිසමෙහි නිලධාරින් නිරන්තරයෙන් පැමිණීමත් සමග ඇතැම් බන්ධනාගාරවල ප්‍රචණ්ඩත්වය මර්දනය වූ බවද වාර්තා වේ. එයට හේතුව කොමිසම විසින් ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිලධාරීන්ට චෝදනා ඉදිරිපත් කරතැයි ඇති වූ බිය බව දැක්විය හැකිය. මින් පෙනී යන්නේ ප්‍රචණ්ඩත්වය සහමුලින් මැඩලීමේ ප්‍රතිපත්තිය මත නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග හා/හෝ වධ හිංසන පිළිබඳ පනත යටතේ නඩු පැවරීම බන්ධනාගාර නිලධාරින් ප්‍රචණ්ඩත්වය මුදාහැරීම කෙරෙහි නිවර්තක බලපෑමක් ඇතිකර තිබෙන බවයි.

බහුලව භාවිත කෙරෙන තවත් දඬුවම් ක්‍රමයක් වන්නේ හුදකලා සිරගත කිරීමයි. මේ සඳහා භාවිත කෙරෙන සිර මැදිරි ඉතා අඳුරු, තෙතබරිත, වාතාශ්‍රය අඩු, බොහෝවිට වැසිකිළි පහසුකම් පවා නොමැති ඒවා බව කොමිසමෙහි නිරීක්ෂණයට ලක් විය. මෙම තත්වය එම දඬුවමෙහි ස්වභාවය තවදුරටත් දරුණු කරවයි. මෙය දඬුවම් පිණිස සිරගත කිරීමේදී මනුෂ්‍යයන්ට නුසුදුසු පරිසරයක් ඇතිකිරීම වැළැක්වීම පිළිබඳව වූ ජාත්‍යන්තර නීතියට පටහැනිව යාමකි.

යම් රැඳවියෙකු බන්ධනාගාරය තුළ වරදක් සිදුකළ බවට චෝදනා එල්ල වූ විට ඒ පිළිබඳ විභාග කිරීම සඳහා බන්ධනාගාර විනිශ්චය සභාවක් කැඳවා දඬුවම් පැමිණවිය හැකිය. මෙහි තීන්දු ලබාදීම සඳහා සාමාන්‍යයෙන් දිස්ත්‍රික් අධිකරණ විනිසුරුවරයෙකු කැඳවන අතර එසේ ලබාදිය හැකි උපරිම දඬුවම වසර 5ක සිර දඬුවමයි. මෙසේ විනිශ්චය සභාව මගින් ලබාදෙන දඬුවම චූදිතයා ඒ වනවිටත් විඳිමින් සිටින සිර දඬුවමෙහිම දිගුවක් වන බව පෙන්වා දිය යුතුය.

මෙම නඩු විභාගයන් අධිකරණයක නොපවත්වා බන්ධනාගාරය තුළ ම සිදුකෙරෙන විට එහි අපක්ෂපාතී බව පිළිබඳ ඔවුනට ගැටළු පැනනැගෙන බව සිරකරුවෝ පැවසූහ. සිරකරුවන්ට තමන් වෙනුවෙන් කතා කිරීමට ඉදිරිපත් විය හැකි කිසිවෙකු නොමැති බැවින් ඔහු දැඩි අවාසිදායක තත්වයකට මුහුණ දෙන අතර විශාල බල අසමතුලනයක් එහිදී ඇතිවේ. සිරකරුවන්ට තමන් වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥයන් කැඳවීමේ අවස්ථාව සාමාන්‍යයෙන් ලබාදුන්නද බන්ධනාගාරයට නීතිඥයන් කැඳවීම අතිරේක වියදමක් දැරීමට සිදුවන තත්වයකි. ඒ හේතුවෙන් සාමාන්‍යයෙන් සිදුවන්නේ සිරකරු තමන් විසින්ම විනිසුරු ඉදිරියෙහි කරුණු දැක්වීමයි. සිරකරුවන්ගේ චෝදනාව වන්නේ විනිසුරුවරුන් කිසිදු කරුණු විමසීමකින් තොරව හුදෙක් බන්ධනාගාර නිලධාරීවරුන්ගේ ප්‍රකාශයන් මත පදනම්ව තීන්දු ගන්නා බවයි. මෙය පක්ෂග්‍රාහිත්වයේ සලකුණකි.

පහර කෑමකට ලක්වීමට ප්‍රධානතම හේතුවක් ලෙස තහනම් ද්‍රව්‍යයක් තමන් සන්තකයේ තබාගැනීම හැඳින්විය හැකි වුවද බන්ධනාගාරයට තහනම් ද්‍රව්‍ය රහසේ ගෙන ඒමට නිලධාරීන් සම්බන්ධ බවත්, මේ පිළිබඳව නීතිය පිළිබඳ අමාත්‍යාංශයේ හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ දැනුවත් බවත් සෑම බන්ධනාගාරයකම රැඳවියෝ චෝදනා කළහ. තහනම් ද්‍රව්‍ය බන්ධනාගාර තුළට රැගෙන ඒමෙන් වැළැක්වීම මේ වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මුහුණ දෙන බරපතලම ගැටළුවක් බව කොමිසම වෙත විශේෂයෙන් දන්වනු ලැබිණ. එපමණක් නොව බන්ධනාගාරයට තහනම් ද්‍රව්‍ය ඇතුළු වීම වැළැක්වීම සඳහා ශරීර හා පාර්සල් ස්කෑනර් යන්ත්‍ර හඳුන්වා දීම වැනි නව ප්‍රතිපත්ති ගෙන ඒම හා නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ ද තවදුරටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට මෙම තත්වය සාර්ථකව සමනය කිරීමට හැකියාව ලැබී නැත. මේ අනුව තහනම් ද්‍රව්‍ය රහසේ ගෙන ඒම වැළැක්වීමට නම් එවැනි දූෂණ ක්‍රියා වර්ධනය කෙරෙහි තුඩු දෙන මූලික හේතු හා පද්ධතියේ දෝෂ සැලකිල්ලට ගත යුතු බව පැහැදිලිය. මෙවැනි නීති විරෝධී ක්‍රියාවන් සිදුවිය හැකි සංකීර්ණ පරිසරයක සිරකරු-නිලධාරි බල අසමතුලනය හා එක්වූ කළ බන්ධනාගාර නිලධාරීන් විසින් රහසේ ගෙන එන තහනම් ද්‍රව්‍ය සඳහා ඔවුනට දඬුවම් නොකර රැඳවියන් හට දඬුවම් පැමිණවීමේ විශාල අවදානමක් පවතී. මෙවැනි සංසිද්ධීන් බන්ධනාගාර තුළ තහනම් ද්‍රව්‍ය පැතිරීම වැළැක්වීමට බාධා පමුණුවනු ඇත.

## 10. බන්ධනාගාර තුළ සිදුවන මරණ

අධ්‍යයනයේදී බන්ධනාගාර තුළ සිදුවන මරණ පිළිබඳ විමසුම් කරන අතරතුර කොමිසමට රැඳවුම් භාරයේ සිටින සිරකරුවන්ගේ මරණවලට හේතු වශයෙන් දැක්විය හැකි පොදු රටාවන් ගණනාවක් අනාවරණය කරගත හැකි විය. බන්ධනාගාර නිලධාරීන් හා රැඳවියන් විසින් මුදාහරිනු ලබන ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අවසානයේදී මරණය සිදුවන අවස්ථා ද දක්නට ලැබිණ. කොමිසම වෙත වාර්තා වූ මෙවන් සෑම සිදුවීමකදීම අදාළ රැඳවියා බොහෝ විට මත්ද්‍රව්‍ය නොමැති වීමෙන් හෝ මානසික ව්‍යාධියක් හේතුවෙන් පීඩා විඳිමින් සිටි අයෙකු වූයේය. මේ හේතුවෙන් ඔවුන් නොසන්සුන්තාවයක් ඇති කළ විට එය මර්දනය සඳහා ප්‍රචණ්ඩත්වය මුදා හැර තිබුණි.

සිරකරුවෙකු බන්ධනාගාරයට ඇතුළත් වන අවස්ථාවේදී ඉන් පෙර ඔහුගේ ශරීරයේ වන තුවාල කැළැල් ආදිය සටහන් කිරීම සඳහා ඔහු ඡායාරූපගත කිරීම හා හඳුනා ගැනීමේ සලකුණු සටහන් කිරීම ඉතා වැදගත් වන බව කොමිසමට අනාවරණය විය ඒ අනුව යම් රැඳවියෙකුට පහරදීමක් සිදුවූයේ බන්ධනාගාරයට ඇතුළු වීමෙන් පසුවද නොඑසේ නම් ඉන් පෙරාතුවද යන්න පිළිබඳ කාල නිර්ණයක් සිදුකළ හැකිය. කෙසේවෙතත්, සන්ධ්‍යා කාලයේදී බන්ධනාගාරවලට රැගෙන එන රැඳවියන් පරීක්ෂාවට ලක් කෙරෙනුයේ පසු දිනයේදී ය. ඒ නිසා නව සිරකරුවෙකු ලියාපදිංචියට පෙර පළමු රාත්‍රියේදී පහර කෑමකට ලක් වූයේද

යන්න තීරණය කිරීමට හෝ අත්අඩංගුවට පත්වීමේදී තුවාල සිදුවූයේද යන්න තීරණය කිරීමට අපහසු වේ. තමන් විසින් තමන්ට ම හානි පමුනුවාගන්නා හා සියදිවි නසාගැනීමේ නැඹුරුවක් ඇති රැඳවියන් සම්බන්ධයෙන් බන්ධනාගාර පාලනාධිකාරිය කටයුතු කරනුයේ ඔවුන් හුදකලා කිරීමෙනි. මානසික රෝගවලින් පීඩා විඳින්නවුන්ගේ රෝග ලක්ෂණ උත්සන්න වීමත් සමග ඔවුනට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නොලැබීමත් හේතුවෙන් සියදිවි නසාගැනීමේ නැඹුරුව තවදුරටත් වර්ධනය විය හැකි අතර රැඳවියෝ එයට ගොදුරු වෙති.

වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාද වීම, විශේෂයෙන් රාත්‍රී කාලයේදී හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදිය යුතු අවස්ථාවලදී එම ප්‍රතිකාර ප්‍රමාද වීම නිසා රැඳවියන්ගෙ මරණ සිදුවූ අවස්ථා වාර්තා වේ. සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කොටසේදී සාකච්ඡා කළ පරිදි රාත්‍රී කාලයේදී අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නොලැබීම බන්ධනාගාර සෞඛ්‍ය සේවාවේ ඇති ප්‍රධාන දුර්වලතාවයකි. මේ හේතුවෙන් රැඳවියන් මරණයට පත්වූ අවස්ථා පිළිබඳ රටාවක් කොමිසමේ අවධානයට ලක් විය. රැඳවියන් මරණයට ගොදුරු වූ බොහෝ අවස්ථාවන් වාර්තා වන්නේ රාත්‍රී කාලයේදී වන අතර අධීක්ෂණ හා මුර සංචාර සඳහා අවශ්‍ය තරම් නිලධාරීන් නොමැති වීම මෙන්ම කඩිනමින් නිලධාරීන් අවශ්‍ය පියවර නොගැනීම හේතුවෙන් මෙම මරණ බොහොමයක් සිදුවූ බව නිරීක්ෂණය කළ හැකිය.

රැඳවුම් භාරයේදී සිදු වූ සෑම මරණයක් පිළිබඳවම අධිකරණමය විමර්ශනයක් සිදුකෙරෙන බව කොමිසමට දන්වනු ලැබුවද බන්ධනාගාර පාලනාධිකාරිය විසින් සකස් කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා මරණයට අදාළ මූලික පසුබිම සඳහන් කරමින් සැකසූ ලිපිගොනුවක් පමණි. මරණයට පත් වූ තැනැත්තාගේ ලිපිගොනුවෙහි මරණයට හේතුව හෝ ඒ පිළිබඳ විමර්ශන වාර්තා කිසිවක් ඇතුළත් නොවේ. මේ හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර නොලැබී යාම වැනි එයට හේතු වූ කරුණු හඳුනාගැනීම මගහැරී යයි. බන්ධනාගාර තුළ නඩත්තු කෙරෙන මරණ වාර්තා පරිශීලනයේදී එම මරණවලට හේතු සාධක වූ කරුණු පිළිබඳ ප්‍රමාණවත් දත්ත ඇතැම් වාර්තාවල නොතිබීමෙන් බන්ධනාගාර තුළ සිදුවන මරණ පිළිබඳ පූර්ණ අන්තර් ක්‍රියාවලියක් නොමැති වීමේ අඩුව මැනවින් පෙන්වා දෙයි. දත්ත නිවැරදිව වාර්තා නොවන බැවින් එවන් සිදුවීම්වලින් සිය දුර්වලතා හඳුනාගනිමින් බන්ධනාගාරයේ ක්‍රියාවලිය හා පද්ධතිය නිවැරදි කරගැනීමේ අවස්ථාව ද අහිමි වී යයි. දැඩි භෞතික හා මානව සම්පත් හිඟය සමග මෙවන් දුර්වලතා ද එක් වූ කල අවදානම් සහිත රැඳවියන්ට බන්ධනාගාරය තුළ ඉතා අනතුරුදායක පරිසරයක් ඇති කරයි. කොමිසමේ මහත් විස්මයට හේතු වූයේ බන්ධනාගාර තුළ සිදුවන මරණ පිළිබඳව ඔවුන් දක්වන උදාසීන ප්‍රතිචාරයයි. ඉන් ගම්‍ය වන්නේ සිරගතව සිටින්නකුගේ ජීවිතය වටිනාකමින් අඩු බවක් නොවේද?

බන්ධනාගාර තුළ සිදුවන මරණ පිළිබඳ අධිකරණමය නොවන විමර්ශනයන් මූලික වශයෙන් සිදුකෙරෙනුයේ මානව හිමිකම් කොමිසම මගිනි.

# II කොටස : පුනරුත්තාපන ක්‍රමවේදය

## 11. බන්ධනාගාරගතවූවන් පුනරුත්තාපනය

ශ්‍රී ලංකාවේ දණ්ඩන ක්‍රමවේදයේ ප්‍රධාන දුර්වලතාවයක් වන්නේ පුනරුත්තාපනයේදී පෞද්ගලිකායනය සිදු නොකිරීමයි. ශ්‍රී ලාංකික දණ්ඩන ක්‍රමවේදයේදී රැඳවියන්ගේ පෞද්ගලික හැකියාව, කැමැත්ත හෝ පෙර වෘත්තීන් පිළිබඳව සලකමින් සුදුසු පුනරුත්තාපන වැඩසටහකන් වෙත යොමුකිරීමක් දක්නට නොමැත. බන්ධනාගාරවල පුනරුත්තාපනය පෞද්ගලිකායනය වුවහොත් රැඳවියන් පුනරුත්තාපනය කොට සමාජයට සාර්ථක ලෙස නැවත මුදාහැරිම ඉහළ යනු ඇත. කෙසේවෙතත්, පවතින ක්‍රමවේදයේදී නිදහස් වීමෙන් පසුව සාර්ථක ලෙස ජීවනෝපායකට යොමුවීම සඳහා හැකියාවන් සංවර්ධනය කරගන්නේ සිය ගණනක් වූ සිරකරුවන්ගෙන් කිහිපදෙනෙකු පමණි. මේ වෙනුවෙන් ආවස්ථික වැඩසටහන් කිහිපයක් පමණක් ඇතැම් බන්ධනාගාරවල ස්ථාපිත කර ඇති බව කොමිසම අනාවරණය කළේය. උදාහරණ ලෙස, මූලික භාෂාමය හා ලේඛනමය හැකියා සංවර්ධනය සඳහා සිරකරුවන්ට භාෂා පන්ති පැවැත්වුණද ඒ සඳහා උනන්දු වෙමින් අතරමග ඇණහිටි ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කර ජාතික විෂයමාලාව අනුව උසස් අධ්‍යාපනය ලබාගැනීමේ අවස්ථාව උදා කරගන්නේ කිහිපදෙනෙකු පමණි.

පුනරුත්තාපනයේ මූලික මෙවලම ලෙස ආගමික හා අධ්‍යාත්මික දැනුම ලබාදීම සලකමින් බන්ධනාගාරයේ එවන් වැඩසටහන් සුදානම් කෙරුණද එම වැඩසටහ ආමන්ත්‍රණය කරනුයේ බෞද්ධයන් හට පමණි. සමස්තයක් ලෙස සියලු බන්ධනාගාරවල කණ්ඩායම් උපදේශනය හා මත්ද්‍රව්‍ය පුනරුත්තාපනය වැනි අනෙකුත් ක්‍රමවේදයන් උපයෝගී කර නොගන්නා අතර පාලනාධිකාරය බාහිර ආයතන සමග සම්බන්ධ වන කුඩා පරිමාණයේ ස්ථානවල පමණක් මේවා ක්‍රියාත්මක වන ආකාරය දැකගත හැකිය. බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක කෙරෙන වෘත්තීය වැඩසටහන් ලෙස පෙදරේරු කර්මාන්තය, ගඩොල් සැකසීම, කෘෂිකර්මාන්තය හා වෑල්ඩින් කර්මාන්තය පෙන්වා දිය හැකිය. මෙම වැඩසටහන් අධ්‍යයනයේදී පෙනී යන්නේ රැඳවියන් හට නිදහස ලැබීමෙන් පසු ප්‍රමාණවත් ආදායමක් ලබාගත හැකි ජීවනෝපායකට අවශ්‍ය හැකියා වර්ධනය සඳහා විවිධාකාර නව වැඩසටහන් හඳුන්වා දීමේ අවශ්‍යතාවයයි. එයට අමතරව දැනට පවතින පුනරුත්තාපන වැඩසටහන් සඳහා ද ප්‍රමාණවත් තරම් මුදල් ප්‍රතිපාදන නොලැබෙන බැවින් රැඳවියන් යල්පැනගිය, අබලන් වූ මෙවලම් භාවිතයෙන් වැඩ කරන ආකාරය හා නිසි උපදෙස් ලබාදීමට දක්ෂ උපදේශකවරුන් නොමැති වීම දැකගත හැකිය. මෙවන් හේතු නිසා රැඳවියන් කැපවීමෙන් එම වැඩසටහන් වලට එකතු වී කටයුතු කිරීමට අධෛර්යය වෙති. මේ සියල්ල නිසා බන්ධනාගාර පුනරුත්තාපන වැඩසටහන් හරහා රැඳවියන් තුළ ධනාත්මක වෙනසක් ඇතිකිරීමට හෝ සමාජයට මුදාහැරීමෙන් පසු ඔවුන් නැවත අපරාධ වෙත යොමුවීම වැළැක්වීමට හෝ අසමත් වෙයි.

අපරාධ යුක්තිය පිළිබඳ පද්ධතියේ කොටසක් වන සියලු දෙනා අතරින් බන්ධනාගාර තුළ සාර්ථක පුනරුත්තාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් රැඳවියන් තුළ සැබෑ පරිවර්තනයක් ඇතිකිරීම හා එයින් ලැබිය හැකි වාසි පිළිබඳ ව වඩාත් විශ්වාසය තබා ඇත්තේ බන්ධනාගාර නිලධාරින් හා පුනරුත්තාපන නිලධාරින් බව කොමිසමට පෙනී ගියේය. කෙසේවෙතත්, ඔවුන්ගේ දැක්ම පද්ධතික බාධකයන් මගින් වළක්වා ඇත. ප්‍රතිපාදන හා සම්පත් හිඟය, විශේෂයෙන් පුනරුත්තාපන හා උපදේශන නිලධාරීන්ගේ හිඟය බන්ධනාගාර තුළ ඵලදායි පුනරුත්තාපනයක් සිදුකිරීමට නොහැකි වීමේ මූලික අවහිරතාවය ලෙස දැක්විය හැකිය. බන්ධනාගාර සමග සම්බන්ධ වීමට බාහිර සංවිධාන තුළ පවතින පැකිළීම මේ ගැටලුව තවදුරටත් සංකීර්ණ කරයි. එයින් පැහැදිලි වන්නේ විශෝධන ආයතන සිරකරුවන්ට දඬුවම් ලබාදීමේ ඒකක නොව ඔවුන් පුනරුත්තාපනය කිරීමේ ඒකක ලෙස සැලකීමට සමාජය හා රජය තුළ ආකල්පමය වෙනසක්

ඇතිකළ යුතු බවයි. එවිට මේ පුනරුත්තාපන වැඩසටහන් සඳහා ලබාදෙන මානව හා භෞතික සම්පත් අනාගත ආයෝජනයක් ලෙස සලකමින් වර්ධනය කළ හැකිය. තමන්ට විශෝධන ප්‍රතිපත්තිවලට අදාළ වඩාත් ඵලදායි ක්‍රමවේදයන් පිළිබඳව වැඩිදුර පුහුණුව අවශ්‍ය බව පුනරුත්තාපන නිලධාරින් විසින් ම පිළිගනු ලැබුහ. වර්තමානයේදී බන්ධනාගාර පුනරුත්තාපන වැඩසටහන්වල කාර්යක්ෂමතාව නියාමනය කරමින් තවදුරටත් ඒවා සංවර්ධනය කළ හැකි ආකාර පිළිබඳ පසු විපරමක් හෝ ඇගයීමක් සිදුවන්නේ අල්ප වශයෙනි. මෙයට මූලික හේතුව වන්නේ පුනරුත්තාපන අංශයේ බොහෝ කාර්යයන් සිදුකිරීමට තරම් ප්‍රමාණවත් පුනරුත්තාපන නිලධාරින් ප්‍රමාණයක්, බඳවා ගැනීමේ පටිපාටියේ නොසිටීමයි.

මෙම දුර්වලතා පිළිබඳව තමන් බන්ධනාගාරය තුළ ඵලදායි ලෙස කාලය නොගෙවන බවට හැඟෙන සිරකරුවන් විසින් ද පෙන්වා දෙනු ලබයි. බන්ධනාගාරගත කිරීමේ කේන්ද්‍රීය අරමුණ වන අපරාධ වැළැක්වීම මේ හරහා තර්ජනයට ලක් වේ.

## 12. බන්ධනාගාර වැඩ

බන්ධනාගාර වැඩ වල මූලික අභිප්‍රාය යම් කුසලතාවයක් වර්ධනය කරගන්නා අතරතුර සිරකරු තුළ වගකීම පිළිබඳව හැඟීමක් ඇතිකරමින් සුදුසු අයුරින් දෛනිකව රාජකාරියක නිරත කරවීමයි. රැඳවියනට මේ ආකාරයෙන් බන්ධනාගාර කාර්යාලයේ සේවය කිරීම, බන්ධනාගාර කටයුතු සඳහා භාණ්ඩ බෙදාහැරීම හෝ වැඩ සඳහා මුදාහැරීමේ ක්‍රමවේදය යටතේ බන්ධනාගාරයෙන් පිටත වැඩ කිරීම ආදී විවිධ රාජකාරිවල නියැළිය හැකිය. එසේම කෙටිකාලීන සිර දඬුවම් විඳින හෝ කෙටි කාලයකින් මුදා හැරීමට නියමිත, නිලධාරීන්ට අකීකරු වීම පිළිබඳ චෝදනා නොමැති සිරකරුවන් හට විවෘත සිර කඳවුරු හෝ වැඩ කඳවුරුවලට යා හැකිය. විවෘත කඳවුරු තුළ වඩු වැඩ හෝ වෑල්ඩින් වැඩ ආදී කර්මාන්ත කණ්ඩායම් දක්නට ලැබුණ ද එහි කේන්ද්‍රීය අවධානය යොමුවනුයේ කෘෂිකර්මාන්තය කෙරෙහි ය. මුදාහැරීමෙන් පසු ජීවනෝපාය සකස් කරගැනීමට උපකාරයක් නොවන බැවින් මෙය සිරකරුවන් පුනරුත්තාපනයෙහි ලා සීමාවන් ඇතිකරයි. උදාහරණ ලෙස, විවෘත බන්ධනාගාර හෝ වැඩ කඳවුරුවල කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන සිරකරුවන් මුදාහැරීමෙන් පසු ජීවත් වන්නේ නාගරික ප්‍රදේශයක නම් ඔවුනට තමන් ලැබූ අත්දැකීම්වලින් නිසි ප්‍රයෝජන ගත නොහැකි වේ. කාන්තා රැඳවියන්ගේ වැඩ බන්ධනාගාරය ඇතුළත පිරිසිඳු කිරීම් හා වෙනත් සුළු කටයුතුවලට පමණක් සීමා වේ.

බන්ධනාගාර පරිශ්‍ර වල වැඩ බිම් සඳහා අවශ්‍ය ස්වාභාවික හිරු එළිය, වාතාශ්‍රය හා ආරක්ෂාව වැනි සාධක අපේක්ෂිත මට්ටමට නොපවතිනුයේ ඒවා බොහෝවිට පැරණි අබලන් වූ ගොඩනැගිලි හා මඩු තුළ පවත්වාගෙන යන බැවිනි. කොමිසම විසින් මෙවන් වැඩ බිම්වල අනතුරුදායක ස්ථාන බොහොමයක් අනාවරණය කරගනු ලැබූ අතර ඒවායෙහි සේවය කරන රැඳවියන් හට ආරක්ෂිත උපාංග ආදිය නොමැති තරම් ය. රැඳවියන්ගේ වැඩ තත්වය පිළිබඳව වෛද්‍යවරුන්ගේ නිසි නියාමනයක් සිදු නොවන බැවින් හා වැඩිදියුණු කරගත යුතු දේ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමක් නොවන බැවින් එම වැඩ පරිසර අහිතකර හා අනාරක්ෂිත ස්වභාවයෙන්ම පවතී. රැඳවියන් පවසන අන්දමින් ඔවුනට ප්‍රමාණවත් තරම් විවේකය හෝ සිය පෞද්ගලික කටයුතු කරගැනීමට අවස්ථාවක් නොලැබෙන බැවින් ඔවුහු එය දඬුවමක් ලෙස විනා තම කාලය ප්‍රයෝජනවත් ලෙස ගතකිරීමක් ලෙස නොසලකති. විවෘත හා වැඩ කඳවුරුවල සිටින රැඳවියෝ තමන්ට සතියේ දින 7 ම වැඩ ක්‍රිරීමට සිදුවන බවට පැමිණිලි කරති.

සුදුසු උපකරණ හා නවීන මෙවලම් නොමැති බැවින් වැඩි කාලයක් හා ශ්‍රමයක් වැයකරමින් දෑතින් සියලු වැඩ කිරීමට සිදුවන බවට ද රැඳවියෝ පැමිණිලි කරති. මෙයට පුහුණු උපදේශකවරුන්ගේ සේවය අවශ්‍ය

බව කර්මාන්ත හා කුසලතා සංවර්ධන කොමසාරිස්වරයා පුන පුනා අවධාරණය කළ ද ඒ සඳහා අතිරේක මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතුව ඇත.

බන්ධනාගාරයෙන් පිටත වැඩකිරීමේ ක්‍රමවේදය යටතේ ප්‍රමාණවත් තරම් වේතනයක් ලැබුණද බන්ධනාගාරය ඇතුළත සේවය කිරීම වෙනුවෙන් රැඳවියන්ට හිමිවන්නේ දෛනිකව සත කිහිපයක් පමණි. පසුගිය වසර 35 පුරාවට රැඳවියන්ගේ දීමනා අනුපාතය පිළිබඳව සංශෝධනයක් සිදුකොට නොමැති අතර 1 ශ්‍රේණියේ රැඳවියෙකුට ලැබෙන්නා වූ අවම දෛනික වේතනය රුපියලකි. 4 ශ්‍රේණියේ රැඳවියන් ලබන ඉහළම දෛනික වේතනය රු. 2.50කි.

බන්ධනාගාරයෙන් පිටත වැඩ කරමින් ආදායමක් ලැබීමේ අවස්ථාවන් ඉතාමත් සීමා සහිත වේ. එසේම නිශ්චිත ප්‍රතිපත්තීන් තිබුණද වැඩ සඳහා මුදාහැරීමේ ක්‍රමවේදය නිසි ලෙස ප්‍රයෝජනයට නොගන්නා බව කොමිසමෙහි නිරීක්ෂණයට ලක් විය. වස සඳහා මුදාහැරීමේ ක්‍රමවේදය අනුව රැඳවියන් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන මගින් සේවයට යෙදවිය හැකි අතර ඔවුහු දිනපතා එම ආයතනවල සේවය කරමින් තම දඬුවම් කාලය තුළදීම සාමාන්‍ය සේවකයෙකුට හිමි වැටුප ලබාගනිති. සේවයට මුදාහැරිම පිළිබඳ ක්‍රමවේදය යටතේ බන්ධනාගාරයෙන් පිටත නවාතැන් ගැනීමට සිරකරුට අවස්ථාව තිබුණද වර්තමානයේදී මෙසේ පිටත සේවය කරන සෑම රැඳවියෙකුම දිනය අවසානයේදී පෙරළා බන්ධනාගාරයට පැමිණෙයි.

මූලික වෛද්‍ය පරීක්ෂණයේදී වැඩ කිරීමට නුසුදුසු යයි වර්ග කෙරෙන රැඳවියන් පවා සිය නිර්දේශයන් නොසලකා හරිමින් බන්ධනාගාරය තුළ සේවයේ යොදවන බව වෛද්‍ය නිලධාරීහු කොමිසමට දන්වා සිටියහ. රෝගාතුරව සිටියදී පවා තමන්ට වැඩ කිරීමට සිදුවන බවට ඇතැම් බන්ධනාගාරවල රැඳවියෝ පැමිණිලි කළහ.

## 13. නියමිත කාලයට පෙර මුදාහැරීමේ ක්‍රමවේදය

පුනරුත්තාපන ක්‍රමවේදයේ අවසන් අරමුණ වන්නේ රැඳවියන් තුළ යහපත් හා ප්‍රතිසංස්කරණාත්මක චර්යාවක් ඇතිකිරීමයි. ඒ හරහා නියමිත කාලයට පෙර බන්ධනාගාරයෙන් මුදාහැරීමයි. මරණ දඬුවම හිමි වූ හා ජීවිතාන්තය තෙක් සිර දඬුවම් නියම වූ සිරකරුවන් හට අනෙකුත් සිරකරුවන් මෙන් නියමිත කාලයට පෙර නිදහස ලැබීමට නම් ඔවුන් නිශ්චිත සිර දඬුවම් කොන්දේසිවලට මාරු විය යුතුය. මෙම පියවර ගැනීම සඳහා දඬසමාව හා ඇගයීම් ක්‍රමවේදයක් භාවිත කෙරෙන අතර නිවාඩු ලැබ නිවෙසට ගොස් සිටින කාලයේ චර්යාව මත පදනම් ව සිරකරුවන් හට මෙසේ මුදාහැරීමේ බලපත්‍රයක් ලැබේ.

### 13.1 න්‍යායදේශ කමිටු

න්‍යායදේශ කමිටු යනු අධිකරණ අමාත්‍යාංශය මගින් මරණ දඬුවම, ජීවිතාන්තය තෙක් සිර දඬුවමකටත්, ජීවිතාන්තය තෙක් සිර දඬුවම 20 වසරක සිර දඬුවමකටත් ලිහිල් කරමින් ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන කමිටුවයි. පෙර කී ඇගයීම් ක්‍රමවේදය හා අනුබද්ධව මේ න්‍යායදේශ ක්‍රියාවලියද අතීතයේදී අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණ. එහෙත්, ඇගයීම් සමගම මේ නිත්‍ය න්‍යායදේශ ක්‍රියාවලියද අහෝසි කරනු ලැබ ඇත. මේ වනවිට අමාත්‍යවරයාගේ අභිමතය අනුව හදිසි කමිටු ස්ථාපිත කිරීම පමණක් සිදුවේ. රැඳවියෙකු විසින් සිදුකළ වරද ඉන් පසු ක්‍රියාත්මක වන පුනරුත්තාපනය කෙරෙහි බලනොපාන අතර ඔහු පුනරුත්තාපනය වී ඇතිද යන්න කෙරෙහි බලපානුයේ බන්ධනාගාරය තුළ ඔහුගේ විනය හා දඬුවම් කාල සීමාව අතරතුර ඔහු සහභාගී වූ වෘත්තීය පුහුණුව ආදියයි.

න්‍යායදේශ ක්‍රියාවලිය තුළ දුර්වලතා ගණනාවක් නිරීක්ෂණය කළ හැකිය. අමාත්‍යවරයාගේ මනාපය පරිදි හදිසි කමිටු ස්ථාපනය කෙරෙන බැවින් වර්තමානයේදී එහි විනිවිදභාවය පිළිබඳව යම් ගැටළු පැනනගියි. නිශ්චිතව ම ස්ථාපනය කරන ලද කාර්ය පටිපාටියක් හා නිර්ණායකයන් නොවීම හේතුවෙන් අත්තනෝමතික තීරණවලට එළඹීමේ අවදානම හා විවිධ කමිටු මගින් එකිනෙකට වෙනස් සාධකවලට ප්‍රමුඛතාවයක් ලබාදීමේ අවදානම ද මෙහි පවතී. බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයාට අනුව "න්‍යායදේශය වරප්‍රසාදයක් මිස අයිතියක් නොවන" බැවින් සිරකරුට කමිටුවේ තීන්දුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවද හිමි නොවේ. එසේම සිරකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දැක්වීමක් ද මෙහිදී සිදුනොවේ.

## 13.2 ඇගයීම්

බන්ධනාගාර ආඥාපනත අනුව බන්ධනාගාරගතවූවකුගේ පුනරුත්තාපන ප්‍රගතිය නියාමනය සඳහා සෑම සිව් වසරකරටම වරක්, එනම්, සිව්වන, අටවන, දොළොස්වන, දහසයවන හා විසිවන වසරවලදී ඇගයීම්වලට ඉදිරිපත් කළ යුතුය. ඊට අදාළව අමාත්‍යාංශය විසින් අදාළ රැඳවියාගේ දඬුවම ලිහිල් කිරීම, අඩුකිරීම හෝ පුනරුත්තාපිත පුද්ගලයන් මුදාහැරීම පිළිබඳ නිර්දේශ සකස් කොට ජනාධිපතිවරයාගේ අනුමැතියට ඉදිරිපත් කෙරේ. දඬුවම් කාල සීමාව පිළිබඳව නොසලකමින් සෑම රැඳවියෙකු සඳහා ම මෙම ක්‍රියා පටිපාටිය අදාළ වේ.

බරපතල අපරාධකරුවන් හා මරණයට තීන්දු වූවන් "වේලාසනින්" නිදහස් කෙරෙන බවට වූ මහජන මතය නිසා අධිකරණමය, සමාජමය හා දේශපාලනමය වශයෙන් සිදුකළ බලපෑම් හා විරෝධතා හේතුවෙන් මෙම ඇගයීම් ක්‍රමවේදය 2001 වසරේදී අහෝසි කරනු ලැබිණ. කෙසේවෙතත්, අනිවාර්ය අවශ්‍යතාවය හේතුවෙන් සෑම රැඳවියෙකු පිළිබඳව ම සියලු බන්ධනාගාරවල මෙම ඇගයීම් වාර්තා සකස් කෙරෙන බව කොමිසමට දන්වා සිටින ලදී. මෙම වාර්තා අධිකරණ අමාත්‍යාංශයට හා ජනාධිපති කාර්යාලයට පවා යොමුකරනු ලැබේ. එහෙත් ඒ පිළිබඳ කිසිදු ඉදිරි පියවර ගැනීමක් ඉන් ඔබ්බට සිදු නොවේ. රැඳවියන් හට යහපත් චර්යාවෙන් යුතුව සිටීමට මෙන්ම පුනරුත්තාපන ක්‍රියාවලියට යොමුවීම සඳහා මෙසේ ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව නියමිත කාලයට පෙර මුදාහැරීම අභිප්‍රේරකයක් ලෙස භාවිත කළ හැකි බැවින් මෙය ඉතාමත් ඵලදායි ක්‍රමවේදයක් වන බවත් කාර්යක්ෂම විශෝධන ප්‍රතිපත්තියක් වන බවත් ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර නිලධාරීහු කොමිසමට දැනුම් දුන්හ. නිරන්තරයෙන් ඉහළ යන රැඳවියන්ගේ ධාරිතාවය පාලනයට මෙන්ම දීර්ඝ කාලීන සිර දඬුවම් හේතුවෙන් ඇතිවන ශාරීරික හා මානසික බලපෑම් අවම කිරීමටත් පිළියමක් ලෙස වරින් වර ක්‍රමානුකූලව සිදුකෙරෙන ඇගයීම් ප්‍රතිස්ථාපනයෙහි වැදගත්කම ඔවුහු හුවාදැක්වූහ.

## 13.3 දඬුවමින් සමාව දීම

සමාව දීමේ ලකුණු යනු යහපත් චර්යාව හා ඵලදායිතාව වෙනුවෙන් දෛනිකව රැඳවියන් හට ලකුණු පිරිනැමීමේ ක්‍රමවේදයකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රැඳවියා හට ඔහුට හිමි දඬුවම් කාලයෙන් කොටසක් අඩුකරගනිමින් නිදහස ලැබිය හැකිය. මේ සමාව දීමේ ලකුණු සෑම රැඳවියෙකුම බන්ධනාගාරයට ඇතුළත් වන දින හා වේලාසනින් මුදාහැරීම වාර්තා කරන දින අතර කාලය තුළ ගණනය කෙරේ.

කෙසේවෙතත්, මේ වනවිට සමාව දීමේ ලකුණු පටිපාටිය රැඳවියන් හට යහපත් චර්යාවක් පවත්වාගැනීමේ අභිප්‍රේරකයක් ආකාරයෙන් භාවිත නොවන බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය. උදාහරණ ලෙස

රැඳවියන් දවස පුරා ප්‍රයෝජනවත් කාර්යයක නියැළුණි ද නොඑසේ නම්, ඔවුන් වැඩ කරන ස්ථානයේ මෙවලම් නොමැතිවීම හේතුවෙන් අලසව කල් ගතකළේද යන්න නොසලකමින් දිනපතා සියලු රැඳවියන්ට උපරිම ලකුණු පිරිනැමෙන බව කොමිසමට දැනුම් දෙන ලදී. මෙසේ නිකරුණේ ලකුණු පිරිනැමීම හේතුවෙන් රැඳවියන් තුළ යහපත් චර්යාවක් ඇතිකිරීමේ උත්සාහය එලදැරීමේ ප්‍රතිශතය අවම වේ. එපමණක් නොව මෙම ලකුණු පිරිනැමීම පදනම් වන්නේ වැඩ කණ්ඩායමක දිනකට නිපදවන උපකරණ ප්‍රමාණය වැනි ප්‍රමාණාත්මක සාධක පදනම් කොටගෙන පමණි. මෙය ප්‍රතිඵල ඇගයීමේ සීමාසහිත ආකෘතියකි.

## 13.4 නිවාස බලා යාමේ නිවාඩු

තමන්ට හිමි දඬුවමින් නිශ්චිත ප්‍රමාණයක් ගෙවා දැමීමෙන් පසුව රැඳවියන් හට නිවාඩු ලැබ සිය පවුල් වෙත ගොස් යම්කිසි කාලයක් ගතකිරීමට අවසර ලැබේ. මෙසේ නිවාඩු ලැබීම සඳහා සෑම බන්ධනාගාරයකින්ම සුදුසුකම් සහිත රැඳවියන්ගේ ලැයිස්තුවක් සකස් කොට බන්ධනාගාර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබේ. සෑම බන්ධනාගාරයකම නිවාස බලා යාමේ නිවාඩු ලැබීමට රැඳවියෙකුගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙන කමිටුවක් පවතී. මෙම කමිටුව සාමාන්‍යයෙන් ප්‍රධාන ජේලර්වරයා, ජ්‍යෙෂ්ඨ සුබසාධන නිලධාරියෙකු, විනය සම්බන්ධ ජේලර්වරයෙකු හා වෘත්තීය පුහුණුකරුගෙන් සමන්විත වන අතර මෙහි මුලසුන දරණුයේ බන්ධනාගාර අධිකාරිවරයා විසිනි. සුදුසුකම් ලබන රැඳවියන්ගේ ලැයිස්තුව ඉන් අනතුරුව අධිකරණ අමාත්‍යංශය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ.

සමාජ වාර්තා සැකසීමට හා රැඳවියාගේ සංවර්ධනය ඇගයීමට ප්‍රමිතිගත ආකෘතියක් නොමැති වීම මෙන්ම රජයේ සිදුවන වෙනස්කම් මෙම ක්‍රියාවලියේ ප්‍රමාදයන් ඇතිකරන බවට රැඳවියෝ චෝදනා කරති. එමෙන්ම නිවාඩු ප්‍රතික්ෂේප කෙරෙන ඉල්ලුම්පත් හිමි රැඳවියන් හට එසේ ප්‍රතික්ෂේප වීමට හේතු දැක්වීමක් සිදුනොවන බැවින් මෙම ක්‍රමවේදයෙහි විනිවිදභාවය පිළිබඳවද ගැටළු පැනනැගේ. කෙසේවෙතත්, රැඳවියන් හට එම තීන්දුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

## 13.5 බලපත්‍ර මණ්ඩලය

බන්ධනාගාරය තුළ රැඳවියෙකුගේ චර්යාව හා ඔහු නියමිත කාලයට පෙර නිදහස් කිරීමේ හැකියාව පිළිබඳව අගයමින් බන්ධනාගාර නිලධාරින්, අධිකරණ අමාත්‍යංශය හා නීතිපති දෙපාර්තමේන්තු නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් වන බලපත්‍ර මණ්ඩලය මගින් බලපත්‍රයක් නිකුත් කිරීමෙන් ඔවුන් මුදාහැරීමේ ක්‍රමවේදය මෙයයි. සුදුසුකම් ලබන රැඳවියන්ගේ පදිංචි ස්ථාන වෙත ක්ෂේත්‍ර පරීක්ෂණවල නියැලෙමින් ඔහුට පවුලෙන් හා සමාජයෙන් ලැබිය හැකි සහයෝගය පිළිබඳව පුනරුත්ථාපන නිලධාරින් වාර්තා කළ යුතු වුවද මානව හා භෞතික සම්පත් ඌනතාවය හේතුවෙන් මෙම ක්‍රමවේදයෙහි ද ප්‍රමාදයන් දැකිය හැකිය.

බන්ධනාගාර තුළ කාන්තාවන් සඳහා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සීමාසහිත වීම හා නායකත්ව භූමිකා හිඟ වීම හේතුවෙන් කාන්තා රැඳවියන් හට මුදාහැරිම පිළිබඳ සතුටුදායක හේතු දැක්වීම් කිරීමට අසීරු වීම නිසා ඔවුහු අවාසිදායක තත්වයකට මුහුණ දෙති. මෙම ක්‍රමවේදයෙහි දක්නට ලැබෙන තවත් දුර්වලතාවයක් නම්, රැඳවියෙකුගේ සුදුසුකම් පරීක්ෂාව සම්බන්ධයෙන් බලපත්‍ර මණ්ඩලයට භාවිතා කළ හැකි කිසිදු ලිඛිත ප්‍රතිපත්තියක් හෝ මාර්ගෝපදේශයක් නොවීමයි. එම කමිටුවල ක්‍රියාකාරිත්වය සම්මත ක්‍රියා පටිපාටියකට අනුව ස්ථිර ප්‍රතිපත්තියකින් ක්‍රියාත්මක නොවීමද මෙහි දුර්වලතාවයකි. මෙසේ විෂයානුබද්ධ ප්‍රමිතීන් හා

විනිවිදභාවයක් නොමැති වීම යනු කමිටු සාමාජිකයන්ගේ පක්ෂපාතිත්වයන් හා මතවාදයන් තීන්දුවලට බලපෑ හැකිවීමයි. මෙම කමිටුව මගින් ප්‍රතික්ෂේප කෙරෙන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් හේතු දැක්වීමක්ද සිදු නොවේ. දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව ප්‍රතික්ෂේපිත අයදුම්කරුවන්ට කැමති නම් අභියාචනා ඉදිරිපත් කළ හැකිවන සේ මුදාහැරුණු රැඳවියන්ගේ නම් ප්‍රදර්ශනය කළ යුතුය. ඒ අනුව රැඳවියන් හට අභියාචනා ඉදිරිපත් කළ හැකි වුවද අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති කටයුතු) විසින් ප්‍රකාශ කරන ලද්දේ එසේ අභියාචනා ඉදිරිපත් කිරීමට රැඳවියන්ට අයිතියක් නොමැති බවයි. රැඳවියෙකුගේ පුනරුත්තාපිත මට්ටම වසර ගණනාව පුරා ඔහු සම්බන්ධව වූ ක්‍රියාවන් හා ඔහු හෙබවූ තනතුරු මත විනිශ්චය කෙරෙන බැවින් සත්‍ය වශයෙන්ම පුනරුත්තාපනය වුවද ස්වභාවයෙන්ම ලජ්ජාශීලී අන්තර්වර්තී රැඳවියෙකු හට තමන් පිළිබඳ ශක්තිමත් ඉල්ලීමක් සිදුකළ නොහැකිවනු ඇත. මේ හේතුවෙන් බලපත්‍ර මණ්ඩල ක්‍රමවේදයේ එක් අංගයක් ලෙස මානසික තත්වය පිළිබඳ ඇගයීමක් ද සිදුකිරීම එම ක්‍රියාවලියේ ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීමට හේතුවනු ඇත. දඬුවම් කාලය තුළ තමන් පුනරුත්තාපනය වූ බවට ශක්තිමත් කරුණු දැක්වීමක් සිදුකළද අදාළ රැඳවියා හට සහාය දියහැකි, ඔහු භාරගත හැකි පවුලක් හෝ පෙරළා යාමට නිවසක් හෝ නොමැති කල නියමිත කාලයට පෙර මුදාහැරීමේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද කොමිසම වෙත වාර්තා කරනු ලැබිණ.

## 13.6 විශේෂ හා පොදු සමාව

ජනාධිපතිවරයාගේ මනාපය පරිදි විශේෂ හේතුවක් නිසා රැඳවියෙකු හෝ රැඳවියන් පිරිසකගේ දඬුවම් ලිහිල් කිරීමට මෙන්ම ඔවුන් මුදාහැරීමට වන බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධායකයට පවරනු ලබයි.

පොදු සමාව සාමාන්‍යයෙන් ආගමික උත්සව, රජයේ නිවාඩු හා අනෙකුත් විශේෂ අවස්ථාවලදී ලබාදේ. මෙම සමාව ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා රැඳවියන් විසින් පූර්ව නිශ්චිත නිර්ණායකයන් සම්පූර්ණ කළ යුතුය. ඔවුන් හට පොදු සමාව ලැබීම වෙනුවෙන් පුනරුත්තාපනය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. බරපතල අපරාධ සිදුකළ රැඳවියෝ මේ සඳහා සුදුසුකම් නොලබති.

ඉහත පියවර හදිසි ක්‍රියාවලියක් අනුව සිදුකෙරෙන අතර ජනාධිපතිවරයාගේ හෝ අමාත්‍යාංශයේ මනාපය මත එය රඳා පවතී. ඉන් පැහැදිලි වන්නේ එම අවස්ථාව වන විට පවතින දේශපාලනික වාතාවරණය මත සමාව දීමේ ක්‍රියාවලිය රඳා පවතින බවයි. මෙම ක්‍රියාවලියේ ස්ථායිතාව හා බන්ධනාගාර තුළ යහපත් චර්යාව වෙනුවෙන් ලබාදෙන පාරිතෝෂිකයක් ලෙස මෙම සමාව පැවතීමට නම්, ඒ සඳහා ඒකීය හා ප්‍රමිතිගත ක්‍රමවේදයක් පැවතිය යුතුය. වාරාන්තරව සිදුවන සමාවදීම් අහෝසි කිරීම කෙරෙහි සමාව දෙන පුද්ගලයින්ගේ අත්තනෝමතික ක්‍රියා බලපෑ බවට චෝදනාවක් පවතී. ඒ වෙනුවට අවශ්‍ය ආරක්ෂිත පියවර ඇතුළත් කරමින් කිසිදු බලාධිකාරයක් මගින් බලය අවභාවිතා කිරීම වැළක්වීම හරහා මෙම ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් කළ යුතුය.

මෙසේ සමාව ප්‍රදානය කිරීම, ප්‍රතිෂ්ඨාපණ යුක්තිය පිළිබඳ අපරාධ යුක්ති ප්‍රතිපත්තිය හා සමග බැඳෙන අතර බන්ධනාගාරවල තදබදය අවම කිරීමේ පියවරකක්ද වේ.

## III කොටස : බන්ධනාගාරගතවූවන්ගේ විශේෂ ප්‍රබේදයන්

### 14. මරණ දඬුවමට ලක්වූවන්

කෲර හා පරිවර්තනය කළ නොහැකි දඬුවමක් වන බැවින්ද, ජීවිතය පිළිබඳ අයිතිය හා වධ හිංසනයෙන් මිදීමේ අයිතිය උල්ලංඝනය කෙරෙන බැවින්ද, අමානුෂික හා ගර්හාත්මක දඬුවමක් වන බැවින්ද මරණ දඬුවම අහෝසි කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජය විසින් මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ පමාසහනයක් අත්සන් කර තිබුණද තවදුරටත් පුද්ගලයන් මරණ දඬුවමට යටත් කරමින්ද, ඔවුහු අනියත දඬුවම් කාලයක් ගෙවමින්ද සිටිති. මේ හේතුවෙන් ඔවුන් කාලානුරූපව මුදාහැරීමේ ඵලදායි ක්‍රමවේදයක්ද නොමැතිව සමස්ත බන්ධනාගාර පද්ධතියටම මහත් බරක් වෙමින් සිටිති. කෙටි කාලීන සිරදඬුවම් විඳින්නෙකුට පවා දරාගත නොහැකි අන්දමේ කටුක බන්ධනාගාර තත්වයනට මුහුණ දීමට මේ මරණ දඬුවමට ලක් වූ රැඳවියන්ට සිදුවේ. ඔවුනට ඒ දුෂ්කරතාවලට අසීමාන්තිකව ගොදුරු වෙමින් කාල නියමයක් නොමැතිව කල්ගතකිරීමට සිදුවේ.

මරණ දඬුවමට ලක්වූවන් දරුණු බන්ධනාගාර තත්වයන් යටතේ රඳවා තැබේ. ඔවුනට දවසේ මුළු කාලයම බන්ධනාගාර වාට්ටු තුළ ගෙවීමට සිදුවන අතර ව්‍යායාම සඳහා බැහැරට ඒමට ලැබෙනුයේ මිනිත්තු 30ක කාලයක් පමණි. එයද තීරණය වන්නේ ඔවුන් මුර කිරීමට අවශ්‍ය තරම් නිලධාරීන් සිටීද යන සාධකය මත ය. මේ මරණ දඬුවමට ලක් වූවන් ගණනාවක් අඳුරු වාට්ටුවල ම කාලය ගතකිරීම හේතුවෙන් විවිධ දෘෂ්ටි ආබාධවලට ගොදුරුවී සිටින බව කොමිසමට දැනගැනීමට ලැබිණ. බොහෝ බන්ධනාගාරවල මරණ දඬුවමට ලක්වූවන් රාත්‍රියේදී අගුලු ලන සිරකුටිවල වැසිකිළි පහසුකම්ද නොමැතිව රඳවා තැබෙන බැවින් ඔවුනගේ දඬුවම් කාලයේ අවසානයක් නොමැතිවීම නිසා දශක ගණනාවක් පුරා සිරකුටිය තුළ ඇති ප්ලාස්ටික් බාල්දියකට ශරීර කෘත්‍ය කිරීමට සිදුවී ඇත.

දවස පුරා ප්‍රයෝජනවත් කාර්යයක නියැලීමට නොහැකිවීම, රැඳවුම් ස්ථානවල අහිතකර තත්වය හා සිය පවුල පිළිබඳ සිතුවිලි හේතුවෙන් බොහෝ මරණ දඬුවම හිමි රැඳවියෝ බරපතල මානසික රෝග ලක්ෂණ පෙන්වුම් කරති. මරණ දඬුවමට යටත්ව ගෙවන කාලය දීර්ඝ වත්ම මේ රෝග ලක්ෂණද උත්සන්න වේ. පෙර ඉදිරිපත් කළ පරිදි බන්ධනාගාර තුළ ප්‍රමාණවත් තරම් මානසික සෞඛ්‍ය සේවා නොසැපයේ. එසේම මරණ දඬුවම හිමි විශේෂ ගණයේ සිරකරුවන් ලෙස සැලකෙන බැවින් රජයේ රෝහල් කරා රැගෙන යාමට විශේෂ ආරක්ෂක විධිවිධාන යෙදීමට සිදුවීම හේතුවෙන් ඔවුනට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේදී ද දැඩි ප්‍රමාදයන්ට මුහුණ දීමට සිදුවේ.

මරණ දඬුවමට යටත් වූ රැඳවියන්ගෙන් ලබාගත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත අනුව මූලික වශයෙන්ම අර්ථදායි නීති සහයක් ලබාගැනීමට අසමත් වීම හේතුවෙන් ඔවුනගේ නඩු විභාගයන් පිළිබඳ පැනනැගුණු ගැටළු සමුදායක් අනාවරණය වේ. ඔවුනගේ නඩු විභාග වර්ෂ ගණනාවක් පුරා පවතී හෙයින් මුදල් ගෙවා පෞද්ගලිකව නීතිඥවරයෙකුගේ සහාය ලබාගැනීමට නොහැකි වූ බවත් එබැවින් රජයේ නීතිඥවරුන් මත යැපීමට සිදුවූ බවත් ඔවුහු ප්‍රකාශ කළහ. තමන් වෙනුවෙන් පත්කළ නීතිඥවරයා බොහෝ නඩුවාරවලදී හා තීන්දුව ලබාදෙන දිනයේදී පවා අධිකරණයේ පෙනී නොසිටි බවත් තමන් වෙනුවෙන් ශක්තිමත් විත්තිවාචක ගොඩනැගීමට කටයුතු නොකළ බවත් තවදුරටත් මේ රැඳවියෝ පෙන්වා දුන්හ. එහි ප්‍රතිඵලයක් ලෙස තමන්ට මරණ දඬුවම හිමිවීමට හේතුව ඔවුනට මුදල් ගෙවා නීතිඥවරයෙකු සපයාගත නොහැකිවීම හා ඔවුනට ලැබුණු නීති සහාය ප්‍රමාණවත් නොවීම බව ඔවුනගේ මතයයි.

එපමණක් නොව අපරාධ නඩු හා අභියාචනා විභාග ඇතැම්විට දශකයකට අධික කාලසීමාවක් වැනි දිගු කාලයක් පුරා සිදුකෙරෙන බැවින් කාලානුරූපව ඒවායේ භෞතික සාක්ෂි හා සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශනයන් ක්ෂය වීමකට හෝ වෙනස්වීමකට බඳුන් විය හැකිය. නඩු විභාගයන් අතරතුර ඔවුනගේ අයිතීන් සුරක්ෂිත නොවූ බවට මේ රැඳවියන් කරන චෝදනා අධිකරණ පද්ධතියේ දුර්වලතා පිළිබඳව අපට පෙන්වා දෙයි. පරිවර්තනය කළ නොහැකි ආන්තික දඬුවම් ක්‍රමයක් වූ මරණ දඬුවම අහෝසි කර දැමිය යුතු බවට මෙයද එක හේතුවකි.

මරණ දඬුවම පැනවීමේ බරපතලම අවදානම වන්නේ නිර්දෝෂී පුද්ගලයෙකුට දෝෂ සහගතව මෙම දඬුවම පැනවීමෙන් ඇතිවන සමාජමය හා මානසික බලපෑමයි. එහි ප්‍රතිඵලයක් ලෙස අපරාධ නීති පද්ධතිය පිළිබඳව මහජනයා තුළ පවතින විශ්වසනීයත්වය බිඳී යයි. තීන්දුව ලබාදීමෙන් පසු නඩු විභාගයේදී ඇති වූ දෝෂ සහගත තත්වයන් නැවත විමර්ශනයට ඇති අවම ඉඩපහසුකම් හේතුවෙන් මෙවන් දෝෂ සහගත තීන්දු පිළිබඳ අවධානය යොමුකොට ඒවා හඳුනාගනිමින් නිවැරදි කිරීම සම්බන්ධයෙන් ද බලාපොරොත්තු තැබිය නොහැකිය.

මරණ දඬුවමට යටත් වූ සිරකරුවන්ගේ පවුල්වලට ඒ හේතුවෙන් වන බලපෑම අවබෝධ කරගැනීමට ගැඹුරු අධ්‍යයනයක් හා බුද්ධිමත් ප්‍රතිපත්තීන් අවශ්‍ය වේ. ඒ ප්‍රතිපත්ති හරහා අදාළ දඬුවම හේතුවෙන් එම පවුල් පීඩාවට පත්නොවන බවට තහවුරු කළ යුතුය. මරණ දඬුවම හිමිවූවන්ගේ පවුල් සමාජය වෙතින් ගර්හාවට හා වෙන්කොට සැලකීමට බඳුන් වන අවස්ථා හා සිය මව හෝ පියා මරණ දඬුවමට යටත් බැවින් රාජ්‍ය සේවයට එක් වීමේදී ගැටළු මතු වූ අවස්ථා පවා කොමිසම වෙත වාර්තා වී තිබේ. මරණ දඬුවම හිමි සිරකරුවෝ, විශේෂයෙන් පවුලක එකම ආදායම් උපයන්නා වූ පිරිමි සිරකරුවෝ ඔවුනගේ දඬුවම සිය පවුල්වලට දරුණු බලපෑම් ඇතිකරන ආකාරය හා එය ඔවුනට දැඩි මානසික පීඩාවක් ගෙන දෙන ආකාරය සාකච්ඡා කළහ. තවත් සිරකරුවෝ සිය පවුල් විසින් තමන් අත්හැර දමනු ලැබීම හා තමන් හමුවීමට පවා කිසිවෙකු නොපැමිණීම පිළිබඳව දුක්ගැනවිලි නැගූහ.

## 15. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තැබූ සිරකරුවන්

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් විශේෂ ගණයෙහි ලා සැලකෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ජාත්‍යන්තර මානව හිමිකම් ධර්මතා යටතේ සහතික කෙරෙන ඇතැම් අයිතීන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මගින් වාරණයට ලක් කෙරෙන බැවිනි. එබැවින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන්හට අනෙකුත් සිරකරුවන්ට හිමි අයිතීන් නොලැබී යාමේ අවදානමට මුහුණ පෑමට සිදුවේ. විශේෂයෙන් රිමාන්ඩ් භාරයේ සිටින දීර්ඝ කාලය කෙරෙහි බලපානුයේ මේ හේතුවයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන්ට සලකන ආකාරය හා ඔවුන් මුහුණ දෙන තත්වය කෙරෙහි බරපතල බලපෑම් කිරීමට මෙසේ රඳවා තැබීම හේතු වෙයි.

ඔවුනගේ චෝදනාවල ස්වරූපය හේතුවෙන් තමන්ට සහෝදර රැඳවියන්ගෙන් මෙන්ම බන්ධනාගාර නිලධාරීන්ගෙන් පවා හිංසනයට හා හිරිහැරයට පත්වීම හා වෙන් කොට සැලකීමට බඳුන් වීමේ අවදානමට මුහුණ පෑමට සිදුවන බව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවෝ පැමිණිලි කළහ. මෙසේ සැලකීම නිසා සෑම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවෙකුම ප්‍රකාශ කළේ තමන් සාමාන්‍ය සිරකරුවන් සමග නොව අනෙකුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් සමග රඳවා තබනු ලැබීම වඩා සාධාරණ බවයි. ඔවුනගේ "විශේෂ" හෙවත්, වැඩි ආරක්ෂාවක් අවශ්‍ය තත්වය හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම ආදී අයිතීන් කෙරෙහි මොවුනට බාධා පැමිණෙයි. මෙයට හේතුව බරපතල සේවක හිඟය හේතුවෙන් ප්‍රවාහන හා ආරක්ෂක විධිවිධාන සැපයීමේ අපහසුව නිසා කඩිනමින් රෝහල් කරා රැගෙන යාමට මෙන්ම අඛණ්ඩව සායන කරා රැගෙන යාමට හැකියාවක් නොමැති වීමයි. එයට අමතරව

සියලු බන්ධනාගාර පුරා මෙම සිරකරුවන්ගේ “විශේෂ” තත්වය හේතුවෙන් ඔවුනට වෘත්තිය/හැකියා පුහුණු, අධ්‍යාපන අවස්ථා හා බන්ධනාගාර වැඩ ලබාගැනීමේ හැකියාව මගහැරී යයි. එමෙන්ම ඔවුනට එළිමහනේ සිටීමට ලැබෙන කාලය, අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන භාෂා මාධ්‍ය ගැටලු හෝ ඔවුන් රඳවා තැබෙන බන්ධනාගාරයේ ස්වභාවය ද එයට හේතු වේ.

ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් බොහොමයක් උතුරු නැගෙනහිර පළාත්වලට අයත් බැවින් හා ඔවුන් රඳවා ඇත්තේ දකුණු පළාතේ බන්ධනාගාරවල බැවින් මෙම රැඳවියන් හට සිය පවුල්වල සාමාජිකයන් හමුවීමේ අවස්තාව මගහැරේ. බොහෝ ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවෝ තමන්ට නීති සහාය ලබාගැනීමේදී ඇති වූ ගැටළු පිළිබඳ සඳහන් කළහ. විශේෂයෙන් මෙම චෝදනාවල ස්වරූපය හා එවන් නඩුවක විත්තිය වෙනුවෙන් පෙනී සිටීම හේතුවෙන් සමාජයෙන් ලැබිය හැකි ගර්හාවන් මෙන් ම චෝදනා ගොනු කොට නඩු විභාගය ඇරඹීමට ගතවන දීර්ඝ කාලය හේතුවෙන් නීතිඥ සහාය ලබාගැනීමට අසීරු වේ. අධ්‍යයනය අතරතුර රැස් කළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත අනුව ද ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් මුහුණ දෙන දීර්ඝ කාලීන සිර දඬුවම්වල සෘණාත්මක බලපෑම් ඉස්මතුවන්නේ මෙවැනි බොහෝ සිරකරුවන් වසර 15-20 ක් පුරා රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින බැවිනි.

සිරකරුවන්ගේ ප්‍රකාශ අනුව පෙනීයන්නේ ත්‍රස්තවාදය වැළක්වීමේ පනතෙහි 7[3] වගන්තිය අනුව ප්‍රශ්න කිරීම සඳහා රැඳවුම් භාරයෙන් මුදවා රැගෙන යාමේ අවකාශය හේතුවෙන් දිගින් දිගටම ඔවුනගේ හිමිකම් උල්ලංඝනය කෙරෙන බවයි. ඉන් බොහොමයක් දෙනා එසේ බැහැරට රැගෙන යන අවස්තාවලදී තමන්ට වධහිංසාවලට ගොදුරුවීමට සිදුවන බව පැමිණිලි කළහ. ඒ හරහා අධිකරණමය රැඳවුම් භාරය තුළින් ලබාදෙන ආරක්ෂාව අවතක්සේරුවට ලක් කෙරෙන අතර එසේ රඳවා තැබීමේ මූලික අරමුණ ද ගිලිහි යයි.

ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයාගේ කාර්යභාරය තීරණාත්මක වුවකි. ඔවුනට ශාරීරික හිංසනයන්වල බලපෑම හේතුවෙන් පාපොච්චාරණයනට අත්සන් තැබීමට සිදුවුයේ ද යන්න ඔප්පු කිරීම සඳහා ඔහුගේ සේවය අත්‍යවශ්‍ය වේ. කෙසේවෙතත්, පොලිස් නිලධාරින් හා අධිකරණ වෛද්‍ය නිලධාරින් අතර කුමන්ත්‍රණයන් හා භාෂා ගැටළු හේතුවෙන් අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට මේ සිරකරුවන් සමග සන්නිවේදනය කිරීමට නොහැකි වීම පිළිබඳ බොහෝ පැමිණිලි කොමිසම වෙත ලැබී ඇත. ඒ අනුව රැඳවුම් භාරයේ සිටියදී ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ චෝදනාවට ලක් වූ සිරකරුවන් පිළිබඳව පවතින අකාර්යක්ෂම ආරක්ෂණ විධිවිධාන හා එම කාලය තුළ ඔවුන්ගෙන් ලබා ගැනෙන පාපොච්චාරණ සම්බන්ධයෙන් ගැටළු පැන නගින අතර සාධාරණ නඩු විභාගයකට චූදිතයාට ඇති අයිතිය උල්ලංඝනය වේ. නඩු විභාගය අතරතුර දී පවා විවිධ ප්‍රමාදයන් හා නඩු විභාගයේදී මුහුණ දෙන භාෂාමය ගැටළු ආදිය නිසා සාධාරණ නඩු විභාගයකට තමන්ට ඇති අයිතිය අහිමි වන බව හා අර්බුදවලට මුහුණදීමට සිදුවන බව මෙම රැඳවියෝ පැමිණිලි කළහ.

## 16. තරුණ වරදකරුවන්

වයස අවුරුදු 15ට වැඩි තරුණ වරදකරුවන් වැඩිහිටි බන්ධනාගාරවල රඳවා තැබෙන බවත් එය අවුරුදු 18ට අඩු සියලු දෙනා ළමයින් ලෙස සැලකිය යුතු බවට වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට එරෙහිව යන බවත් කොමිසමට අනාවරණය විය. සත්‍ය වශයෙන් නම් මොවුන් වයස අවුරුදු 18ට වැඩි වැඩිහිටි සිරකරුවන් සමග වැඩිහිටි බන්ධනාගාරවල රඳවා තැබිය නොහැකිය.

වයස අවුරුදු 22 දක්වා වූ තරුණ පුද්ගලයන් වටරැක පුහුණු පාසලේ රඳවා තැබිය හැකිය. එහිදී ඔවුන් දඬුවම් ලබන සිරකරුවන් ලෙස නොසැලකෙන අතර සමාජ විරෝධී චර්යාවන් මර්දනය කරමින්

පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහනක් ලෙස අවුරුදු 3ක් දක්වා වූ "පුහුණුවකට" සහභාගී වීම අපේක්ෂා කෙරේ. වටරැක පුහුණු පාසල පිහිටන්නේ හෝමාගම වැඩ කඳවුර තුළ වුවද මෙහි තරුණ වරදකරුවන් මුළුමනින්ම වැඩිහිටි වරදකරුවන්ගෙන් වෙන් කොට තැබේ. වයස අවුරුදු 18 ත් 22 ත් අතර වරදකරුවන් සංවෘත බන්ධනාගාර මෙන් ම විවෘත කඳවුරු තුළ ද දක්නට ලැබේ. එයට හේතුව අදාළ වරදකරු වටරැක "පුහුණුව" සඳහා යැවීමට හෝ සංවෘත බන්ධනාගාරයක දඬුවම් විඳීමට තීන්දු කිරීම නඩු විභාග කරන විනිසුරුවරයාගේ මනාපය පරිදි සිදුකළ හැකි හෙයිනි.

වටරැක පුහුණු පාසලෙහි චර්යාත්මක ගැටළු සම්බන්ධ විශේෂඥ නිලධාරීන් හා තරුණයන් පුනරුත්ථාපනය කෙරෙහි දිරිගන්වමින් කටයුතු කරන වෘත්තීය මාර්ගෝපදේශකයන්ගේ හිඟයක් පවතී. ඒ වෙනුවට විනය ආරක්ෂා කිරීම හා දඬුවම් කිරීම සඳහා මෙම තරුණ වරදකරුවන් කෙරෙහි ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන ආකාරය දැකගත හැකිය. රැඳවියන් හා නිලධාරීන් අතර වන මේ අර්බුදකාරී සම්බන්ධය නිසා තරුණ වරදකරුවෝ තමන්ට මුහුණ පෑමට සිදුවන හිංසනයන් පිළිබඳ පැමිණිලි කිරීමට මැළි වන්නේ තව තවත් හිංසා සිදුවේය යන බිය නිසා ය. වටරැක සිටින තරුණ වරදකරුවන් දඬුවම් ලබන සිරකරුවන් සේ නොසැලකිය යුතු බවට සඳහන් වුවද ඔවුන් කිහිපදෙනෙකු බැගින් සිර කුටිවල රඳවා තැබෙන අතර රාත්‍රියේදී ශරීර කෘත්‍ය සඳහා සිර කුටිය තුල ඇති ප්ලාස්ටික් බාල්දියක් භාවිත කිරීමට සිදුවේ. මොවුනට ඉරිදා හැර සතියේ අනෙකුත් දින කිහිපයක සීමිත කාල සීමාවක් පමණක් එළිමහනේ කාලය ගත කිරීමට අවස්තාව ලැබෙන අතර එය ඔවුන්ගේ කායික හා මානසික සංවර්ධනය කෙරෙහි බාධා පමුණුවයි.

වටරැක පුහුණු පාසල තුළ පිහිටි සුනිත පාසලෙන් මෙම තරුණ වරදකරුවන් හට සිය ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අවස්තාව සලසා දී තිබේ. මෙහි 9 ශ්‍රේණියේ සිට උසස්පෙළ දක්වා පන්ති පැවැත්වේ. බොහෝ තරුණ වරදකරුවන්ගේ දිළිඳු පවුල් පසුබිම හේතුවෙන් ඔවුනට 9 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ  අවස්ථාවද නොලැබී ගොස් ඇති බව අධිකාරිවරයා පෙන්වා දුන්නේය. එහි පවතින වෘත්තීය පුහුණු පාඨමාලාවන් හි හිඟබව නිසා නිදහස ලබන විට ඔවුනට ප්‍රයෝජනවත් පුහුණුවක් ලැබීමේ අවස්තාව ද ගිලිහී යයි. කෙසේ වෙතත් තම ජීවිතවල මේ වන විට ඇති එකම සාමාන්‍ය කාර්යය පාසලට යාම බව මේ තරුණයෝ කොමිසමට පැවසූහ. සිය පවුල්වලින් වෙන් ව ගෙවන කටුක ජීවිතයේදී ඔවුනට තාවකාලික සහනයක් හෝ ලැබෙනුයේ මේ පාසල් ගමනින් පමණි.

වටරැක කඳවුරෙහි පවතින තත්වයන් හේතුවෙන් තව දුරටත් උත්සන්න වන මේ තරුණයන්ගේ චර්යාමය හා මානසික ගැටළු පිළිබඳව කොමිසමට කරුණු අනාවරණය විය. උදාහරණ ලෙස, බොහෝ තරුණයන් තමන්ට ම හානි පමුණුවාගන්නා බවත් එසේ කරනු හසු වූ විට ඊට අවශ්‍ය වෛද්‍ය හා මානසික ප්‍රතිකාර, උපදේශනය සපයනු වෙනුවට ඔවුනට පහර කෑමට සිදුවන බවත් කොමිසමට දැනගන්නට ලැබිණ. වටරැක දී යම් යම් වරද කොට හසුවන රැඳවියන් පල්ලන්සේන තරුණ විශෝධන මධ්‍යස්ථානය වෙත මාරු කෙරෙන අතර එහිදී ඔවුන් දඬුවම් ලබන සිරකරුවන් ලෙස සැලකේ.

බාල වයස්කාර රිමාන්ඩ් රැඳවියන් වැඩිහිටියන් වෙනුවෙන් වෙන් කළ රිමාන්ඩ් හා සංවෘත බන්ධනාගාරවල රඳවා තැබෙන බව කොමිසමට තොරතුරු ලැබුණි. මොවුන් තරුණ වරදකරුවන්ට වෙන් වූ වාට්ටුවල රඳවන අතර ඇතැම් විට මේවායේ වයස අවුරුදු 22 දක්වා වූ වැඩිහිටි රැඳවියන් ද සිටිති. මෙම රැඳවියන් ට ද වටරැක සිටින රැඳවියන් හා සමාන සැලකුම් ලැබේ. ඔවුනට අවශ්‍ය නීති සහාය, උපදේශනය හෝ නිදහස ලැබීමෙන් පසු අවශ්‍ය සහයෝගය ආදී කිසිවක් නොලැබේ. රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින වැඩිහිටි රැඳවියන් සමග මොවුන්ගේ සම්බන්ධතා වැළැක්වීම සඳහා එක වාට්ටුවකට සියලු දෙනා කොටු කිරීමත් එළිමහනේ ගත කිරීමට ලබාදෙන කාලය සීමා කිරීමත් සිදුවේ. පිරිසිදු වාතාශ්‍රය, ක්‍රීඩා හා ව්‍යායාම වෙනුවෙන් මෙසේ අවම කාලයක් ලැබීම මොවුන් අතර කලහයන් ඇතිවීමට ප්‍රධාන හේතුවක් බව තරුණ රැඳවියෝ පැමිණිලි කළහ.

බාල වයස්කාර පුද්ගලයන් වැඩිහිටියන් සමග එකම බන්ධනාගාරයක රැඳවීම තුළින් ඔවුන් බන්ධනාගාරය තුළදී අපරාධකාරී චර්යාවන්ට නිරාවරණය වීම හරහා අපරාධවලට පසුව යොමු වීමේ

ප්‍රවණතාවයක් ඇති වේ. එසේම බන්ධනාගාරගතවීම හේතුවෙන් ඇතිවිය හැකි සමාජමය අපකීර්තිය පසුකාලීන ව ඔවුනගේ ජීවිතවලට ලැබෙන අවස්ථා කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. කිසිදු වෙන් කිරීමක් නොමැති කාන්තා බන්ධනාගාරවල මෙම තත්වය වඩාත් බරපතල වේ.

17. විදේශිකයන්

ශ්‍රී ලාංකික බන්ධනාගාර පද්ධතිය තුල සිටින විදේශිකයන් ද දේශීය සිරකරුවන් හා සමාන දුෂ්කරතාවලට මුහුණ දෙති. එහෙත් පවුලෙන් ලැබෙන සහාය නොලැබී යාම මෙන්ම භාෂාමය හා සංස්කෘතිකමය බාධාවන් හේතුවෙන් ඔවුන්ගේ ගැටළු තවදුරටත් උත්සන්න වේ. සාමාන්‍යයෙන් විදේශිකයෝ ඉතා දිගු කාලයක් රිමාන්ඩ් භාරයේ සිටිති. මෙසේ දිගුකාලයක් රිමාන්ඩ්ගත ව සිටීම සිය වරද පිළිගැනීමට පූර්ව නිමිත්තක් වන්නේ අනියත කාලයක් පුරා රිමාන්ඩ් භාරයේ සිටිනු වෙනුවට නිශ්චිත තීන්දුවක් ලැබීම යහපත් බැවින් අධිකරණ ක්‍රියාදාමය කඩිනම් කරනු වස් ඔවුන් වරද පිළිගන්නා බැවිනි.

ප්‍රධාන වශයෙන් ලංකාවේ අපරාධ අධිකරණමය ක්‍රියාවලිය සිංහල මාධ්‍යයෙන් ක්‍රියාත්මක වන බැවින් විදේශිකයෝ බොහෝ භාෂාමය බාධාවන් වලට මුහුණ දෙති. අධිකරණයේදී භාෂා පරිවර්තකයන් ඉල්ලුම් කිරීම නඩු විභාගය වසර දෙකක පමණ කාලයකින් ප්‍රමාද කරවන බවත් එම කාලය තුළ ඔවුන්ගේ ඉංග්‍රීසි හා සිංහල භාෂා දැනුම වර්ධනය වන බැවින් අවසානයේදී පෙර ඉල්ලීම ඵල රහිත වන බවත් ඔවුහු කොමිසමට දැනුම් දුන්හ.

විදේශිකයන් හමුවීමට පවුලේ සාමාජිකයන් නොපැමිණෙන බැවින් සිය සනීපාරක්ෂක ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ඔවුනට දේශීය රැඳවියන් මත යැපීමට සිදුවේ. බන්ධනාගාරය මගින් විදේශිකයන් හට එම රටවල පුද්ගලයන් හා සන්නිවේදනය කිරීමට අවස්තාව ලබා නොදෙන බැවින් ඔවුන් මුළුමනින්ම පාහේ සිය පවුල්වලින් වෙන් වෙති, මුදල් ලබාගැනීමට ද අවස්තාව ඔවුනට අහිමි වේ. සෑම විදේශිකයෙකුම සිය පීඩාවන්ට බලපාන ප්‍රධානතම හේතුව ලෙස ඉදිරිපත් කළේ තම පවුල් සමග සම්බන්ධතාවයක් පැවැත්වීමට නොහැකි වීමයි.

භාෂාමය ගැටළු හේතුවෙන් තමන්ට බන්ධනාගාර නිලධාරීන් හා සන්නිවේදනය කළ නොහැකි බවත්, විදේශිකයන් හා අනෙකුත් රැඳවියන් අතර ගැටුමක දී දේශීය රැඳවියන් ඉදිරිපත් කරන පැහැදිලි කිරීම නිලධාරීන් වැඩි වශයෙන් භාරගන්නා බවත් මොවුහු පැමිණිලි කළහ. මෙයට හේතුව විදේශිකයන් හට ඔවුන්ගේ පාර්ශ්වයෙන් පැහැදිලිව කරනු ඉදිරිපත් කළ නොහැකි වීමයි. සිය ජාතිකත්වය හේතුවෙන් තමන් කළ වරද වෙනුවෙන් බන්ධනාගාර නිලධාරීන්ගේ, රැඳවියන්ගේ හා වෛද්‍ය නිලධාරීන්ගේ පවා ගර්හාවට ලක් වීම හා වෙන් කොට සැලකීම පිළිබඳව විදේශිකයෝ විස්තර කළහ.

දේශීය අධිකරණ ක්‍රියාදාමය හා නීතිඥවරුන් පිළිබඳ තොරතුරු නොදන්නා බැවින් විදේශිකයන් හට නීති සහාය ලබාගැනීමේදී සීමාවන් පැනවේ. බොහෝ විදේශිකයෝ ප්‍රමාණවත් පසුබිම් තොරතුරු රහිතව සේවය ලබාගැනීමට සිදුවූ නීතිඥයන්ගෙන් තමන්ට සිදු වූ වංචාවන් පිළිබඳ පැමිණිලි කළහ. බන්ධනාගාරය තුළ සිට නීතිඥයන් හා සන්නිවේදනය කිරීමට නොහැකිවීම හා බැහැර සිට තමන්ට සහාය වීමට පවුලේ සාමාජිකයන් නොමැති වීම හේතුවෙන් තවදුරටත් පවතින තත්වය උත්සන්න වෙයි. කොමිසමට හමු වූ බොහෝ විදේශික රැඳවියෝ සිය පවුල්වලට සමීපව සිටිමින් දඬුවම නිම කිරීම හා නිදහසින් පසු නැවත සමාජගත වීමේ පහසුව නිසා සිය රටවලට පිටුවහල් කරනු දැකීමට වඩා කැමැත්තෙන් සිටිති. කෙසේවෙතත්, පිටුවහල් කිරීමේ ක්‍රමවේදය අතිශයින් නිලධාරිවාදී වන බැවින් පවතින දේශපාලනික වාතාවරණය අනුව ප්‍රමාදයන් හා බාධාවන් ඇති වීමේ ප්‍රවණතාවයක් පවතී.

18. කාන්තාවන්

බන්ධනාගාරවල කාන්තා ජනගහනය සැලකිය යුතු තරම් පහළ මට්ටමක පවතී. ඔවුනට පුරුෂ රැඳවියන් හා සමාන මට්ටමේ විශෝධන සේවාවන් නොසැපයීමට හේතුව ද එය විය හැකිය. සිරගතව සිටින කාලය තුළ කාන්තාවන්ට ලිංගිකත්වය මත පදනම් වූ ගැටළු ද පැනනගින අතර එය ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානයට යොමු විය යුතුය.

බන්ධනාගාරගතව සිටින කාන්තාවන්ට පුනරුත්තාපන අවස්ථා හිමිවනුයේ අවම වශයෙනි. ඔවුනට විවීම හා කෘෂිකර්මය වැනි කර්මාන්තමය වැඩ සඳහා සහභාගී වීමට හෝ වැඩ සඳහා බැහැර යාමේ ක්‍රමවේදයට ඇතුළු වීමටද වස්තාවක් නොමැත. ඒ වෙනුවට මූලික වශයෙන් ඔවුනට ලැබෙන්නේ ඇඳුම් මැසීම හා පරිශ්‍රයේ පිරිසිඳුබව රැක ගැනීම පිළිබඳ කාර්යයන් ය. යම් හෙයකින් කාන්තාවන් හට විවිධ පරාසවල පැතිරුණු වැඩවල නිරතවෙමින් වෘත්තිය පුහුණුව ලැබීමේ අවස්ථාවක් හිමිවූයේ නම් නිදහස ලැබීමෙන් පසුව වඩාත් හොඳ රැකියා අවස්ථා උත්පාදනය වනු ඇත.

බාහිර සංවිධානයකින් පරිත්‍යාගයක් කළහොත් මිසක බන්ධනාගාරය මගින් බෙදාහැරීමක් නොකෙරෙන බැවින් තමන්ට ප්‍රමාණවත් තරම් සනීපාරක්ෂක තුවා නොලැබෙන බවටද කාන්තා රැඳවියෝ පැමිණිලි කළහ. රිමාන්ඩ් භාරයේ සිටින කාන්තාවන්ට පවුලේ සාමාජිකයන් හමුවන අවස්ථා වලදී මෙම සනීපාරක්ෂක තුවා සපයාගත හැකි වුවද සිර දඬුවම් විඳින කාන්තාවන් හා විදෙස් කාන්තාවන් හට ඒවා ලබාගැනීම සඳහා ප්‍රමාණවත් තරම් සනීපාරක්ෂක ද්‍රව්‍ය සපයාගත හැකි වෙනත් රැඳවියන්ගේ පිඟන් හා ඇඳුම් සේදීම වැනි කාර්යයන් හි දීමට සිදුවේ.

බොහෝ බන්ධනාගාරවල කාන්තා අංශයන්හි බන්ධනාගාර රෝහල් නොමැති බැවින් හා වෛද්‍යවරුන් කාන්තා අංශ කරා පැමිණෙන්නේ නිශ්චිත දින හා කාලවල පමණක් බැවින්ද ඉන් පිටස්තර වේලාවලදී ඔවුන් සම්බන්ධ කරගත නොහැකි බැවින්ද තමන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් නොලැබෙන බවට ඔවුහු පැමිණිලි කළහ. එහි ප්‍රතිපලයක් ලෙස රාත්‍රී කාලයේදී වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ හැකියාව ඉතා සීමිත වන අතර මෙම කාන්තාවන්ට නැවතත් වෛද්‍යවරයා පැමිණෙන තුරු රෝගයෙන් පීඩා විඳිමින් සිටීමට සිදුවේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අනුව කාන්තා සෞඛ්‍ය සේවක අයදුම්පත්‍ර අතළොස්සක් පමණක් ලැබෙන බැවින් බන්ධනාගාර සෞඛ්‍ය පද්ධතියේ කාන්තා සෞඛ්‍ය සේවක හිඟයක්ද පවතී. මෙයට හේතුව කාන්තාවන් බන්ධනාගාරයක සේවය කිරීමට ඇති අකමැත්ත විය හැකිය.

මව්වරුන්ට තම වයස අවුරුදු 5 ට අඩු දරුවන් ඔවුන් සමග බන්ධනාගාරය තුළ රඳවා ගැනීමට අවසර ලැබේ. කෙසේවෙතත්, මෙම දරුවන්ට සෞඛ්‍ය සම්පන්න වර්ධනයක් සඳහා අවශ්‍ය පහසුකම් වන සුදුසු පෝෂ්‍යදායි ආහාර, පෙරපාසල් පහසුකම්, සෙල්ලම් බඩු හෝ පොත්පත් වැනි දෑ හිමි නොවේ. කාර්ය සම්පාදන ගැටළු හේතුවෙන් මෙම දරුවන් ළමා රෝග පිළිබඳ වෛද්‍යවරුන් වෙත වරින් වර ගෙන යාමේ අවස්ථා ද අහිමි වේ.

## 19. අබාධ සහිත සිරකරුවන්

බන්ධනාගාර පද්ධතිය තුළ දක්නට ලැබෙන වඩාත් අවදානමට හා අවාසිදායක තත්වයනට මුහුණ දෙන කණ්ඩායම්වලින් එකක් වන්නේ ආබාධ සහිත සිරකරුවන් ය. ඊට මූලික හේතුව ආබාධ සහිත වූවන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් බන්ධනාගාර තුළ නොපැවතීමයි. රෝගාබාධ හා සංචලනයේ අපහසුතා නිසා වයස්ගත සිරකරුවන් ද ආබාධිත සිරකරුවන් හා සමානව ම ගැටලුවලට මුහුණ දෙන බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය.

බන්ධනාගාර රෝහල්වල හා වාට්ටුවල අබලන් වූ හා අත්වාරු රහිත පියගැටපෙළ බහුලව දැකගත හැකිය. ශරීරයේ පහළ කොටසෙහි ආබාධ සහිත සිරකරුවෝ දිනපතා ඉතාමත් මූලික කාර්යයන් වන වැසිකිළි භාවිතය වැනි කටයුතුවලදී තමන් මුහුණදෙන අපහසුතා පිළිබඳ පැමිණිලි කළහ. එයට හේතුව

බොහෝ බන්ධනාගාරවල ඇත්තේ මුත්‍ර කුටි හා උක්කුටිකයෙන් වාඩි වී භාවිත කළ යුතු වැසිකිළි පමණක් වීමයි. මෙවන් සිරකරුවන් හට සිය මූලික අවශ්‍යතාවන් ඉටුකරගැනීම සඳහා මුළුමනින්ම තම වාට්ටුවල සාමාජිකයන්ගේ හොඳ හිත මත යැපීමට සිදුවේ.

දරාගත නොහැකි බන්ධනාගාර සෞඛ්‍ය සේවා පද්ධති වියදම් හේතුවෙන් කාලානුරූපව වයස්ගත සිරකරුවන් තුළ මතුවන රෝගාබාධ සඳහා සුදුසු වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම ඉතා අසීරු කටයුත්තක් බවට පත්ව තිබේ. සාමාන්‍යයෙන් බන්ධනාගාරයට රෝද පුටු, ව්‍යාජ පාද හා සුදු සැරයටි වැනි ආබාධිත සහාය උපකරණ රැඳවියන්ට සැපයීමට නොහැකිය. ඒවා හිමිවන්නේ විවිධ පරිත්‍යාගයන් තුළින්ම පමණි.

රැඳවියකුගේ කායික හා මානසික දුබලතා හේතුවෙන් සානුකම්පිත හේතු මත සමාව ලබාදීමේ කාර්යය සිදුකරන වෛද්‍ය සභාව රැස්වන්නේ කලාතුරකින් බව කොමිසම වෙත දන්වා සිටින ලදී. මේ ක්‍රමවේදයෙදී අදාළ රැඳවියා වෙනුවෙන් ඉදිරිපත් කරන ඉල්ලීම සෞඛ්‍ය අමාත්‍යාංශයට යොමු කිරීමෙන් පසුව ඔහුගේ හෝ ඇයගේ තත්වය මත ඊට අදාළ විශේෂඥයකුගෙන් සමන්විත වෛද්‍ය සභාව රැස්කෙරේ. මේ වන විට මෙම වෛද්‍ය සභාව රැස් නොවීමට හේතු වී ඇත්තේ එසේ රැස් වීමට ඒකක තුනක් අතර සිදුවිය යුතු සම්බන්ධීකරණ හා සහාය කටයුතු හේතුවෙනි. එම ඒකක වන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශයයි. උදාහරණ ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් වෛද්‍ය සභාව රැස් කිරීම සඳහා ඔවුන් අනුගමනය කළ යුතු එකිනෙකට වෙනස් ක්‍රමවේදයන් දෙකක් පිළිබඳව කොමිසමට කරුණු දැක්වූයේ ඒ සම්බන්ධ පැහැදිලි ක්‍රියා පටිපාටියක් නොමැති බව පෙන්වා දෙමිනි. පරස්පර විරෝධී රාජකාරි හා අසාර්ථක සන්නිවේදනය හේතුවෙන් නැවත නැවතත් ඉල්ලීම් සිදුකළද සුදුසුකම් සහිත රැඳවියන් විශේෂඥයන්ගෙන් සෙබ් සභාවක් වෙත ඉදිරිපත් කිරීම සිදු නොවේ.

# IV කොටස : බන්ධනාගාර කළමනාකරණය

20. බන්ධනාගාර පරිපාලනය මුහුණ දෙන අභියෝග

දිවයින පුරා ඇති සියලු බන්ධනාගාරවල පරිපාලකයන් විසින් දෛනික රාජකාරි, රැඳවියන්ට සැපයිය යුතු සේවා හා බන්ධාගාර නිලධාරීන්ගේ සුබසාධනය කෙරෙහි උග්‍ර ලෙස බලපාන බරපතල සේවක හිඟය පිළිබඳව පැමිණිලි කරන ලදී.

කාලානුරූපව සිරකරුවන්ගේ ප්‍රමාණය ඉහළ ගියද නිලධාරි සේවක සංයුතිය ඊට අනුරූපව සංශෝධනය වීමක් සිදුනොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස රැඳවියන්ට සාපේක්ෂව නිලධාරීන්ගේ අනුපාතය ඉතා පහළ මට්ටමක පවතී. සේවක හිඟය හේතුවෙන් තනි නිලධාරියකුට විවිධ භූමිකා නිරූපණය කිරීමට, දීර්ඝ සේවා මුරවල යෙදීමට හා ඒක දිගට සේවා මුර කිහිපයක් රාජකාරි කිරීමට සිදුවේ. මෙය බන්ධනාගාර කාර්යක්ෂම ලෙස පාලනයට බරපතල අන්දමින් බලපාන අතර ආරක්ෂාව පිළිබඳව ද ගැටළු මතු වේ. රැඳවියන් රෝහල්වලට මාරු කිරීම, බලපත්‍ර මඩුලු ක්‍රමවේදය හා රැඳවියන්ට එළිමහනේ ගතකිරීමට ඇති කාලය අවම වීම වැනි කාර්ය පටිපාටි ප්‍රමාදයන් ඇති වීමට ප්‍රධානතම හේතුව මෙයයි.

හඳුන්වාදීමේ පුහුණුවකට යටත් කෙරුණද සේවා කාලය තුළ නිදහස් කළ නොහැකි බැවින් බන්ධනාගාර නිලධාරින් වෙත ලැබෙන පුහුණුව ප්‍රමාණවත් නොවන බව ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අදහසයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දීර්ඝ සේවා කාලයක් හිමි, හඳුන්වාදීමේදී ගිනි අවි පුහුණුව ලද නිලධාරියෙකුට හදිසි අවස්ථාවකදී අවශ්‍යතාවය අනුව ආරක්ෂාකාරීව ප්‍රතිචාර දැක්විය නොහැකි වනු ඇත.

නිලධාරීන්ට හිමිවන වත්මන් වැටුප අනුව සිය පවුල් පෝෂණය කළ නොහැකි බව බන්ධනාගාර නිලධාරීහු කොමිසමට දන්වා සිටියහ. දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් හා වැටුප් සංශෝධනයක් මේ වනතෙක් සිදුකර නොමැති බැවින් බොහෝවිට නිලධාරීන්ට අතිකාල දීමනා ගෙවීම ද සිදු නොවේ. දෛනිකව රාජකාරියේදී මුහුණ දෙන අවදානම හා ජීවිතවලට ඇති තර්ජනය ඔවුනට ලැබෙන වැටුප හා දීමනා තුළින් පෙන්වුම් නොකෙරේ. ආතතිකාරී රාජකාරි පරිසරය, දීර්ඝ සේවාමුර හා අඩු වැටුප් හේතුවෙන් බන්ධනාගාර නිලධාරීහු රැකියාව පිළිබඳ අතෘප්තිය හා දැඩි වෙහෙසින් පීඩාවට පත්ව සිටිති. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුහු බොහෝ අවස්ථාවලදී මානසික ගැටළු පිළිබඳ රෝග ලක්ෂණ පෙන්වූවද ඊට අවශ්‍ය උපදේශනය හෝ වෛද්‍ය ප්‍රතිකාර නොලැබී යයි. නිලධාරීන්ගේ නවාතැන්, විශේෂයෙන් අවිවාහක නිලධාරි නිල නිවාසවල තත්වය පිළිබඳ පැමිණිලි ද ලැබුණු අතර මෙය ද ඔවුනගේ සේවා අතෘප්තිය තව තවත් උත්සන්න කරවයි.

විශේෂයෙන් කාන්තා නිලධාරීහු තම රැකියාව හේතුවෙන් පවුල් ජීවිතයට ඇතිවන බලපෑම පිළිබඳව සඳහන් කළහ. එයට හේතුව ඔවුන් සිය පවුලට ලබා දිය යුතු අවධානය හා කාලය විශේෂයෙන් නිවෙසින් දුරබැහැර ප්‍රදේශවල සේවයට අනුයුක්ත කර ඇති විට ලබාදීමට අසමත් වීමයි. කාන්තා නිලධාරීහු සේවා ස්ථානයේදී තමන් මුහුණ දෙන ලිංගික හිංසනයන් පිළිබඳව ද සාකච්ඡා කළ නමුත් සේවා සුරක්ෂිතතාවයට හානි පැමිණෙන පරිදි විපාකවලට මුහුණ දීමට සිදුවේය යන බිය නිසා ඒවාට පිළියම් සෙවීමට මැළිකමක් දැක්වූහ.

විවෘත හා වැඩ කඳවුරුවල සේවය කරන නිලධාරින් සාපේක්ෂව යහපත් තත්වයක සිටින බව කොමිසමට නිරීක්ෂණය කළ හැකි විය. එයට හේතුව එම කඳවුරු නගරයෙන් බැහැර විවෘත පරිශ්‍රයන් තුළ පිහිටා තිබීමයි. කඳවුරු තුළ සාමාන්‍යයෙන් තදබදයක් නොමැති අතර දඬුවම් ලබන සිරකරුවන් සිටින බැවින් ඔවුනට අධිකරණ රාජකාරිවල බර පැටවීමක් ද සිදු නොවේ. බන්ධනාගාර නිලධාරින් රැඳවියන්ට සලකන

ආකාරය කෙරෙහි ඔවුනගේ රාජකාරි පරිසරය, පෞද්ගලික ගැටළු හා ආතතිකාරි මානසික මට්ටම තීරණාත්මක සාධකයක් වන බව ජ්‍යෙෂ්ඨ නිලධාරීහු නැවත නැවතත් පෙන්වා දුන්හ.

# V කොටස : අපරාධ යුක්ති ක්‍රමවේදය

## 21. අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීම

පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකලාපය මෙම අධ්‍යයනයේ අරමුණක් නොවුවද සිරකරුවන් විශාල ප්‍රමාණයකගෙන් පොලිස් රැඳවුම් භාරයේ සිටියදී ඔවුනට සිදුවූ අසාධාරණකම් පිළිබඳ පැමිණිලි ගණනාවක් කොමිසමට ලැබුණි. එම පැමිණිලි පහත දැක්වෙන පරිදි වන අතර ඒ පිළිබඳ තව දුරටත් විමර්ශනයට ලක් කළ යුතු වේ.

මේ අතරින් පැමිණිලි ගණනාවක ම ඇතුළත් වූයේ පොලිස් නිලධාරින් අත්අඩංගුවට ගැනීම්වලදී නිසි ක්‍රමවේදය අනුගමනය නොකළ බවට වන අතර විශේෂයෙන් අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හේතු හෝ වරෙන්තුවක් ඉදිරිපත් නොකිරීම හා පොලිස් භාරයේ සිටියදී පවුලේ සාමාජිකයන් සමග හෝ නීතිඥවරුන් සමග සම්බන්ධ වීමට අවස්ථාව නොදීම මින් ප්‍රධාන වේ. තමන්ට එරෙහිව ඉදිරිපත් කරන චෝදනා පිළිබඳව පළමු වරට දැනුවත් වූයේ අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී බව ඇතැම් රැඳවියෝ ප්‍රකාශ කළහ. මහේස්ත්‍රාත්වරයෙකුට ඉදිරිපත් කිරීමට පෙර පොලිස් රැඳවුම් භාරයේ තබා ගත හැකි උපරිම කාලය වූ පැය 24ක කාලය ඉක්මවමින් ඔවුනට රැඳවුම් භාරයේ සිටීමට සිදු වූ බව ද රැඳවියෝ පැමිණිලි කළහ. මෙම ක්‍රියාව පොලිස් වාර්තාවල හෝ අධිකරණ ලියවිලිවල දින දාතම වෙනස් කිරීම මගින් සිදු වූ බවද ඔවුහු චෝදනා කළහ.

විශාල රැඳවියන් පිරිසක් තමන්ට හිස් කඩදාසියක අත්සන් තැබීමට බල කෙරුණු බවද පසුව එම කඩදාසියෙහි පොලිස් නිලධාරින් විසින් පාපොච්චාරණයක් ලිවීම හෝ යතුරුලියනය කිරීම සිදු කළ බවද එහි ඇතුළත් වන තොරතුරු කිසිවක් රැඳවියන්ට දැනගැනීමට නොහැකි වූ බවද පැමිණිලි කළහ. ඔවුන් පොලිසියට අවශ්‍ය පරිදි ප්‍රකාශයන් සිදුකිරීම ප්‍රතික්ෂේප කළ විට ශාරීරික ප්‍රචණ්ඩත්වය පිළිබඳ බලපෑම් හෝ තර්ජන සිදුකිරීම, රැඳවුම් භාරයේදී ආහාර ලබා නොදීම, ඇප නියම නොකරමින් දීර්ඝ කාලයක් රැඳවුම් භාරයේ තබාගැනීම හා ඔවුනගේ පවුල්වල ආරක්ෂාවට තර්ජන පැමිණවීම ආදීයට මුහුණ දීමට සිදුවූ බව රැඳවියෝ චෝදනා කළහ.

අත්අඩංගුවට ගැනීම හා රැඳවුම් භාරයේ තැබීම සම්බන්ධයෙන් නියමිත ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම පිළිබඳව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගැනෙන සිරකරුවන් බොහොමයකගෙන් පැමිණිලි ලැබිණ. සම්මුඛ සාකච්ඡාවලට බඳුන් කෙරුණවුන් පැහැදිලි කළ පරිදි අවශ්‍ය ආරක්ෂක පියවර ගැනීමක් සිදු නොවුණු බව පැහැදිලි වේ. බොහෝ අවස්ථාවලදී තම නිවෙස්, රැකියා ස්ථානවලදී හෝ අතරමගදී පැහැරගැනීමකට ලක් වූ බවත්, පවුලේ සාමාජිකයන්ට අත්අඩංගුවට ගැනීම පිළිබඳ ලියවිල්ලක් හෝ රඳවා ගැනෙන ස්ථාන පිළිබඳ කිසිදු තොරතුරක් හෝ ලබා නොදුන් බවත්, අවසර නොලත් ස්ථානවල ඔවුන් රඳවා ගැනුණු බව හා වධ හිංසනයට ලක් කරමින් තමන් නොදන්නා භාෂාවකින් ලියවුණු පපොච්චාරණයන්ට අත්සන් තැබීමට බල කෙරුණු බවත් ඔවුහු ප්‍රකාශ කළහ. අත්අඩංගුවට පත්වීමෙන් පසු දින, සති හෝ ඇතැම් විට මාස ගණනාවක් පුරා පවුල හෝ නීතිඥවරුන් සමග සම්බන්ධ වීමට ඔවුනට අවසර ලබා නොදුන් අතර ඇතැම් අවස්ථාවලදී අත්අඩංගුවට ගැනීමෙන් මාස ගණනක් යන තුරු එසේ අත්අඩංගුවට ගත් බව පවුලට දැනුම් දීමක් පවා සිදුකර නොමැත. රැඳවියාගේ අර්ථසාධනය පිළිබඳ නීතිමය නියාමනයකින් තොරව මෙසේ දීර්ඝකාලීනව හුදකලා රැඳවුම් භාරයේ තැබීම හරහා කායික පීඩනය හේතුවෙන් පාපොච්චාරණ ලබාදෙන තත්වයට ඔවුහු පත්වෙති. නීතිමය වශයෙන් පනවා ඇති මාර්ගෝපදේශ හා ආරක්ෂණ නියාමන තිබියදී පවා අත්අඩංගුවට ගැනීමේ බලධාරීන් පිළිබඳ නියාමනයක් හෝ වගවීමේ යාන්ත්‍රණයක් නොමැති කල් හි හා

කාර්යක්ෂම අධිකරණමය නියාමනයක් නොමැති කල් හි ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනෙන්නවුන්ගේ අර්ථසාධනය පිළිබඳ අපට බලාපොරොත්තු තැබිය නොහැකිය.

කාන්තාවන් අත්අඩංගුවට ගැනීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රවණතා කිහිපයක් දැකිය හැකිය. අත්අඩංගුවට ගැනෙන හෝ පොලිසිය වෙත ප්‍රවාහනය සිදුවන අවස්ථාවේදී එහි කාන්තා පොලිස් කොස්තාපල්වරියන් නොවූ බවට බොහෝවිට පැමිණිලි ලැබේ. එමෙන්ම කාන්තාවන් රාත්‍රිය පහන් වන තුරු පොලිස් ස්ථානයේ රඳවා තැබෙන අවස්ථාවල ද එහි පොලිස් කොස්තාපල්වරියන් නොවූ බවටද චෝදනා ඉදිරිපත් කෙරේ. අත්අඩංගුවට ගැනීම් අතරතුර මත්ද්‍රව්‍ය පිළිබඳ සෝදිසියේදී කාන්තා පොලිස් කොස්තාපල්වරියන් ආක්‍රමණකාරී ලෙස සිය ශරීර ස්පර්ශ කළ බවට කාන්තාවන් ගණනාවක් පැමිණිලි ඉදිරිපත් කළහ. එමෙන්ම තමන් පොලිස් නිලධාරින් අතින් ලිංගික අතවරයට ලක් වූ බවට ද කාන්තා රැඳවියන් ගණනාවක් විසින් චෝදනා ඉදිරිපත් කරනු ලැබිණ. මෙවන් චෝදනා මගින් පොලිස් භාරයේ සිටියදී කාන්තාවන් මුහුණ දෙන අවදානම් සහගත තත්වය පිළිබඳව මනාව හෙළිදරව් කෙරෙන අතර ඔවුනගේ පෞද්ගලික ආරක්ෂාව හා ආත්මාභිමානය සුරක්ෂිත කිරීමට ආරක්ෂක පියවර ගැනීමෙහි වැදගත්කම ද පෙන්වා දෙයි.

වර්තමානයේදී මෙවන් ප්‍රකාශන හුදු චෝදනාවන් ලෙස පමණක් පවතිද්දී රට පුරා පොලිස් ක්‍රියාකලාපය පිළිබඳව ලැබෙන පැමිණිලිවල රටාවන් හා ප්‍රවණතා, විශේෂයෙන් අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීමේ ක්‍රියාදාමය තුළ අන්තර්ගත වෙතැයි ප්‍රකාශ වන ප්‍රචණ්ඩත්වය අපට නොසලකා හරිය නොහැකි අතර ඒ සම්බන්ධ බරපතල විමර්ශනයක් සිදු කළ යුතුය. තර්ජනයනට යටත්ව ලබාගන්නා පාපොච්චාරණයන් මගින් අපරාධ යුක්ති ක්‍රියාදාමය හා බන්ධනාරෝධනය තුළ විකෘතීන් ඇති කළ හැකි බැවින් ඵලදායි ලෙස අපරාධ මර්දනය කිරීමක්ද ඒ හරහා සිදු නොවේ. එයට අමතරව රැඳවියන් හට පොලිස් නිලධාරීන්ට එරෙහිව පැමිණිලි ඉදිරිපත් කිරීමේ හා බන්ධනාගාරගතව සිටියදී එම පැමිණිලි පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක්ද තිබිය යුතුය.

## 22. නීති සහාය ලබාගැනීමේ හැකියාව

දිළිඳු සමාජ පසුබිම්වලින් පැමිණෙන පුද්ගලයන් සම්බන්ධයෙන් පවතින එක් දුක්ගැනවිල්ලක් වන්නේ ඵලදායි නීතිමය නියෝජනයක් ලබාගැනීමේ නොහැකියාවයි. ඔවුනට මෙම නීති සහාය ලබාගැනීම සඳහා අවශ්‍ය මුදල් සොයාගැනීමට බොහෝ විට තම දේපළ පව විකුණමින් සිය ජීවනෝපාය අනතුරේ හෙළමින් බලවත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවේ. ප්‍රමාණවත් සාක්ෂරතාවයක් නොමැති බැවින් නීතිමය ක්‍රියාදාමය වටහාගැනීමට අපොහොසත් වන පුද්ගලයන් හට තම නීතිඥවරයා පිළිබඳව විශ්වාසය තැබිය නොහැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුනට තමන් වෙනුවෙන් කරුණු දැක්වීමේ අවස්ථාව අවම කෙරෙන අතර එවන් පුද්ගලයෝ වංචනික නීතිඥයන්ගේ ග්‍රහණයට ගොදුරු වෙති.

ශ්‍රී ලාංකික අධිකරණ පද්ධතියේ ස්වභාවය අනුව වසර 20ක පමණ කාලයක් දක්වා දික්ගැස්සිය හැකි නඩු විභාගයන් හේතුවෙන් තව දුරටත් නීතිමය වියදම් දැරිය නොහැකි පුද්ගලයන් ද කොමිසමට හමුවිය. ඒ හේතුවෙන් ඔවුනට රජයෙන් පත්කෙරෙන නීතිඥවරුන් මත යැපීමට සිදුවේ. රජයෙන් පත්කෙරෙන නීතිඥවරුන් සිය වගකීම බරපතල කොට නොසලකන බවටත් රිමාන්ඩ් රැඳවියන් සමග සාකච්ඡා කිරීම සඳහා බන්ධනාගාර වෙත යාම හෝ නඩු විභාගයට පෙර මිනිත්තු කිහිපයකට වඩා රැඳවියා සමග කතා නොකරන බවටත් සාමාන්‍ය මතවාදයක් පවතී. චූදිතයන් සමග කිසිදු සන්නිවේදනයක් නොමැති තරම් වන බැවින් ඔවුනට ප්‍රබල විත්තිවාචකයක් සකස් කිරීමට හැකියාවක් පවතීද යන්න මහත් ගැටලුවකි. නඩු විභාගයේදී නැගී සිට කතා නොකිරීම හා හරස් ප්‍රශ්න නොවිමසීම පිළිබඳ සිරකරුවන් බොහෝවිට පැමිණිලි

කරන්නේ මේ නිසා විය හැකිය. විත්තිකරුට ලැබෙන තීන්දුව කෙරෙහි ඔහුට හෝ ඇයට ලැබෙන නීතිඥ සහාය ඍජු බලපෑමක් ඇතිකරන හෙයින් පහළ සමාජ-ආර්ථික පසුබිම් සහිත චූදිතයන් හට වඩාත් බරපතල තීන්දු ලැබීම කෙරෙහි ඔවුනගේ සදොස් බවට වඩා ඔවුනගේ ආර්ථික තත්වය බලපාන බව පෙනේ. මෙයින් සිදුවන්නේ අපරාධ අධිකරණ පද්ධතියේ අවංකභාවය හා අභිප්‍රාය අවප්‍රමාණ වීමයි.

නීතිඥවරුන් හා රජයේ නීති පාර්ශ්වයන් අධිකරණයේ පෙනීසිටීම නඩු විභාගයේ දිර්ඝතාව කෙරෙහි ඍජුවා බලපායි. යම් නීතිඥවරයෙකු අධිකරණයේ පෙනී නොසිටි කල එම නඩුව වෙනත් දිනයකට කල් දැමේ. අභියාචනා විභාගවලදී මෙම දිනය 6 මසකට හෝ වසරකට පසු දිනයක් විය හැකි අතර එම මුළු කාලයම රැඳවියා බන්ධනාගාරයේ ගත කළ යුතුය. විවිධ අසීරුතා මධ්‍යයේ නීතිඥවරුන් සඳහා මුදල් සොයාගන්නා අවස්ථාවල මෙසේ නීතිඥවරුන් අධිකරණයට නොපැමිණෙන තත්වය වැඩි වශයෙන් දක්නට ලැබේ. එමෙන්ම රැඳවියෙකු අධිකරණය වෙත ප්‍රවාහනය කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම සේවක හිඟයක් සහිත බන්ධනාගාර දෙපාර්තමේන්තුවට මෙන්ම බදුගෙවන්නන්ටද මහත් බරක් වන්නේ ඔවුන් රැගෙන යාමට නිලධාරින් හා බස් රථ වෙන් කළ යුතු වන බැවිනි. ඇතැම් අවස්ථාවල බන්ධනාගාරය පිහිටි නගරයෙන් බැහැර අධිකරණ පිහිටන බැවින් ඔවුනට විශාල දුර ප්‍රමාණයක් හා කාලයක්ද ඒ වෙනුවෙන් ගෙවීමට සිදුවේ. අදාළ පුද්ගලයා අධිකරණයට රැගෙන ඒමෙන් පසු ඔහුගේ නීතිඥවරයා හෝ රජයේ නීතිඥවරයා පැමිණ නොසිටියහොත් ඉන් සිදුවන්නේ විශාල මහජන මුදල් නාස්තියකි.

නීති සහාය පිළිබඳ කොමිසම රිමාන්ඩ් බන්ධනාගාරගත රැඳවියන් හට ඇප ලබාගැනීමට හා ඇප කොන්දේසි අඩුකිරීමට අවශ්‍ය නීතිමය සහාය ලබාදීමේ උත්සාහයන් ගත්තද ක්‍රමානුකූලව බන්ධනාගාර තුළ නීති සායනයන් පැවැත්වීමට, නීති උපදෙස් ලබාදීමට හා ප්‍රාදේශීය බන්ධනාගාරවල සිටින රිමාන්ඩ් රැඳවියන්ට උපකාර කිරීමට ප්‍රමාණවත් තරම් මුදල් ප්‍රතිපාදන තමන්ට නොලැබෙන බව ඔවුහු ප්‍රකාශ කරති. එපමණක් නොව බරපතල අපරාධ පිළිබඳ චෝදනා ලැබූවන්ගේ නඩු විභාග වසර ගණනාවක් පුරා පැවැත්වෙන බැවින් එවන් පුද්ගලයන්ට නීතිමය සහාය ලබාදීමට ද මෙම කොමිසමට හැකියාවක් නොමැත. වර්තමාන කොමිසමෙහි ප්‍රතිපත්තියක් ලෙස මත්ද්‍රව්‍ය පිළිබඳ චෝදනාවලට අත්අඩංගුවට පත් චූදිතයන් හට ඔවුනගේ සහාය ලබා නොදේ.

## 23. නීතිමය හා අධිකරණමය ක්‍රියාවලීන්

බන්ධනාගාර තුළ සිටින නඩු විභාග මෙතෙක් නොපැවැත්වූ රැඳවියන්ගේ අධික ප්‍රමාණයෙන් පෙනී යන්නේ අපරාධ අධිකරණ ක්‍රමවේදයේ දූර්වලතාවයයි. එහිදී යම් අපරාධයකට දඬුවම් නියම නොවූ පුද්ගලයන් ඔවුනගේ නඩු විභාගය අවසන් කෙරෙන තෙක් දීර්ඝ කාලයක් සිරගත කර තැබේ.

මෙසේ රිමාන්ඩ් භාරයේ දිගුකාලිනව රැඳී සිටීමට එක හේතුවක් වන්නේ ඉතා දැඩි ඇප කොන්දේසීන් ය. ඇප ලැබීමට සුදුසුකම් සහිත වුවද ඔවුන් මත පැනවෙන දැඩි ඇප කොන්දේසි හේතුවෙන් බන්ධනාගාරගතව සිටින රැඳවියන් බොහොමයක් කොමිසමට හමුවිය. ඇප කොන්දේසි සපුරාගත නොහැකි රැඳවියන් හට එම කොන්දේසි වෙනස් කරන ලෙස ඉල්ලමින් තමන් වෙනුවෙන් මෝසමක් ගොනු කිරීම සඳහා නීතිඥවරයෙකු බන්ධනාගාරය තුළ සිට සම්බන්ධ කරගැනීමේ අවස්ථාව ද ඇත්තේ ඉතා අල්ප වශයෙනි. විශේෂයෙන් තම පවුල්වලට සමීපයෙන් රඳවා නොමැති පුද්ගලයන් හා විදේශිකයන් ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වීමට නීතිඥවරයෙකු සම්බන්ධ කරගැනීමට නොහැකි වීම නිසා අතිශයින් අසරණ තත්වයකට පත්වෙති.

ඇප ඉල්ලුම් කිරීමට හෝ ඇප කොන්දේසි වෙනස් කිරීමට නීතිමය සහයක් නොමැතිව ඇප ලැබීමට සුදුසුකම් ලද්දවුන් පවා බන්ධනාගාරගතව සිටිති. එබැවින් ඇප ප්‍රතික්ෂේප කිරීම හා සපුරාගත නොහැකි මට්ටමේ ඇප කොන්දේසි පැනවීම බන්ධනාගාරවල තදබදය ඉහළ යාමට සෘජු බලපෑමක් ඇතිකරයි. එමෙන්ම බරපතල අපරාධ පිළිබඳ වාර්තා සහිත පුද්ගලයන්ට සුළු වරද සහිත පුද්ගලයන් නිරාවරණය කෙරෙන ලෙසින් මෙසේ සුළු වරද සහිත පුද්ගලයන් බන්ධනාගාර කිරීම පිළිබඳව ද සියුම් පරීක්ෂාවක් අවශ්‍ය වේ. මෙම අවදානම අවම කරගැනීම සඳහා බන්ධනාගාරගත කිරීමෙන් තොරව ගත හැකි වෙනත් විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව ගවේෂණය කළ යුතුය.

මහේස්ත්‍රාත් අධිකරණයක් මගින් ඇප ප්‍රතික්ෂේප කිරීම හෝ රැඳවුම් නියෝග දීර්ඝ කිරීම සඳහා අදාළ පුද්ගලයා තවදුරටත් බන්ධනාගාරගත කළ යුතුද යන්න පිළිබඳව විනිසුරුවරයෙකු විසින් ප්‍රමාණාත්මක විමර්ශනයක් හා සමාලෝචනයක් කළ යුතුය. කෙසේවෙතත්, ඇප ප්‍රතික්ෂේප කිරීමට හෝ රැඳවුම් නියෝග දීර්ඝ කිරීමට පෙර තමන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබෙන බව බොහෝ රැඳවියෝ කොමිසමට දන්වා සිටියහ. තමන් අධිකරණයේදී කතාකිරීමට ගත් උත්සාහයන් මහේස්ත්‍රාත්වරයා විසින් නොසලකා හැරි බව බොහෝ දෙනා පැමිණිලි කළහ. නඩු විභාගයට පෙර දීර්ඝ කාලීනව රඳවා තැබීම සම්බන්ධව ස්වාධීන හා අපක්ෂපාති අධ්‍යයනයක් සිදු නොකිරීම නිසා එසේ රඳවා තැබීමේ තීරණය ගැන්ම පිළිබඳ සත්‍යවශයෙන් ම තීරකයන් ලෙස  බොහෝවිට ක්‍රියා කරනුයේ පැමිණිලි පාර්ශ්වය හෝ පොලිසියයි.

මිල අධික නීති සේවාවන් ලබාගත නොහැකි හෝ ප්‍රමාණවත් ලෙස නීතිමය ක්‍රියාදාමය අවබෝධ කරගැනීමට නොහැකි පුද්ගලයන් ඔවුනගේ නිදහස පිළිබඳ තීරණ ගැනීමේදී හුදු ප්‍රේක්ෂයෙකුගේ තත්වයට අද වැටේ. තමන්ට එරෙහි චෝදනා වටහාගැනීමට හෝ අධිකරණයේ සිදුවන දේ අවබෝධ කරගැනීමට නොහැකි පුද්ගලයන් හට ප්‍රමාණවත් විත්තිවාචකයක් සූදානම් කරගත නොහැකිය. එපමණක් නොව තමන් නීතිඥවරයාගේ වංචාවන්ට හා දුස්ක්‍රියාවලට ගොදුරු නොවෙමින් එම නීතිඥවරයා වගකීමෙන් බැඳ තැබීමටද මෙම පුද්ගලයෝ අසමත් වෙති. නඩු විභාගයේදී නෛතික ව්‍යවහාරයන් අවබෝධ නොවන හා අදාළ පළාතේ භාෂාව කතා නොකරන පුද්ගලයන් හට එම නඩු විභාග තේරුම්ගත නොහැකි වනු ඇත. මේ සඳහා භාෂා පරිවර්තකයෙකු ඉල්ලුම් කිරීම බලවත් විත්තිවාචකයක් සූදානම් කිරීමේ චූදිතයාගේ හැකියාව වර්ධනය කරනු වෙනුවට නඩු විභාගයන් වසර ගණනාවකට කල් යාමට හේතු වේ.

ඉහත සඳහන් කළ කරුණු සියල්ලෙහිම එකතුවෙන් සමාජයේ අඩු ආදායම් ලැබී ස්ථරයට අයත් පුද්ගලයන් හට ඔවුනට හිමි අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය පැහැරගනු ලබයි. අනවශ්‍ය ප්‍රමාදයන්ගෙන් තොරව නඩු විභාගයක් ලැබීමේ හිමිකම වෙනුවට දීර්ඝ කාලින නඩු විභාගයන්ට මුහුණ දීමට ඔවුනට සිදුවේ. එම මුළු කාලයම බොහෝ පුද්ගලයෝ බන්ධනාගාරගතව සිටිති. මෙසේ නඩු විභාග කල්යාම කෙරෙහි නීතිපති දෙපාර්තමේන්තුවේ හෝ විශේෂයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ද නඩුවලදී රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ පරිපාලනමය ප්‍රමාදයන් හේතුවන බව චොමිසමට නිරීක්ෂණය කළ හැකි විය. ඒ අනුව මෙම පුද්ගල නිදහස අහිමි කිරීම රාජ්‍ය ආයතනවල අකාර්යක්ෂමතාවය හේතුවෙන් සිදුවන බව පැහැදිලිය  එහි වගකීම ඔවුන් දැරිය යුතුය. නිශ්චිත දඬුවම් කාලයක් ලැබීම අනියත රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමකට වඩා යහපත් ලෙස සිතන බැවින් මෙවන් දීර්ඝ නඩු විභාගවලදී හුදෙක් ම එය අවසන් කිරීම සඳහා චූදිතයන් සිය වරද පිළිගත් අවස්ථා පවා වාර්තා වේ.

දඩ මුදල් ගෙවීමට අපොහොසත් වීම, ණය මුදල් නොගෙවීම හා නඩත්තු මුදල් ගෙවීම පැහැරහැරිම හේතුවෙන් සිරගතව සිටින රැඳවියන් බන්ධනාගාරවල තදබදය තවදුරටත් උත්සන්න වීමට තවත් හේතුවකි. බන්ධනාගාරගත කිරීමෙන් තොරව යම් ආදායමක් උපයමින් සිය ණය ගෙවිය හැකි විකල්ප ක්‍රියාමාර්ග

ගැනීම වෙනුවට එවන් පුද්ගලයන් සිරගත කිරීමෙන් පෙනී යන්නේ දිළිඳු පුද්ගලයන් ඔවුනගේ දරිද්‍රතාවය හේතුවෙන් විසමානුපාතික ලෙස බන්ධනාගාරගත කෙරෙන බවයි.

බන්ධනාගාරවල සිට අධිකරණය දක්වා ප්‍රවාහනය කිරීමේදී විශාල රැඳවියන් ප්‍රමාණයක් එකම බස් රථයක ප්‍රවාහනය කිරීම හේතුවෙන් දිගු ගමන්වලදී පවා ඇතැම්විට වයස්ගත රැඳවියන්ටද අසුනක් හිමි නොවන බවට ඔවුහු කොමිසමට පැමිණිලි කළහ. කොළඹින් බැහැර ප්‍රදේශවල සිට අභියාචනා විභාග සඳහා රැගෙන ඒමේදී රැඳවියන්ට ආහාර පාන ලබා නොදෙන බවටත්, මාංචු දමා සිටියදීම පොලිතින් බෑග්වලට ශරීර කෘත්‍ය කිරීමට සිදුවන බවත් ඔවුහු තවදුරටත් චෝදනා කළහ. බන්ධනාගාර සතුව ඇති රථවාහන හා නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් මෙසේ සිරකරුවන් ප්‍රවාහනය කිරීමට තමන්ට සිදුවන බව බන්ධාගාර පරිපාලකයෝ කොමිසමට කරුණු දැක්වූහ.

මහේස්ත්‍රාත් අධිකරණයේදී මෙම රිමාන්ඩ් රැඳවියන් මහේස්ත්‍රාත් අධිකරණ සිරකුටි තුළ රඳවා තැබේ. එහිදී ඔවුනට දවස පුරා සිටගෙන සිටීමට සිදුවන අතර ඇතැම් විට දිවා ආහාර වේලක් ලැබුණද වැසිකිළි පහසුකම් නොලැබේ.

# VI කොටස : ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩතාවය

## 24. ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩතාවය

ප්‍රචණ්ඩත්වය යනු අපරාධ යුක්ති ක්‍රමවේදය තුළට කිඳා බස ගිය ලක්ෂණයක් වන බව කොමිසමට දැකගත හැකි විය. අත්අඩංගුවට ගැනුණු පුද්ගලයන් පොලිස් භාරයේදී, රිමාන්ද භාරයේදී හා සිරගතව සිටින අතරතුර ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම එහි පොදු අංගයකි. පොලිස් භාරයේදී වධ හිංසාවට ලක් කිරීම විමර්ශන ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත. රැඳවියන්ගෙන් සාක්ෂි, තොරතුරු හා පාපොච්චාරණ ලබාගැනීමට මෙසේ ප්‍රචණ්ඩත්වය භාවිත කෙරේ. බන්ධනාගාර තුළ සිදුකෙරෙන ප්‍රචණ්ඩ ක්‍රියාවලට ශාරීරික හා වාචික හිංසනයන් මෙන්ම රැඳවියන්ගේ පෞද්ගලික අභිමානය කෙරෙහි කිසිඳු තැකීමකින් තොරව සිදුකෙරෙන ආක්‍රමණික ශරීර සෝදිසිකිරීම් ද අයත් වේ. මෙවැනි ක්‍රියාවල යෙදෙන්නවුන් හට බොහෝවිට කිසිදු දඬුවමක් නොලැබෙන බැවින් මෙම ප්‍රචණ්ඩකාරී චක්‍රයේ බිඳීමක් හෝ නැවතීමක් කිසි දිනෙක සිදු නොවේ. මෙයට හේතුව ඔවුන් සිදුකළ අපරාධවල ස්වභාවය හේතුවෙන් රජය හා සමාජය තුළ සිරකරුවන් පිළිබඳව ගොඩනැගී ඇති අප්‍රසන්න හැඟීම විය හැකිය. ඔවුනට මුහුණ දීමට සිදුවන ප්‍රචණ්ඩත්වය පිළිබඳව සමාජය වෙතින් විරෝධයක් පැන නොනැගෙන්නේ එබැවිනි. බන්ධනාගාර තුළ සාමය පවත්වාගැනීමේ මූලික ක්‍රමවේදය ප්‍රචණ්ඩත්වය ලෙස සැලකෙන බැවින් රැඳවියන් යටත් කරගැනීමට හා ඕනෑම විරෝධය දැක්වීමකට දඬුවම් ලබා දීමට මෙන්ම සිය බලය තහවුරු කිරීම සඳහා බන්ධනාගාර නිලධාරීහු මෙසේ ක්‍රියාකරති. ප්‍රධාන වශයෙන් මෙසේ හිංසනයට බඳුන් වන්නේ බලාධිකාරයට එරෙහිව නැගී සිටිය නොහැකි එමෙන්ම ඔවුනට සිදුවන අසාධාරණයට එරෙහිව පොදු මතයක් ගොඩ නොනැගෙන පහළ සමාජ-ආර්ථික මට්ටමේ කණ්ඩායම්වලට එරෙහිව බව නිරීක්ෂණය කළ හැකිය.

සමස්ත බන්ධනාගාර පද්ධතියෙහි ම ප්‍රතිසංස්කරණය එහි මානසිකත්වය විපාකඵලය පිළිබඳ සාධකයෙන් වෙනස් ව පුනරුත්තාපනය හා විශෝධනය කෙරෙහි කේන්ද්‍රගත වීම හා දේශපාලනික ප්‍රවණතා මත සම්පත් බෙදාහැරීම මත රඳා පවතී. බන්ධනාගාර නිලධාරීන්ට ප්‍රචණ්ඩ නොවන ක්‍රම මගින් සිරකරුවන් පාලනය හා සාමය පවත්වාගැනීම මෙන්ම මානව හිමිකම් පිළිබඳ පුහුණුව ලබාදීම අත්‍යාවශ්‍ය වේ. ඒ හරහා විශෝධන සේවා/කාර්යයන් සම්පාදනය පිළිබඳ අවබෝධය හා හැකියාව ඔවුන් තුළ වර්ධනය කළ යුතුය.

# VII කොටස : බන්ධනාරෝධනයට විකල්ප

## 25. තීන්දු ලබාදීමේ පියවරේදී ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග

සිරගතකිරිම වෙනුවට වෙනත් පියවර කරා යොමුවීම දණ්ඩනීය ප්‍රවේශයෙන් විතැන් ව පුනරුත්තාපන හා ප්‍රතිසංස්ථාපනික ප්‍රතිපත්ති සම්පාදනයෙහි එක් පියවරකි. ඒ හරහා බන්ධනාගාර පද්ධතිය මුහුණ දෙන තදබදය හා ඒ සම්බන්ධ ගැටලුවලට ද පිළියම් යෙදිය හැකිය. ජාතික නෛතික ක්‍රමවේදය තුළ සිරගතකිරීමෙන් තොරව ගත හැකි පියවර ප්‍රධාන වැඩසටහන් තුනකින් සමන්විත වේ.

### 25.1 ප්‍රජාමය විශෝධනයන්

යම් වරදකට සිර දඬුවම් ලබාදීම අනිවාර්ය නොවන විට හෝ සිර දඬුවම වසර දෙකක් නොඉක්මවන විට බන්ධනාගාරගත කිරීමේ තීන්දුවක් වෙනුවට විශෝධන නියෝගයක් නිකුත් කළ හැකිය. එහිදී අධිකරණය විසින් වරදකරුට වඩාත් ගැළපෙන විශෝධන නියෝගයක් නිකුත් කරයි. මෙයට මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකදී නම් පුනරුත්තාපනයට යටත් කිරීම, ප්‍රජා සේවා හෝ අධීක්ෂණය වැනි කොන්දේසි අයත් වේ.

කෙසේවෙතත්, වර්තමානය වන විට අපරාධ යුක්ති ක්‍රමවේදය තුළ මෙම ප්‍රජාමය විශෝධනයන් දක්නට ලැබෙනුයේ ඉතාමත් අල්ප වශයෙන් වන අතර එය මෙම ක්‍රමයේ සාර්ථකත්වය අවප්‍රමාණ කරවයි. කොමිසමට දැනුම් දුන් පරිදි මෙයට එක හේතුවක් ලෙස නඩුව වහා අවසන් කිරීමේ මාර්ගයක් ලෙස සිර දඬුවම් නියම කිරීම සලකන අතර මෙම ක්‍රමවේදයට අවශ්‍ය වන නඩු විභාගය තව දුරටත් දික් ගැස්විය හැකි පුනර් තීන්දු වාර්තා ඉල්ලාසිටීමට විනිසුරුවරුන් දක්වන මැළිකම පෙන්වා දිය හැකිය. එමෙන්ම ප්‍රජාමය විශෝධනයන්හි අන්තර්ගතය පිළිබඳ අවබෝධයකින් තොරවීම හා පුනරුත්තාපනයට වඩා දඬුවම සිරකරුවන්ට ඔබින බවට වන මානසිකත්වය ආදිය ප්‍රජාමය විශෝධනයට එරෙහිව මතයක් ගොඩනැගීමට හේතු වී ඇත.

මේ වන විට ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව මුහුණ දෙන දැඩි මුදල් ප්‍රතිපාදන ගැටළු නිසා අනෙකුත් ආයතනවල පිහිට නොමැතිව ඔවුනට මත්ද්‍රව්‍ය පුනරුත්තාපන/ප්‍රතිකාර වැඩසටහන් හෝ වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැත. මෙසේ ප්‍රතිපාදන සීමාකිරීම නිසා මේ වන විට ප්‍රජාමය විශෝධන වැඩසටහන්වලට සහභාගිවන්නන් ඵලදායි ලෙස නියාමනය හා ඇගයීමට ද බාධා පවතී.

### 25.2 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් පුනරුත්තාපනය

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් හා මත්ද්‍රව්‍ය අලෙවි කරන්නන් අතර කිසිදු වෙන් කිරීමක් නොකෙරෙන බව කොමිසමට නිරීක්ෂණය විය. මින් දෙවැනි කොටස සිරගත කළ හැකි වුවද පළමු කොටසට අවශ්‍ය වන්නේ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමයි.

ජාතික අන්තරායකර ඖෂධ හා පාලන මණ්ඩලය යටතේ පාලනය වන ප්‍රතිකාර මධ්‍යස්ථානයන් හි පුනරුත්තාපනය වීම සඳහා වරදකරුවෙකු යොමු කිරීමට විනිසුරුවරයෙකුට බලය ඇත. මෙවන් ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවතින සෞඛ්‍ය කාර්ය මණ්ඩල හිඟය සිරගතකිරිම වෙනුවට මෙසේ පුනරුත්තාපනය සඳහා ලබාදෙන නියෝග සාර්ථක වීම කෙරෙහි අහිතකර ලෙස බලපායි. එම මධ්‍යස්ථානවල ම සේවය කරන වෛද්‍යවරුන් වෙනුවට වරින් වර එහි පැමිණ සේවය කරන වෛද්‍යවරුන් සිටීම එයට ප්‍රධාන හේතුවකි. එමෙන්ම මේ වෛද්‍යවරු අදාළ ඇබ්බැහිවූවන්ට දරාගත නොහැකි මිලකින් යුතු ඖෂධ වර්ග

නියම කිරීමද සිදුකරති. දැනට පවතින ප්‍රතිකාර මධ්‍යස්ථාන කිහිපය තුළ ඉල්ලුමට සරිලන සේවාවක් සැපයීමේ හැකියාව ද නොමැත.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර තීරණය කිරීම සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන කොපමණ මට්ටමකින් එසේ ඇබ්බැහි වී ඇතිද යන්න නිර්ණය කළ හැකි ප්‍රමිතිගත ප්‍රතිපත්තීන් ද දක්නට නොලැබේ. කන්දකාඩු මත්ද්‍රව්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත යොමු කළ හා මේ වන විට එහි යාමට නියමිතව වැලිකඩ බන්ධනාගාරයේ රැඳී සිටින පුද්ගලයෝ තමන්ව වෛද්‍යවරයකු විසින් කිසිදු පරීක්ෂාවකට ලක් නොකළ බවත් කන්දකාඩු හි පුනරුත්ථාපනයට යැවීමට පෙර ඇබ්බැහිවීමේ මට්ටම පරීක්ෂාව සඳහා වෛද්‍ය පරීක්ෂණ සිදු නොකළ බවත් කොමිසමට දන්වා සිටියහ. විනිසුරුවරයාගේ අත්තනෝමතික තීරණය මත ප්‍රතිකාර පිළිබඳ නියෝගය නිකුත් කෙරෙන බැවින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ඒකීය අධිකරණමය ප්‍රතිපත්තියක් නොමැති බව මනාව පැහැදිලි වේ.

## 25.3 පරිවාසය

ජාතික නෛතික ආකෘතිය තුළ පවතින තෙවන සිරගතකිරීමෙන් බැහැර ක්‍රමවේදය පරිවාසයයි. මෙය සාපේක්ෂව අවම සීමාවන් සහිත විකල්පය වන අතර එහිදී අදාළ පුද්ගලයා වෙනුවෙන් නියම කළ පරිවාස කොන්දේසිවලට යටත් ව සිය නිවසෙහි ම ඔහුට හෝ ඇයට ජීවත් වීමට අවසර ලැබේ.

පරිවාස නියම කිරීමේදී සපුරාලිය යුතු පූර්ව නිශ්චිත නිර්නායකයන් නොමැත. ඒ වෙනුවට වරදකරුගේ වරදෙහි ස්වභාවය, ලිංගිකත්වය හා තත්වය පිළිබඳව අගයමින් නඩුවකින් නඩුවකට වෙනස් වන අන්දමේ පියවර අනුගමනය කිරීමක් සිදුවේ. මේ හරහා සිරගතකිරීමකට සාපේක්ෂව අදාළ වරදකරුට පරිවාස නියෝග පැනවීම වඩා සුදුසු වේ ද යන්න තීරණය කෙරේ. මෙය සිරගත කිරීමට විකල්පයක් ලෙස භාවිත කළ හැකි අත්‍යාවශ්‍ය හා සංවර්ධනාත්මක ක්‍රමවේදයකි. එතුළින් බඳුගෙවන්නන් හා සමාජය දැරිය යුතු සිරගතකිරීමේ වියදම් අඩු කිරීම පිළිබඳව යෙදිය හැකි හොඳ පිළියමකි. එහෙත් මෙම විකල්පය පිළිබඳ පවතින දැනුම අල්ප ය. පරිවාස ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට නීතියෙන් බැඳී සිටින ළමා පරිවාස දෙපාර්තමේන්තුව වැඩිහිටියන් පරිවාසයෙහි යෙදවීම පිළිබඳව කටයුතු නොකරන අතර ඒ වෙනුවට ළමුන් හා සම්බන්ධ පරිවාස කටයුතු කෙරෙහි පමණක් අවධානය යොමු කරයි. ඒ අනුව වර්තමානයේදී වැඩිහිටි පරිවාසය පිළිබඳ කටයුතු භාරගෙන කළමනාකරණය කිරීම සඳහා වෙන් වූ කිසිදු ඒකකයක් දක්නට නොලැබේ.